# 2020 ජුනි මස 02වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රුස්වීම් වාර්තාව

**<u>සහභාගිත්වය</u>**

| | |
|---|---|
| ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා | ගරු සභාපති |
| කමල් වැල්ලගේ මැතිතුමා | ගරු උප සභාපති |
| ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.ඩබ්. ජගත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ග්‍රේෂන් කෙරම්ණියගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.පී ලක්ෂ්මි හේමන්තා මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| දිනයාදුර ධර්මදාස මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| නන්දන රාජපක්ෂ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.ඒ. සෝභිත රංජිත් මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මහගේ අතුල ප්‍රියන්ත මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඊ.ඉන්ද්‍රා අයිරාංගනි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ජී.ජී. ආර්. පේෂලා කුමාරි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එච්. ඉනෝකා ක්‍රිශාන්ති මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| රාහුල ලලිත වික්‍රම මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.එම්. නිලානි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ධනසේන මාදුවගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| එස්.එම්.සරත් චන්ද්‍ර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |

- **පන්සිල් සමාදන් විමෙන් අනතුරුව පෙ.ව.9.35 ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී**

**( 01 )** සභා රැස්වීම් වාර්තා සම්මත කිරීම

**01.01** 2020.05.05වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020.05.05 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

2020.05.05 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>**

එම වාර්තා මා ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, 104 පිටුවේ ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතාට එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක් කියන එක සංශෝධනය විය යුතුයි .

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එය ඔබතුමා කියන එකක් නෙමේ. ධනසේන මාදුවගේ මන්ත්‍රීතුමා කියන ප්‍රකාශයක්. එමනිසා එතුමා තමයි මෙය සංශෝධනය කළ යුත්තේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා කතා කරමින්</u>**

104 පිටුවේ තිබෙනවා නන්දන රාජපක්ෂ මන්ත්‍රීතුමාට එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක් තර්ජනය කළා කියන එක එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයෙක් ලෙස සංශෝධනය විය යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

79 පිටුවේ මා ප්‍රායෝගිකයි යන්න මා ප්‍රායෝගිකව ලෙස සංශෝධනය විය යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එය සංශෝධනය කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඇතුළත් කරන්න. වෙනත් සංශෝධන තිබෙනවා ද? සංශෝධන නැතිනම් 2020.05.05 පැවති මාසික සභා රැස්වීමේ වාර්තාව සම්මත ලෙස සලකනවා.

**තීරණය**

2020.05.05 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඉහත සංශෝධන සහිතව සභා සම්මත විය.

**( 02)** සභාපතිවරයා විසින් නිකුත් කරන විශේෂ නිවේදන ඇත

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අම්බලන්ගොඩ කොට්ඨාශයට යාබද කොට්ඨාශයක් වන බලපිටිය ප්‍රාදේශිය කොට්ඨාශයට අයත් රන්දොඹේ ග්‍රාම සේවක කොට්ඨාශය තුළ ඩෙංගු රෝගීන් 70ක් පමණ වාර්තා වී තිබෙනවා. එමනිසා අපි ඉක්මන් පියවරක් ලෙස පසුගිය සෙනසුරාදා දිනයේ හෙප්පුමුල්ල ග්‍රාම සේවා කොට්ඨාශයේ අපි පවිත්‍ර කිරිම් කළා. එතනින් බෝ වුණ එක රෝගියෙකු විතරක් මට වාර්තා වූ හැටියට තල්ගස්ගොඩ ප්‍රදේශයේ ජීවත් වෙනවා. මෙතන 70 ක් කියන්නේ අපේ යාබද ගම. ඒ යාබද ගමේ 70ක් සිටින විට ඒ රෝගීන් මේ පැත්තට බෝවීමේ ප්‍රවණතාවය වැඩියි. එමනිසා මේ ඩෙංගු රෝගීන් මර්ධනය කිරිම සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරලා ඒ තමන්ගේ ප්‍රදේශවල සියළුම වැසියන් දැනුවත් කරලා එය මර්ධනය කළ යුතුයි. අපි පසුගිය වසර වල අපි හොඳටම එම වැඩය කළා. මතක තබා ගත යුතුයි . පසුගිය වසරේ දකුණු පළාතේ ඩෙංගු මරණ සංඛ්‍යාව 10යි. කොරෝනා නිසා මරණ සංඛ්‍යාව අද වන විට 11කි. අපි කොරෝනා වලට කොච්චර බිය වෙලා තිබෙනවාද කියනවානම් ඇඳිරිනිතිය පනවා හැම දෙයම සිදු කර තිබෙනවා. ඩෙංගු වලට තිබෙන අවධානම මීට වඩා සැලකිලිමත් වන ලෙස සියළුම ගරු මන්ත්‍රිවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. සියළුම මහජනතාව දැනුවත් කරලා මෙය මැඩපැවැත්වීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා. පසුගිය වසරේ අම්බලන්ගොඩ නගර සභාව සාර්ථක වැඩ කටයුක්තක් සිදු කළා. ඊට කලින් වසරේ අම්බලන්ගොඩ ප්‍රදේශයට වසංගත තත්ත්වයක් ඇති වුණා. එමනිසා පසුගිය වසරේ අප ගනු ලැබූ පියවර නැවත වතාවක් ගැනීමට සිදු වෙලා තිබෙනවා. නමුත් ඒ සමඟම මා කිව යුතුයි මේ තිබෙන කොරෝනා ව්‍යසනය යටතේ නගර සභාවට ලැබෙන ආදායම එන්න එන්නම අඩු වී යනවා. එමනිසා අපි මේ සඳහා අපි අපේ වැඩ කටයුතු සිදු කරනු ලබන දිනපතා සේවය කරන දෛනික සේවයන්ගේ පැමිණීම මත. එම සේවාව ප්‍රමාණයකට අත්හිටුවන්න සිදු වුණා. ඒ අයට පඩි ගෙවන්න යම්කිසි ගැටළුවක් පැමිණියහොත් ඉදිරියට . දැනට ගැටළුවක් නැහැ. සාමාන්‍යයෙන් ඒ අයට දෛනික වැටුප් ගෙවීම සඳහා ලක්ෂ 15ක් වැය වනවා සෑම මාසයකම. ඒ අනුව මාත් , ලේකම්තුමියත් , ගණකාධිකාරිතුමියත් , මහජන සෞඛ්‍ය පරික්ෂකතුමාත් , සාකච්ඡා කර තින්දු කළා ඒ අය නැවත සේවයට බඳවා ගෙන මේ වැඩකොටස් වල යෙදවීමට. කොච්චර මුදල් අපහසුතාවයක් තිබුණත්. ගරු අණ්ඩුකාරතුමා ඉදිරියේදි පවා මා මෙය ඉදිරිපත් කළා.

මොකද අපේ තිබෙන මුදල් පුළුවන් තරම් ඉක්මනට එවන්න. නැතිනම් මේ සේවය කරගෙන යන්න අමාරු වෙනවා. අපි වෙනම පිරිසක් කාණු පවිත්‍රතාවය සඳහා යොදවා තිබ්බා. නමුත් ඒ කට්ටිය දිගින් දිගටම අපට මුදල් අඩුවෙන් වැටුණ නිසා මෙය මුළු රටේම මේ කොරෝනා නිසා ඇති වී තිබෙන තත්ත්වයක් . නමුත් අපිට මුදල් වලින් නැතිව කරන්න පුළුවන් කාර්ය භාර්යයක් තිබෙනවා. අපේ මහජනතාව දැනුවත් කිරීම . දැනටම අපිට අවවාදයක් කර තිබෙනවා . අපේ කුණු දමන ස්ථානය සුද්ද කරලා වසා දමන්න කියා. මීට වසර තුනකට උඩදි ඩෙංගු වර්ධනය විමක් පෙන්නුම් කරන විටදි එම ස්ථානයේ තමයි ඩෙංගු මදුරුවන් හම්බ වෙලා තිබුණේ. එමනිසා අපි එයටත් අද සිටම සුදානම් විය යුතුයි. එමනිසා එයටත් අද තමයි අනුමැතිය ලැබෙන්නේ. ඒ වගේම සෑම කොට්ඨාශයකම මහජනතාව සහභාගී කරවා ගෙන ශ්‍රමදාන වැඩපිළිවලක් මන්ත්‍රිවරු විසින් සිදු කරන්න. එම ඩෙංගු ව්‍යාප්ත වීමේ හැකියාව , ඉඩකඩ බොහොම වැඩියි. ඒ කියන්නේ විශේෂයෙන් රන්දොඹේ ආශ්‍රිතව තිබෙන හෙප්පුමුල්ල , පටබැඳිමුල්ල, කන්ද , ඒ වටෙන් ගියාම කළුවඩුමුල්ල , කෙරම්ණිය පින්නදූව . දැනට ඩෙංගු රෝගීන් මතුවන ස්ථානය චීන වැඩබිමෙන් තමයි හම්බවෙලා තිබෙන්නේ. චීන වැඩබිමේදි හම්බ විමේදි මේ චීන වැඩබිමේ ප්‍රධානියා අධිකරණයට ඉදිරිපත් කර රු.5000/=ක් දඩ ගසා තිබෙනවා. එතුමා භාෂාව පිළිබඳ ප්‍රශ්නයක් කියා. කියන දේවල් තේරුම් ගන්නේ නැහැ කියා ඒ පුද්ගලයා කියා තිබෙනවා දවස ගණනේ රු.5000/= ක් ගෙව්වාත් මා මෙය මේ විදියට කරගෙන යනවා කියා. නමුත් අපිට විශාල ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා. ගාලු දිස්ත්‍රික්කයේ දැනට ප්‍රශ්න තිබෙන තැන් දෙකයි. එකක් රන්දොඹේ චීන වැඩබිමේ හා හබරාදූවේ අරලිය හෝටලය සෑදීම යන තැන් දෙකයි. ඉතිං මෙහි අනතුරු ඇඟවීම සියළුම මන්ත්‍රිවරුන්ට හඟවා සෑම කොට්ඨාශයකම මහජනතාව දැනුවත් කරලා ඒ අය මේ තත්ත්වයෙන් මුදවා ගන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, හෙප්පුමුල්ලේ ඩෙංගු මර්ධන ව්‍යාපාරයේ සුද්ද කරන්න ගිහපු අවස්ථාවේදි යම් යම් කණ්ඩායම් පැමිණ ඒ අය සුද්ද කළා. ඒ අවස්ථාවේදි කැපුවෙළ සංඝරාජ පාරේ මෙහා පැත්ත කාණුව තමයි අපිට අයිති . අම්බලන්ගොඩට අයිති. පාරෙන් මෙහා පැත්තේ සංඝරාජ පන්සල ළඟ කාණුව ගොඩක් වැලි සහ කැළිකසළ වලින් පිරිලා තිබුණා. මා දන්නේත් නැහැ. සෞඛ්‍ය අංශයේ ඒ පිරිස ගිහින් ඒ පැත්තේ කාණුව සුද්ද කරන්න ගිහින් තිබෙනවා. මා උදැල්ලකුත් ඒ අයට ලැබෙන්න සලස්වා ඊට පසු මා අනිත් තැන් වලට ගියා. කනගාටුයි මේ අවස්ථාවේ අපේ සහෝදර මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා ගිහින් ඒ අවස්ථාවේ එම කරන කාර්ය නතර කර තිබෙනවා. ලේකම්තුමියත් ඒ අවස්ථාවේ ඉඳලා තිබෙනවා. ඕක කරන්න එපා කියා එතුමා කියා එය නතර කර තිබෙනවා. එය අපි සමාජ සේවයක් වශයෙන් කළේ. අල්ලපු ප්‍රදේශයේ ඩෙංගු පවතිනවා. ඒක නිසා තමයි එය කරනු ලැබුවේ. එතුමන්ලා කැමැත්තෙන්ම තමයි එය කරනු ලැබුවේ. මෙතුමා ගිහින් එය නතර කර තිබෙනවා. මෙය ඉතාමත් කනගාටුදායක තත්ත්වයක්. මා ගරු සරත් මන්ත්‍රිතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ වගේ දේවල් කරන්න එපා කියා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේ ප්‍රකාශය කරුණාකර ඉල්ලා අස්කර ගන්න. ලේකම්තුමිය සාක්ෂි දරනවා ඇති . මා කරන්න එපා කියන එක නෙමේ කිවුවේ. මා ලේකම්තුමියගෙන් ඇහුවා ඔබතුමිය දන්නවාද මේ ප්‍රදේශය අපිට අයිති නැති බව. එතුමිය අලුතින් පැමිණියේ. එවිට එතුමිය කිවුවා ගරු සභාපතිතුමාගේ නියෝගයට කිවුවා කරන්නේ. එතුමා කිවුවාලු මදුරුවා කොහේ විද්දත් විදිනවා. එමනිසා සුද්ද කරන්න කියා. එකතමයි වුණේ. මා කිවුවා අපේ ප්‍රදේශවල මෙච්චර මදුරුවන්

බෝවන ස්ථාන තිබේද්දි බලපිටිය කොට්ඨාශයේ එකක් සුද්ද කරන්න කියන එක ගැන මා පුදුම වෙනවා කියා. මා එච්චරයි කිවුවේ. ලේකම්තුමිය ඉන්නවා . එතුමිය සාක්ෂි දරනවා. සභාවේ බොරු කියන්නේ නැහැ. වගකීමෙන් කතා කරන්නේ. මා බලපිටියේ ප්‍රාදේශිය සභාවේ සභාපතිතුමාගෙන් ඇහුවා. ඔබතුමා අවසර දෙනවා ද කියා මෙය සුද්ද කරන්න. ප්‍රාදේශිය සභාවක් නගර සභාවකින් ඉල්ලිමක් කරන්න ඕනේ අනෝන්‍ය සුහදතාවයකින් එය සුද්ද කරන්න. ප්‍රාදේශිය සභාවේ එකඟතාවය නැතිව සුද්ද කරනවා බලපිටිය ප්‍රාදේශිය සභාවේ වැඩ. එය නිවැරදි කියා ද තර්ක කරන්නේ. එක වැරදියි. නමුත් මා නිහඬව ආවේ. මා මෙය කිසිම මන්ත්‍රිවරයෙකුට කියන්න ගියෙත් නැහැ. නමුත් මා නිහඬව සිටියේ අර ඔබතුමලා සාධාරණ කරන විදියට ඩෙංගු මදුරුවා කොහේ විද්දත් විදිනවා. අනිත් පැත්තෙන් දැන් එම කාර්ය ඉටු වෙලා අවසන්. හැබැයි අපේ ප්‍රදේශයේ ඊයේ කාණු ගොඩ දාපුවා තාම එහෙමම. එළිවෙනකම් කතා කළ හැකි මේ නගර සභාවේ තිබෙන අඩුපාඩු. අපේ නගර සභාවේ අඩුපාඩුකම් තියාගෙන ගිහින් අල්ලපු ඉඩමේ අපි බලහත්කාරයෙන් වැඩ කරනවා. එකද අනුමත කරන්න කියන්නේ ගරු මන්ත්‍රිවරයෙක් විදියට. එත් මා එපා කිවුවේ නැහැ. ලේකම්තුමිය නැගිටලා කියන්න. සාක්ෂි දරන්න මා එපා කිවුවා නම්. වැරදි දේවල් සභාවේ කතා කරන්න එපා. හරියට දැනගෙන කතා කරන්න මන්ත්‍රිතුමා. මිනිසුන්ට වැරදි දේවල්. මා එපා කිවුවේ නැහැ. මා ඇහුවා ලේකම්තුමියගෙන් ඔබ දන්නවාද ? ඔබ දැනුවත්ද කියා. ලේකම්තුමිය කිවුවා මා දන්නවා . ඒක නගර සභාවට අයිති නැහැ. නමුත් සභාපතිතුමා කිවුවා ඩෙංගු මදුරුවා විදින්නේ බල බල නෙමේ කියා. ඒක නිසා සුද්ද කරන්න කියා. එච්චරයි කතාව. එතනින් පසු වැඩ කළාද නැද්ද ලේකම්තුමිය. කරුණාකර දැනගෙන දෙයක් කතා කරන්න . සභාවට ඉදිරිපත් කරන්න. නිවැරදි තොරතුරු ඉදිරිපත් කරන්න. ඉතිං මේක තමයි නිවැරදි දේ. එය නවත්වනු ලැබූ හේතුව පැවසුවානේ ලේකම්තුමිය. ෂැලැබ් එක නිසා සුද්ද කරන්න බැරිකියා. හෙප්පුමුල්ලේ අපේ මායිම විතරක් සුද්ද කරන්න. අනිත් ඒවා සුද්ද කරන්න යන්න එපා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

පිළිතුරු දෙන්න යන්න එපා. අනිත් මන්ත්‍රිවරු ඕන නම් කතා කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මා හිතන්නේ මෙවන් ප්‍රශ්න ඇත්තටම කතා කළ යුතුත් නැහැ. ඩෙංගු උවදුර කියන්නේ මදුරුවා කොහේ හිටියත් විදින්න පුළුවන්. හැබැයි නිත්‍යානුකුල නොවෙන්න පුළුවන්. මෙය කණ්ඩායම් රැස්විමේදි කතා කරන්න ඕන. මේවා සභාවට එන්න අවශ්‍ය නැහැ. මෙය ඇත්තටම සුද්ද කිරිම වෙන්න ඕන දෙයක්. මෙය දැන් පටන් ගත්තේ 11.00ට දැන් මේ වගේ අනවශ්‍ය දේවල් ආවාම මේය කරගන්න බැරි වෙනවා. එමනිසා ලේකම්තුමිය මේ සභාව කියන්නේ උත්තරිතර සභාවක්. අම්බලන්ගොඩ නගරයේ ජනතාවගේ ප්‍රශ්න ගැටළු මීට වඩා කතා කරලා සාකච්ඡා මාර්ගයෙන් විසඳන්න ඕන තැනක්. එමනිසා මේ වගේ දේවල් වීමට ඉඩ සලස්වන එක වැරදියි. ඩෙංගු උවදුර ගැන කතා කරන්නේ. ඩෙංගු උවදුර දැන් ව්‍යාප්තවෙන එක වැඩිවෙලා තිබෙනවා. දැන් තල්ගස්ගොඩට ගිහින් තිබෙනවා. වැඩවීම නිසා වෙන්නැති.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

දැන් මෙහෙමයි. මගේ යුතුකමක් මා කිවුවේ. අවධානම පෙන්නුවා. ඔගොල්ලන් ජනතාව වෙනුවෙන් කටයුතු කරන්න.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

එක හොඳයි . දැන් මේ වගේ ප්‍රශ්නයක් ඇති නොවෙන්න කටයුතු කරන්න කියා ඉල්ලා සිටිනවා.

- ගරු සභාපතිතුමා පෙ.ව.11.10ට පමණ ගරු සභාවෙන් නික්ම ගිය අතර මූලාසනයට ගරු උප සභාපතිතුමා ගරු සභාවේ මූලාසනයට පැමිණියහ.

**( 03)** ලැබී ඇති පැමිණිලි , පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**03.01 2020 - පළමු භාගයේ අනුමත ද්‍රව්‍ය මිල ගණන් යන මැයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය විසින් එවා ඇති මිල ගණන් සාරාංශය සභාගත කරන ලදී.**

මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

2020 - පළමු භාගයේ අනුමත ද්‍රව්‍ය මිල ගණන් යන මැයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය විසින් එවා ඇති මිල ගණන් සභාගත කිරීම. උක්ත කරුණ සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අංක 03/07 මිල ගණන් හා 2020.04.22 දිනැති ලිපිය හා බැදේ. ඒ අනුව 2020 පළමු භාගය සඳහා දකුණු පළාත් ප්‍රධාන ලේකම් විසින් අනුමත කරන ලද ද්‍රව්‍ය මිල ගණන් සාරාංශය මේ සමඟ යොමු කරන අතර, මේ පිළිබඳව ඔබ ආයතනයේ තාක්ෂණ සේවා නිලධාරීන් දැනුවත් කරන ලෙස දන්වා ඇත. මේ පිටපතක් සියළුම මන්ත්‍රීවරුන්ට ලබා දෙන්න කටයුතු කරන්න.

**තීරණය -**

**2020 - පළමු භාගයේ අනුමත ද්‍රව්‍ය මිල ගණන්** යන මැයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය විසින් එවා ඇති මිල ගණන් සාරාංශය ගරු සභාවේ දැනගැනීම සඳහා මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

**03.02 නගර සභා කාර්යාලයේ උඩුමහලේ අලුත්වැඩියා කටයුතු සඳහා සිමෙන්ති බෑග් 10 ක් සහ දගරවානේ කම්බි 06 ක් ලබාදෙන ලෙස ඉල්ලා වැඩ ක්ෂේත්‍ර පරිපාලක විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

නගර සභා කාර්යාලයේ උඩුමහලේ අලුත් වැඩියා කටයුතු සඳහා සිමේන්ති බෑග් දහයක් සහ දඟර වානේ කම්බි 06ක් ලබා ගැනීම සඳහා වැඩ ක්ෂේත්‍ර පරිපාලක විසින් ඉල්ලා ඇති ලිපිය සභාගත කිරීම.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

නගර සභා කාර්යාලයේ උඩු මහලේ සංවර්ධන කටයුතු . දැන් අවුරුදු කියක් වෙනවාද මේය පටන් අරගෙන. එතකොට දැන් අපේ මේ කාලයට තව අවුරුදු එකහමාරක්වත් නැහැ. සිමෙන්ති කොට්ට 10ක් කම්බි 06ක් වගේ. අපි බලාපොරෝත්තු වෙන්නේ නැහැ මේ වගේ . මේ නිලධාරීන් ප්‍රධාන

පරිපාලන උදවිය. මොවුන්ගෙන් තමයි අපි වැඩ ගන්න ඕන. හදිස්සියේ වත් ඕක උඩ කඩාගෙන වැටුණාම එහෙම. දැන් ඉන්නේ උඩ. දැන් මේක හදන්න අපි කමිටු පත් කළා. නිලධාරින් එකතුවෙලා සාකච්ඡා කළා. තව වෙනතුරු මෙහි කොනක් පටක් නැත. කොටසක් අරක ඉල්ලනවා මේවා කරනවා. මෙය කොයි වේලාවේද අවසන් කරන්න පුළුවන් වෙන්නේ සිමෙන්ති කොට්ට 10ක් හරි දීලා. ඔබතුමා පොඩ්ඩක් අපිට කියන්න. මෙහෙම යන්න බැහැ. මොකද විශාල මුදලක් වියදම් කළා. මේ පරික්ෂණ එහෙම පවත්වන්න. අපේ ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා මෙයට සැහෙන මහන්සි වුණා. මේක මෙච්චර කාලයක් යන්නේ මොකද? මුදල් නැද්ද නගර සභාවේ එහෙම නැතිනම් ක්‍රියාත්මක කරන්න වෙනත් ගැටළු තිබෙනවාද? මේකට ඔබතුමන්ලා උනාන්දු වෙන්නේ නැද්ද? එම නිසා මෙය දැන් හරි ගැටළුවක් වෙලා තිබෙන්නේ. අතන ගියාම පහළ හරක් මඩුව වගේ. යන්න හිතෙන්නේ නැහැ. මනුස්සයකුට ඇවිත් වැඩක් කර ගන්න යන්න හිතෙන්නේ නැහැ. එක එක තැන්වල කතා වෙනවා. ගියාම මනුස්සයකුට සේවකයෙකුට මනසට සේවයක් කිරිමට හැකි වෙන්න ඕන. මා කියන්නේ මෙය බොරුවක් නෙමේ. ඇත්තනේ. වැඩ කරන්න බැහැනේ. යනකොට ඔලුව මක්ස්ඩන් වෙනවා. සේවකයන්ට මනසට හිතකාරි තත්ත්වයක් නැහැ. වැඩ කරන්න . ඒක නිසා මේක මෙහෙම වෙන්න බැහැ. මා අහන්නේ අපේ තාක්ෂණසේවා නිලධාරින් ඉන්නවා. මේකට පිළිතුරු දෙන්න. අපිට කරන්න පුළුවන්ද බැරිද කියා. වෙන තැනක් හරි අරගෙන මෙය යථාවත් කර හරිගස්සන්න. මොකද දැන් වියදම් කරන එක ප්‍රශ්නයක් නැහැ. අපි ඕන වේලාවක අනුමත කරනවා. මොකද මෙය මේ නගර සභාවේ ගොඩනැඟිල්ල හදන්නේ නැතිව අපි අනුන්ගේ ඒවා හදන්නේ කොහොමද? දැන් අවුරුදු ගානක් ගිහින්. දැන් අපි මෙතනට ඇවිත් අවුරුදු 1 ½ වෙනවා. මේක මෙහෙම වෙන්න බැහැ. මොකක්ද තිබෙන අඩුපාඩුව. මොකක්ද කරන්න බැරි. දැන් ඕකේ අපේ පහළ අපේ රංගන ශාලාව තිබුණා. දැන් ඒකේ ආදායම නැතිව ගිහින්. අපිත් පොඩි කාලේ සිට නාට්‍ය රඟපාපු සැහෙන ආදායමක් ලබපු තැනක්. එකත් නැහැ. සේවකයන්ට වැඩ කරන්න හැකියාවකුත් නැහැ. මොකද අපි දන්නවා ගොඩක් දුරට එතැන වැඩ කිරිමේ හැකියාව තිබෙන පසුබිමක් නෙමේ තිබෙන්නේ. එමනිසා අපි ඉල්ලා සිටිනවා මෙයට අපිට කාලය දෙන්න. ක්ෂණිකව ඕන කරන දේවල් අපි අනුමත කරනවා. මේක ඉවර කරගන්න ඕන. තාක්ෂණසේවා නිලධාරිගේන් අපි අහන්න කැමතියි මොකක්ද තිබෙන ප්‍රශ්නය. අපිට උත්තරයක් දෙන්න . මෙය ඉවර වෙනවාද නැද්ද කියන එක. කොයි කාලයේද මෙය අවසන් වෙන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

මටත් අදහසක් තිබෙනවා. එතකොට මේ වගේ අවධානමක් තිබෙනවා. මෙය කඩන් වැටෙයි. කම්බි 6ක් 7ක් තිබෙන්නේ. එතකොට මේ සිමෙන්ති කොට්ට 10කින් මේ අවධානම ඉවත් කර ගන්න පුළුවන්ද ? අයේ කතා වුණා යටින් කොන්ක්‍රිට් ගිහින් මෙය ශක්තිමත් කරන්න. ලොකු ඉංජිනේරුවෝ ඇවිත් අපේ ගරු නගර සභා මන්ත්‍රී ධම්මික මහතා සමඟ සහභාගිවෙලා අපි ලොකු කතා වගයක් ගියා. නමුත් දැන් මේ කම්බි 6කුයි සිමේන්ති කොට්ට 10කුත් ගෙන කරන්න යන විජ්ජාව මොකක්ද කියා මට තෙරෙන්නේ නැහැ. එමනිසා මාත් බලාපොරෝත්තු වෙනවා තාක්ෂණ නිලධාරිතුමා මෙය අපිට පැහැදිලි කිරිමක් කරයි කියා

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>

.ගරු සභාපතිතුමනි, මේ කාර්යාලය ගැන හදන මේ ගොඩනැඟිල්ල ගැන කතා කරන කොට සැහෙන දිනක් මේ සභාවේ කතා කර තිබෙනවා. නමුත් මා මේ අවස්ථාවේ ගරු උප සභාපතිතුමාට චෝදනා කරනවා නෙමේ. ඔබතුමා මේ අවස්ථාවේ අභියෝගයක් භාර ගත්තා. ඔබතුමා භාර ගත්තා. මා දන්නවා ඔබතුමා යම්කිසි කර්මාන්තයක් භාර ගත්තාම එය කරනවා කියා. නමුත් මොනවාහරි අවහිරතාවයක් මා දකිවනවා. ඔබතුමා කිවුවා සේවකයන් යොදවා මා මේ වැඩය කරනවා. ඒ වගේ කතා කරපු ඔබතුමා මේ වගේ නිහඬ වෙලා ඉන්නවා. කාර්මික නිලධාරි මහත්වරු වගේම ගරු උප සභාපතිතුමාගේත් වගකීමක් ඒ අභියෝගය භාර ගත්තා නම් ඒ දේ නොවෙන්න ගරු සභාවේ මන්ත්‍රිවරුන් දැනුවත් කරන්න ඕනේ. ඇත්තටම කියන්න අවශ්‍ය වෙන්නේ නැහැ. අපි ඔතනට ගියාම අපි දකිනවා. සෞඛ්‍ය අංශයේ ට්‍රැක්ටර් හොදනවා. සේවක සේවිකාවන් කෑම කන්නේ එතන සිට. ඒ වාහන හොදන විට එතන තිබෙන තත්ත්වය කියන්න ඕන වෙන්නේ නැහැ. මොන වගේ තත්ත්වයක් ද කාර්යාලය තුළ තිබෙන්නේ කියා. ඔබතුමාතේ ඒ සඳහා දායක වෙලා කැපවෙලා වැඩ කරනවා කියනවා. මේ කියපු විදියට වැඩය වෙයි කියා. දැන් හිතෙනවා අපි මෙතැන ඇවිත් හඩ තලලා දෙන දෙයක් කාලා දෙන දීමනාවක් ගෙන යන තත්ත්වයක් අද ඇතිවෙලා තිබෙන්නේ. එමනිසා මා ඔබතුමාට කියනවා. ඔබතුමා ඒ අභියෝගය භාර ගත්තේ. එමනිසා මේ ගරු මන්ත්‍රිවරු ඔබතුමා කෙරෙහි ලොකු විශ්වාසයක් තබා තිබෙනවා. ඔබතුමා කිවු විදියට ගොඩක් විශ්වාස කළා. එය හදන්න බැරිනම් කඩා ඉවත් කරලා වෙන එකක් හදන්න තිබුණා. අර කිවුවා වගේ කම්බි 6ක් සිමේන්ති කොට්ට 10ක් ගෙනත් කරනවාට වඩා අලුත් එකක් හදන්න තිබුණා. දැන්වත් එහෙම කෙරෙන්නේ නැතිනම් ඕක නවත්වන්න. මේ සම්බන්ධව ඔබතුමාගෙන් හා තාක්ෂණසේවා නිලධාරින්ගෙන් පිළිතුරක් බලාපොරෝත්තු වෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

මෙතනදි මා සම්බන්ධ වුවා මේ ක්‍රියාවලියට. මෙතනදි මේ කම්බි 6කින් හෝ සිමෙන්ති කොට්ට 10කින් කරන ක්‍රියාවලියක් නෙමේ. මේ ක්‍රියාවලිය දැන් මාස ගණනක් සිට කරගෙන ඇවිත් උඩ තට්ටුව දැන් යම්කිසි තත්ත්වයකට පැමිණී තිබෙනවා. ප්‍රමාදයට හේතුව වුණේ ගොඩනැඟලි තත්ත්ව පරික්ෂණ ආයතනයට අපි මෙය පරික්ෂා කිරිම සඳහා දි තිබුණා. මෙය පරික්ෂා කර බලා ඔවුන්ගේ කාර්මික නිලධාරි මහත්වරුන්ට වාර්තාවක් එන්න තිබුණා. ඒ අය පැමිණ කණු ආ යුතු තැන් තීරණය කළා. ඒ අය එම කණු එන්න ඕන තැන් ඇඳලා අපේ කාර්මික නිලධාරින්ට එවන්නම් කිවුවා. ඒ අනුව තමයි අපි මෙය ක්‍රියාත්මක කරන්න ඕනේ. එතකන් අපි නිකං හිටියේ නැහැ. උඩ තට්ටුව ටිකෙන් ටික හදාගෙන ගියා. ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ ඒ නිලධාරි මහත්වරුන්ගෙන් එම සැලැස්ම අපේ කාර්මික නිලධාරි මහත්වරුන්ට ලැබිමේ ප්‍රමාදයක් පැවතුණා. එය ලැබුණු පසු තමයි මේ අයට එම වැඩය පටන් ගන්න පුළුවන් වෙන්නේ. මට දැනගන්න ඕන කාර්මික නිලධාරි මහත්වරුන්ට මේ වනවිට එය ලැබි තිබෙනවාද නැද්ද කියන එක. තවමත් එම සැලැස්ම ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයෙන් ලැබි නැහැ. අපි නිතර නිතර මතක් කළා. පහළින් තමයි මේවා ඉදිකරනු ලබන්නේ. ශාලාවත් පාවිච්චි කරන්න පුළුවන් විදියට මැදින් තමයි මේ කණු එනවා. තාම ක්‍රමවේදයක් නැහැනේ. ඒ අය සැලැස්ම එවනවා කිවුවාට ආවේ නැහැ. එතනයි ප්‍රමාදය. නමුත් උඩ තට්ටුවේ වැඩ ටික ක්‍රමයෙන් ක්‍රමයෙන් අපි කරගෙන යනවා. කණු 4ක් හරි 6ක් හරි එනවා කිවුවා. අපි දැන් කාර්යාලයේ ව්‍යුහය කොහොමද සැදිය

යුත්තේ කියා වෙනම දි තිබෙන්නේ. මේ නිලධාරියා කොතනද සිටිය යුත්තේ කියා ඒ අදහසත් දිලි හරියට ඇඳලා ගෙන්න කියා. අපිට ඕන නම් ඊට පසු සභාවේ කතා කරන්න පුළුවන්. එතන ලොකුම ප්‍රමාදය සිදු වුයේ ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයෙන් ගෙන්වා ගැනීමට ප්‍රමාද විමත් ඒ අය පැමිණ බලා දින දෙකකින් වාර්තාව ලබා දෙන්නම් කිවුවා. නමුත් එය දෙන්න ප්‍රමාද වුණා. සැරින් සැරේ අපේ කාර්මික නිලධාරි මහත්වරුත් කතා කළා. මමත් කතා කළා. තවමත් අපට ගෙන්වා ගන්න බැරි වුණා. මා හිතනවා තව දින දෙක තුනකින් ගෙන්වා ගැනීමට හැකිවෙයි කියා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

දැන් මෙහෙමයි ධම්මික මන්ත්‍රීතුමා, මේ දුරකථනයෙන් කතා කරලා මෙය කරන්න බැහැ. කාගේ හරි පස්ස පාරේ හරි ගිහින් මෙය කර ගන්න. දැන් මෙය යන කාලය වැඩියි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

අපි වෙන ආයතනයකින් දිලා නොමිලේ මෙය කර ගන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

දින වකවානු ගත්තොත් එහෙම දැන් මාස අටකටත් වැඩියි. වාර්තාව අරගෙන මෙහේ ඇවිත් බලා. යම් ප්‍රශ්නයකදි එහි දෝෂාරෝපණය එනවානේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

කොහොමත් දෝෂාරෝපණය කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

දැන් මේ ඩෙංගු වසංගතය තිබෙනවා. දැන් අද බලන්න ඔතන කැලි දමා තිබෙනවා. නගර සභාවට විරුද්ධව නඩු දමන්න වෙනවා එහෙම වුණොත් එහෙම. අපි දෙන්න ඕන උපරිම කාලය දිලත් තිබෙන්නේ. මට ඕනේ මේහි විස්තරය දෙන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

වෙන ආයතනයක් කරන දෙයක් ගැන අපිට කාලයක් දෙන්න බැහැ. මොකද එගොල්ලන්ගෙන් අපිට බලෙන් ගන්න බැහැ.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ඒ අය කිවුවානේ දවස් දෙක තුනකින් දෙන්නම් කියා. එයට ඔගොල්ලන්ගේ උනන්දුව තමයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

අපි කී පාරක් කතා කළාද? තාක්ෂණසේවා නිලධාරි මහත්වරු කී පාරක් කතා කළාද? අපි තමයි එ අය සොයාගෙන මෙතනට ගෙනත් ඒවා කළේ. එහෙම කතා කරන්න එපා මන්ත්‍රීතුමා ඒක වැරදියි. උනාන්දුව නැහැයි කියන්න එපා. අපි පුද්ගලිකව කැපවෙලා මෙය කළේ. උනාන්දුව තිබුණට අපිට ඇඳලා එහෙම කරන්න බැහැනේ. අපිට ඕන විදියට කරන්න බැහැ. ඒක අසාධාරණ කතාවක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔයා කියනවානේ කරන්න බැහැ කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

කරන්න බැහැ කියන්නේ නැහැනේ. ඔයා ඇයි ඔච්චර අවේගයෙන් කතා කරන්නේ. බොරුවටනේ කැහැ ගන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මොකක්ද වෙන්නේ ඇතුළේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

එහෙනම් ඔබතුමා භාරගෙන මෙය කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ ගොඩනැඟිල්ල අත්‍යවශ්‍ය කාරණයක් වෙලා තිබෙනවා. මේ කොරෝනා ව්‍යාසනය නිසා මේ වගේ සභාවක් තියන්නත් බැහැ. නිත්‍යානුකූල තත්ත්වය අනුව. අතේ දුරින් ඉන්න කියනවා. මුඛ වාඩම් දාන්න කියනවා, අත් සෝදන්න කියනවා. නාගරික මන්ත්‍රීවරුන් වශයෙන් අපි අද එකත් කඩ කරලා තමයි මේ සභාව අද තියන්නේ. අවශ්‍ය ස්ථානයක් අපිට නැහැ. දැන් අපි පත්වෙලා අවුරුදු 2 ½ වෙනවා . මොනම හේතුවක් නිසාවත් අපිට බැරි වුණා සභාවක් හදා ගන්න. ඒ කියන්නේ සභාව තියන්න ගොඩනැඟිල්ලක් හදා ගන්න. අපි මොනවා කතා කළත් වැඩක් නැහැ. අපි මේ සඳහා අසමත්. මා මේ සභාව ගැන බොහොම කනගාටුවෙන් කතා කරනවා. දැන් මෙහෙමනේ අපි මේ සඳහා අසමත්. දැන් අපිට ඉන්න තැනක් හොයා ගන්න බැරිවුණානේ . ඒ නිසා අපි අසමත්. දැන් අපි තාම ඉන්නේ මේ ගොඩනැඟිල්ලෙනේ. මොන කතා කළත්. බලන්න මා අසමත් කියන එක. ඔබතුමලාට හැමදාම මේ සභාවේ කියනවා වැසිකිළිය සම්බන්ධව. ගොඩනැඟිලි හදන්නේ කොහොමද වැසිකිළිය හදා ගන්නේ නැතුව. තාම වැසිකිළියේ වතුරු ටික බස්සා ගන්න බැහැ. කාන්තාවේ ඉන්නවා මන්ත්‍රීවරියන්. වැසිකිළියට යන්න බැහැ. ඇත්තෙන්ම අපි හරිම කනගාටුයි මේ සම්බන්ධව. මා මෙතුමන්ලා කාටවත් වැරදි කියන්නේ නැහැ. ආයතනවල වාර්තා ප්‍රමාද වීම එක හරි. නමුත් ඒ වෙනුවට විකල්ප හරි තියෙන්න ඕන. ඒක හදනකම් හරි අපි දැන් මෙහි ඉන්නවා. කොරෝනා කටවත් නැහැ. කරුමෙට හරි හැදුනොත්. මේ කියන නිරෝධාන නිති නැහැ. රජයේ නතිනේ. නිරෝධාන ක්‍රමය අනුව ඉන්න. මීටරයක් දුරින්

ඉන්න. මුඛ වඩම් දාන්න. අපි කනගාටුවෙනවා. අපිට එහෙම අවස්ථාවක් නැහැ. ඉන්න ගොඩනැගිල්ලක් නැහැ. ඒක හදනකම් එක්කෝ වෙන තැනකට යන්න ඕන. නැතිනම් මෙය හදන්න ඕනේ. මා කියන්නේ එකයි. මා මේ සභාවට බනිනවා නෙමේ. අපි ඔගොල්ලන් සහෝදර මන්ත්‍රීවරු. අපි හැම වේලාවෙම් ගමේ අය ගැන කතා වෙනවා. නගරයේ අය ගැන කතා වෙනවා. අපි ගැනත් කතා කරනවා මේ වෙච්ච දේ. මේ කාර්යාලයේ අය ඉන්නේ ඉතාමත් අපහසුතාවයෙන්. මෙය ඉක්මනට හැදෙන්න ඕන. දැන් මෙතුමයි මෙතුමයි අතර ප්‍රශ්න නෙමේ. මෙතුමත් කියන්නේ මෙය ඉක්මනට හදන්න කියා. කොයි කෙනාත් හදන්නේ මෙය ඉක්මනට හදන්න. නමුත් මා කියන්නේ අපි මෙයට ප්‍රමාද වැඩියි. ගරු සභාපතිතුමා හැම වේලාවෙම උත්සාහ ගන්නවා මෙය හදන්න. දැන් මෙය මෙහෙන් ගන්න බැරිනම් වෙන කොහොන් හරි අරගෙන මෙය කරන්න. අපි ඕන තරම් මුදල් වියදම් කරනවානේ. එහෙම හරි කරන්න කියා මා ඉල්ලීමක් කරනවා. මා ඔබතුමාලාගෙන් ඉල්ලීමක් කරන්නේ ඒක. එහෙම අපහසුතාවයෙන් තමයි කාර්යාලය පවත්වාගෙන යන්නේ. අපි පැමිණියාම අපිට වාඩිවෙන්න තැනක් නැහැ. සභාවට ගිහින් වාඩිවෙන්න තැනක් නැහැ. අපි ගිහින් ලිපිකාර මහත්මියගේ මෙසයෙන් වාඩි වෙනවා. එමනිසා ඉක්මනට මෙයට ප්‍රතිකර්මයක් යොදවන්න. එය හදා ගන්න ප්‍රමාද වෙනවා නම් සභාව වෙන තැනකට ගෙනියන්න ඕන. ඕන තරම් මුදල් යට කරනවා වෙන වෙන ඒවාට. ඒ වගේ අවස්ථාවක් හරි උදා කර ගන්න. එමනිසා මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඉක්මනින් මෙය හදන්න. නැතිනම් මෙය වෙන තැනකට ගෙනියන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මා ඉතාමත් සංතෝෂ වෙනවා. මොන පක්ෂයෙන් වුණත් ගරු රාහුල මන්ත්‍රීතුමා විරෝධතාවය දැක්වීම සම්බන්ධව. මොකද අපි 21නාගේම අයිතියක්. අපි 21 නාම මේ සම්බන්ධව වගකිව යුතු වෙනවා. ඊළඟට ධම්මික මන්ත්‍රීතුමාට චෝදනා කළාට එතුමා මේ සඳහා එතුමාගේ පුද්ගලික කාලය, ධනය, ශ්‍රමය මේ වෙනුවෙන් කැප කරලා තිබෙනවා. එතුමාගේ උත්සාහය ඒ. අපි අගය කරන්න තිබෙනවා. අඩුපාඩු තිබෙනවා. මට තෙරෙන දේ මා කිවුවේ සභාවට. මේ අප සියළු දෙනාගේම ගෙදර ගැන තමයි කතා කරන්නේ. මේ කිවුවා වගේ අපේ ගෙදර අපිට හදා ගන්න බැරිනම් අපි කොහොමද පිට දේවල් හදන්නේ. මේ සභාව තව අවුරුදු 20කින් මෙහෙම තියෙන්න ඕන. තව අවුරුදු 10කින් මෙහෙම තියෙන්න ඕන. ලබන සුමානේ කොහොමද මෙය කරන්නේ කියා. සැලැස්මක් තිබෙනවාද? ටෙන්ඩර් කරන්න. මේ රාජ්‍ය සේවය අනුව ටෙන්ඩර් කරන්න ඕනෑම දෙයකට මාස දෙක තුනක් යනවා. ඕනෑම දෙයක් අනුමත කර ගන්න. මේ එක ටෙන්ඩරයකට මේ මුළු ගොඩනැගිල්ලේම අවශ්‍ය ද්‍රව්‍ය එකවර ටෙන්ඩර් කර එක දවසින් ගන්න පුළුවන්. මේ මන්ත්‍රීවරු 21ම අනුමැතිය දෙනවා. ඇල්පෙනෙත්තේ සිට තින්ත ටින් එකේ සිට අනුමත කිරීමට මේ සභාව අනුමැතිය දෙනවා. මේ සභාවේ මේ කටයුත්ත කෙරෙන්නේ අද මේ සිමෙන්ති කොට්ට 10යි කම්බියි ගෙනත් අද මේ බිම් එක දානවා. ඊට පසු මතක් වෙනවා පොට් නැහැ. ඊට පසු පොට් ගෙන්නවා. ඊට පසු මතක් වෙනවා වයරින් එකේ මේ මේ අඩුපාඩු . කිසිම සැලැස්මක් නැහැ. කරුණාකර මා ඉල්ලා සිටිනවා මේ නිලධාරි මහත්වරුන්ගෙන් මෙයට අවශ්‍ය මාස දෙකක් ඇතුළත අවශ්‍ය දේ සකස් කරලා කරුණා කරලා මේ ටෙන්ඩර් එකට ඉදිරිපත් කරන්න. මෙහි පොළොවේ ටයිල් එකේ සිට මා දන්නේ නැහැ මෙය ටයිල් කරනවාද කියා එහෙම නැතිනම් සිමෙන්ති දමා නැතිනම් ටෙරාසෝ සිවිලිම ඔය තත්ත්වයෙන් කරනවා නම් එහි තින්ත

ආලේප කිරිමේ සිට සිවිලිම් පංකා දක්වා ද වායු සමීකරණය කරනවා නම් ඒ වායු සමීකරණ මැෂින් දක්වාම ඊළඟට ශ්‍රවනාගාර ඒ පහසුකම් මේ සියල්ල එක ටෙන්ඩරයකට එන්න තිබෙනවා. එකයි සැලසුම් සකස් කරනවා කියන්නේ. එකයි සැලසුම් අංශයේ කාර්ය භාර්ය. මෙහි බාධාවක් තිබෙනවා. ගරු සභාපතිතුමා අණ කරනවා මේක කරන්න මේක කරන්න. සියළුම නිලධාරින්ට. ඒවා සියල්ලම වුට්ටක් නතර කර අප සියළු දෙනාම එකතුවෙලා මේක ගොඩ ගන්න ඕන. මේක ගොඩ ගන්න නම් ඊළඟ ටෙන්ඩර් කමිටුවට මෙය ගොඩ නගන්න අවශ්‍ය දැ ටෙන්ඩර් කරන්න. මා එකඟ වෙනවා ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ වාර්තාව තව මාසයක් පරක්කු වෙනවා නම් . එහි තිබෙන්නේ පහළ තට්ටුව පිළිබඳව. එහි ඒ කණුටික හදන්න යන්නේ සිමෙන්තියි කම්බියි ප්ලාස්ටරුයි විතරයි මේ කණුටික හදන්න යන්නේ. ඔක්කොම දන්න කාරණාව. මේ කාරණා ටික කළමනාකරණ කමිටුව ලබන සුමානේ රැස්වෙන්න. කළමනාකරණ කමිටු තිබෙන්නේ එකට. කවදාවත් කතා කරලා නැහැ මේවා ගැන. නගර සභාවේ සංවර්ධනයක් ගැන කතා කරලා නැහැ. එදිනෙදි තිබෙන දේවල් ගැන කතා කරලා ඔබතුමලා යනවා. එහෙම නැතිනම් මෙය සභාවට දාන්න. නිලධාරින් වශයෙන් ඔගොල්ලන්ටත් අයිතියක් තිබෙනවා මෙය දමන්න. මේ වාර්තා. එක තමයි මේ සභාවේ කැ මොර දෙන්නේ. එක තමයි ආණ්ඩු පක්ෂයට මෙච්චර විරෝධතාවයක් එන්නේ. නිවැරදි නැහැ. ඒ විරෝධතාවය එන්න ඕනේ. මොකද අපි වැරදියි. අපි පිළිගන්නවා. කියන්න ඕනේ. ප්‍රමාදය අපේ. අඩුපාඩු අපට ඕන තරම් පෙන්වා දෙන්න පුළුවන්. හැබැයි වරද අපේ. අපි එක පිළිගන්නවා. අපි එක පිළිගන්නවා නම් අපි මාස දෙකක් ඇතුළත මේ නිවහන සකස් කරලා පාවිච්චියට දෙන්න ඕනේ. එය දෙන්න බැරි කමක් තිබෙනවා නම් එය මේ සභාවට අද ඉදිරිපත් කරන්න කරුණා කරලා මේ නිලධාරින්. වායුසමීකරණය කිරිමේ සිට පොළවට අල්ලන ටයිල් එකේ සිට අපහසුතාවයක් තිබෙනවා නම් දැන් ඉදිරිපත් කරන්න. කරුණාකරලා. එතකොට මේ ගරු මන්ත්‍රිවරු ඒ එකඟතාවය දෙයි. මෙතනදි අපි එකඟතාවය දෙනවා සියළුම දෙයට. අනුමැතිය දෙනවා. මන්ත්‍රිවරු 21ම. එහෙම තියෙද්දිත් ඇයි මේක වෙන්නේ නැත්තේ. මේ යන්ත්‍රණය වෙන්නේ නැත්තේ. අපි අතින් මුදල් ගෙවා කොච්චර කම්කරුවන්ට ගෙවනවාද? ඒ අය මොනවාද කරන්නේ. උඩ තට්ටුවේ වෙන දේවල් මා මෙතන කියන්නේ නැහැ. කම්කරුවන් අතින්. ඉතිං ඒවා වැඩක් නැහැ. කම්කරුවෝ කියන්නේ කම්කරුවෝ. යම් යම් අඩුපාඩු අපහසුතා වෙනවා. එවා අඩුකර කරුණාකරලා මෙය අවසන් කරන්න. ලේඛණාගාරය වේයෝ කාලා බිත්ති. මේ නගර සභාවේ තිබෙන සියළුම ලේඛණ විනාශ වෙමින් යන්නේ.මේ උඩ තට්ටුව හදන්නේ නැතිව යට තට්ටුව කරන්න බැහැ. එක්කෝ මේ ඔක්කොම වැඩ නතර කර එක කරන්න ඕන. කොහොමද මේ ලේඛණ බේරා ගන්නේ. ඕන කෙනෙක් ගිහින් බලන්න. ඇත්ත මේ කතා කරන්නේ. එකනිසා මේක යන්න බැහැ තව දුරටත්. මා මේ නගර සභාවේ ඉන්න 20 වසර . අපි වැඩ කරන හැටි දන්නවා. ලංකාවේම හොඳම නගර සභාව වුණා පිට පිට තුන් වතාවක් මේ නගර සභාව. මේක ගරු නගර සභාවක්. අද තිබෙන තත්ත්වය මොකක්ද ? බොහොම කනගාටුයි. එමනිසා මේ මාස දෙක තුන ඇතුළත වත් තමුන්නාසේලා මෙයට ක්‍රියාත්මක වෙන්න. තුන්වෙනි මාසයේ මා එතුමා සමඟ හිටගන්නවා . එකයි මේ සභාව දැනුවත් කරන්නේ. බැරි දේවල් කියන්න . ඕන වේලාවක අපි ඉන්නවා. අපි එනවා. කමිටුවේ මා නැතත් මා ඕනනම් ආයේත් කමිටුවට එන්නම්. අපි එනවා කියන්නේ ආයේ ගරු සභාපතිතුමා කිවුවත් අපි නවතින්නේ නැහැ. මේ සභාවේ බලය අපිට දෙන්න. අපිට මේ කමිටුවට කරුණාකරලා. ලේකම්තුමිය මතක තියා ගන්න මේ කමිටුවේ යම් දෙයක් කිවුවානම් එක අනුමතයි කියා. මා මේ කමිටුවට ඇතුළත් වෙනවා. මේ

මාස දෙක ඇතුළත මේක හදා ඉවර කරන්න . අපි තීරණය කරන්න. එකනේ වෙන්න ඕන. එතකොට තාක්ෂණසේවා නිලධාරි මහත්වරු මෙයට අවශ්‍ය ඇස්තමේන්තු හදා උළුකැටයේ සිට සියළුම දේවල් හදා අපට ඉදිරිපත් කරන්න. ටෙන්ඩර් කමිටුවට. ටෙන්ඩර් කමිටුවට අපි අනුමැතිය දෙන්නම්. මේක සරලව හිතන්න එපා. මේක මේ හැමදාම කතා කරන දෙයක්. අනිත් පැත්තට මේ මන්ත්‍රිවරු ඔගොල්ලන්ටයි මේ කැහැගහන්නේ. ඔගොල්ලන්ගේ නිවහනයි මේ. ඔගොල්ලන් අපහසුතාවයට පත් වෙමින් වැඩය කරන්නේ. එතකොට රාජකාරියක් කරන්න සේවකයෙකුට හොඳ පරිසරයක් තිබෙන්න ඕනේ. ඒ පරිසරය සම්පූර්ණයෙන් විනාශ වෙලා තියෙන්නේ. යට තට්ටුවේ මුඩුක්කුව වගේ. කරුණාකරලා මේ තත්ත්වය අවබෝධ කරගෙන මන්ත්‍රිවරුත්, නිලධාරිනුත් සියළු දෙනාම මෙයට සහභාගි වෙලා මෙය අවසන් කරන්න. මේ කමිටුවට මාගේ නම ඇතුළත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා. පුළුවන් දේ මා කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්**</u>

මේ රු.20000/= වගේ වැඩක් මේ වගේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරිම ගැන ඇත්තටම කනගාටු වෙනවා. මේ අපි බොහොම බැරෑරුම්ව සිතිය යුතු දෙයක් තමයි මේ නගර සභා ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරිම. එක අපේ ගරු උප සභාපතිතුමා, ගරු නගර සභා මන්ත්‍රි ධම්මික කොඩිකාර මහතා , ගරු විපක්ෂනායක ඩෙනට් පනියන්දුවගේ මහතා මෙය බොහොම කරට අරගෙන කරන්න ලැහැස්ති වුණා. එය බලා ධම්මික කොඩිකාර මහතා ඒ ටික කළා. එහෙම එකේ මේ කම්බි 6යි සිමෙන්ති බෑග් 10. හරියට මේ කියන විදියට අපට ප්‍රාග්ධනය නැහැ වගේ. කුලි වැඩ කරන මනුස්සයකු ගෙයක් හදන්නේ කොහොමද ? අන්න ඒ හා සමානව තමයි මෙය කරන්න යන්නේ. කුලි වැඩ කරන මනුස්සයා රු.100/= එකතු කරලා එකෙන් අද එක කම්බියයි. හෙට කම්බියයි ගෙන එක තමයි කරන්නනේ. මේ සම්බන්ධව අපේ තාක්ෂණසේවා නිලධාරි මහත්ම මහත්මින් දැන ගන්න ඕන. මේ බනිනවා නෙමේ. අපි විතරක් නෙමේ. අපි ඉදලා මෙහි යයි. ඔතන සිටින සේවක පිරිසට ඉන්න මනසික සුවයවත් නැතිවෙලා. මානිසික සුවය නැහැනේ . මිනිසුන්ටත් පාරිභෝගික ජනතාවටත් මානසික සුවය නැහැනේ. ඉතා අසිරුතාවයකට පත්වෙලා තිබෙනවා. අපි මේ සේවක මහත්ම මහත්වරුන්ට බනිනවා නෙමේ. මොකද අපි මෙතන යම් කාල සිමාවට ජනතාව එවනු ලැබු මහජන නියෝජිතයෝ. අපි අවුරුදු දෙක තුනකින් යනවා. එනවාද නැද්ද කියන තීරණය කරන්නේ ජනතාව. නමුත් මේක සැදිය යුතු දෙයක්. රාහුල මන්ත්‍රිතුමා පොඩ්ඩක් කලබල වුණා. ධම්මික මන්ත්‍රිතුමාට එහෙම කතා කරන්න එපා. එතුමා බොහොම මහන්සි වුණා. අපේ ගරු උප සභාපතිතුමා , විපක්ෂනායකතුමා බොහොම කැමැත්තෙන් ඉදිරිපත් වුණ එකක්. මොකද මට කරන්න බැරි දෙයක් කවුරුහරි කරනවා නම් මා එය අගය කරන්න ඕනේ. එමනිසා මා එම ප්රණාමය ධම්මික කොඩිකාර මන්ත්‍රිතුමාට , උප සභාපතිතුමාට , ඩෙනට් පනියන්දුවගේ මන්ත්‍රිතුමාට දෙනවා. හයවෙන්නේ නැහැ එම ප්‍රණාමය දෙන්න කිසිම දවසක. මොකද අපිට බැරි දෙයක් ඒ අය මැදිහත්වෙලා කරනවා. ඒ අය මැදිහත්වෙලා මෙය කරන්න ආරම්භයක් දුන්නේ . හැමදාම අර සමාගම නැහැ . මේ සමාගම නැහැ කියනවා. අපේ සභාවේ සිටින සේවක මහත්වරු මේකට උනාන්දුවක් නැතිනම් මේක කරන්න බැහැ. දැන් මෙතන කතා කරලා ගියාට හෙට වෙනකොට තව කම්බි 3යි සිමේන්ති කොට්ට 5යි. ඊට පසු ඊළඟ සභාවට දායි ට්‍රිප් ස්විච් 3යි පොටි ටිකයි. ඒ කියන්නේ මේ ප්‍රාග්ධනය නැහැ වගේ . මේ වගේ වැඩ කරන්න එපා. මා අපේ නිලධාරි මහත්ම මහත්වරුන්ට කියන්නේ. මේ වගේ තුන්වෙනි පන්තියේ වැඩ කරන්න

එපා. ඔබතුමන්ලා මෙය හරියට කරන්න. ඔබතුමන්ලා නිසි ලෙස ඉන්න ඕන එතැන. මේ ඉන්නේ අසවල් කෙනා. මේ ඉන්නේ ගණකාධිකාරිතුමිය , එහි ලස්සනට වෙන්කර ඒ අයට ඉන්න තිබෙන්න ඕනේ. මෙතැන මේ යට ගියාම කිසිම පිළිවලක් නැහැ. මනුස්සයකු ආවාම මෙතැන පිස්සන් කොටුවක් වගේ. මා ඔතනට එන්නෙම නැහැ. වෙනදා නම් ආවා. එක දැක්කාම අපටම දුකයි මේ මානසික තත්ත්වයේද ඉන්නේ කියා. අපේ සරත් මන්ත්‍රීතුමා කිවූ පරිදි මෙහි පොටි ගැමද තින්ත ගැමද මෙහි සම්පූර්ණ නිමාව සඳහා යන ඇස්තමේන්තුවක් සතියක් සති දෙකක් ඇතුළත දෙන්න කියන්න. මෙයට මහා කාලයක් යන්නේ නැහැ. මෙයට සම්පූර්ණ කාලය යොදවා ඇස්තමේන්තුවක් දෙන්න පුළුවන්. මොකද අපට ධාරිතාව තිබෙනවා. අපේ තාක්ෂණ නිලධාරින් , නිලධාරිණියන් ඉන්නවා. ඕක දවසක් දෙකක් තුනක් හතරක් යනවිට හදා ගන්න පුළුවන්. මහා කරියක් නෙමෙනේ තිබෙන්නේ. අලුත් ගොඩනැගිල්ලක් හදන්න ඇස්තමේන්තුවක් හදනවා නෙමේ. එමනිසා මේ වැඩය නිමකිරිමට සම්පූර්ණ ඇස්තමේන්තුවක් දෙන ලෙසට තාක්ෂණසේවා නිලධාරින්ට ඒ අදාළ නිලධාරින්ට මෙයට නියෝගයක් නිකුත් කරන්න. මුදල් සම්බන්ධව අනුමැතිය ලබාගෙන ඒ සම්බන්ධව කටයුතු කරන්න. අපි එයට එන්නම්. කිසි ගැටළුවක් නැහැ. සති දෙකෙන් හරි සභාවක් කැඳවන්න. එමනිසා ඇස්තමේන්තුව සතියක් ඇතුළත එවන්න කියන්න. එමනිසා මා යෝජනා කරනවා ඇස්තමේන්තුව සතියක් ඇතුළත ලබා දෙන්න කියා. උපරිමය දෙකයි. මේ පිට වැඩ කර කර ඉඳගෙන හරියන්නේ නැහැ. අපේ වැඩය කරන්න ඕනේ. අපේ වැඩය නොකර කිසිම දෙයක් කරන්න බැහැනේ. එමනිසා ඔබතුමා මෙයට දැඩිව මැදිහත්වෙන ලෙස කියා සිටිනවා. අපේ උප සභාපතිතුමා මෙයට මැදිහත් වුණා. ගරු සභාව අපි නැවතත් කැඳවෙන්න කැමතියි. අපි එයට අනුමැතිය දෙනවා. සම්පූර්ණ වැඩ නිම කිරිමට. එතකොට මෙය විහුලුවක් වෙන්නේ නැහැ. අන්තිමට වෙන්නේ මෙහි අපේ මන්ත්‍රීවරු හිත් නරක් කර ගන්නවා. හිතන්නේ අපේ මන්ත්‍රීවරු කර ගන්නේ නැහැ කියානේ මේ කතාව ගියේ. නමුත් මෙතැන යන්නේ නිලධාරින්ගේ ප්‍රශ්නයක්. ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළානම් මේ ප්‍රශ්නය අවසන්. මේ මොන කතාද අර අයිරාංගනී මන්ත්‍රීතුමිය කතා කලා වගේ අර යන්න තිබෙන වැසිකිළිය හදාගන්න බැරි අපිනේ. තව මොකක්ද ?

<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

දැන් මෙතුමයත් කතා කළා. මෙය මාධ්‍යයේවත් ගියොත් එහෙම දැන් වැසිකිළිය ගැන කතා කරනවා . මාස ගණක්. මේක හාදා තිබුණේ වැසිකිළි පොච්චියක් තියන්න. පසුව එකට තමයි මෙය සවිකර තිබෙන්නේ. එතකොට ඔබතුමිලාගේ ඉල්ලිම පරිදි තමයි මෙයට කොමඩ් එකක් සවි කරනු ලබන්නේ. ප්‍රායෝගිකව තේරුම් ගන්න. අපේ පාලන කාලයේ නෙමේ මේක හැදුවේ. එතකොට ඔබතුමිලාගේ ඉල්ලිම පරිදි තමයි මෙයට කොමඩ් එකක් සවි කරනු ලැබුවේ. අපි මෙය සවි කලාට අර වතුර බැස්ම එහෙම තිබෙනවා. එතකොට මේක කඩන්න මා හිතන්නේ නැහැ අර නිලධාරින්ටත් පුළුවන් කියා. මා හිතන්නේ නැහැ කාටවත් පුළුවන් කියා. මෙය සාදා අවුරුද්දක් වෙන්නේ. එතකොට මෙයට අපි සභාවේ යෝජනාවක් ගෙනවිත් විශේෂ අනුමැතියක් පළාත් පාලන කොමසාරිස්තුමාගේ ගෙනවිත් ඕන මෙය කඩන්න . ඔබතුමියට මා කලිනුත් මෙය පැහැදිලි කළා. මන්ත්‍රීතුමිය මෙය මෙහෙමයි වෙන්න ඕන කියා. දැන් අපි මෙහෙම දිගින් දිගටම කතා කරන කොට වැසිකිළියක් අල්ලා ගෙන හරිම කනගාටුයි. මෙය කඩා ඉවත් කරන්න බැහැ .

ගැටළුවක් තිබෙනවා. වතුර බස්සන්න ක්‍රමයක් නැහැ. කඩන්නේ නැතුව. පොළව කඩන්නේ නැතුව වතුර බස්සන්න විදියක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මේ ගෙවීම් කරන්න ඉස්සර වෙලා මා කිවුවා මෙය අත්සන් කරන්න බැහැ කියා. එතන වතුර රැදෙනවා. එක හදන්න පුළුවන්. එක නිකං සිමෙන්ති ටිකක් දමා මේවා කර තිබෙන්නේ කොමඩ් එක ළඟ. එකයි ප්‍රශ්නය තිබෙන්නේ. මා කිවුවාම මාගේ කතාව හසායට ලක් කළා මේ සභාවේදි. ඔය වැසිකිළියනේ . ඕක මොකක්ද කියා කිවුවා. එකේ ටයිල් කර අන්තිම කොටුවේ සිමෙන්ති ටිකක් දමා මේවා කර තිබෙනවා.

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මාගේ දීමනාවෙන් රු.1000/= ක් ලබා දෙනවා. සරත් මන්ත්‍රීතුමාත් රු.1000/=ක් දෙනවා කිවුවා. මේක දමා හදන්න. මේක නිලධාරින්ට දමන්න එපා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

අපි කරන්න ඕන දේ පොඩ්ඩක් අහන්න කියන්න. එතකොට අපිට කරන්න පුළුවන්. නැතිනම් එගොල්ලන්ට ඉහළින් යන්නත් බැහැනේ. සභාවේ අනුමැතිය දුන්නොත් ඒ අයට කරන්න බැරිද? අනුමැතිය ගත්තානම් හරි. මෙහි කාන්තාවෝ ඉන්නේ. නැතිනම් ඔය ප්‍රශ්නය ඉවරයි.

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මේක අල්ලා ගන්න පුළුවන්. අර එතුමා කිවුවේ රජයේ නිලධාරින් . මේ රාජ්‍ය සේවයේ මේ අය තව ඉදිරියට යන්න ඕනේ. නිකං කතා කර වැඩක් නැහැ. ප්‍රායෝගිකව එක තමයි තිබෙන ගැටළුව. එය කඩා හදනවා නම් පළාත් පාලන කොමසාරිස්තුමාගේ විශේෂ අනුමැතියක් අරගෙන කඩා හදන්න ඕන. නැතිනම් මන්ත්‍රීවරුන්ගේ අපේ දිමනාවක් හරි දමා මෙය හදන්න. මේක දිගින් දිගටම කතා කරන්න එපා කියන ඉල්ලිම මා කරනවා. අයිරාංගනී මන්ත්‍රීතුමිය මේ හැම සභාවකම මේක කතා කරනවා. මේක නවත්වන්න. මා පිළිගන්නවා ඔබතුමියලා කියන කතාව. අඟලක විතර වතුර තිබෙනවා. ගොඩනැඟිල්ල ගැන අපි පත්වෙන කොට මේ ගොඩනැඟිල්ල කඩා ඉවත් කරන්න තමයි තින්දුව ඇවිත් තිබුණේ. සම්පූර්ණ මේ ගොඩනැඟිල්ල කඩා ඉවත් කරන්න. හැබැයි අපි පත්වෙලා පළවෙනි මාසයේ හරි දෙවැනි මාසයේ අපි තින්දුවක් ගත්තා ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ වාර්තාවක් ලබා ගන්න. එම වාර්තාව අනුව ඒ අය කියා තිබුණා මෙන්න මේ විදියට කළොත් මේ ගොඩනැඟිල්ල පාවිච්චි කරන්න පුළුවන් කියා. ඒ අනුව අපි උපදෙස් ගත්තා පළාත් පාලන ඉංජිනේරුතුමා හරහා. පළාත් පාලන ඉංජිනේරුතුමා පවා මෙතනට ගෙන්නුවා. අන්තිම තින්දුව වුණේ මේය ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ තින්දුවක් නිසා මෙය ඒ අයගේම වාර්තාවක් ගන්න කියා. ඒ හරහා තමයි ධම්මික මන්ත්‍රීතුමා මඟින් සමාගමක් ගෙන්වා ගෙන මෙයට කරන්න ඕන පිළියම් ටික යන්නේ. මේ වෙනකොටත් ඇවිත් නැහැ. මේ කවුරුත් දැන ගත යුතුයි. මේ කඩා ඉවත් කරන්න කිවු ගොඩනැඟිල්ලට අපි සභාවෙන්නේ ගත්තේ

මෙය හදන්න කියා. සභාවෙන් තමයි ගත්තේ මේ උඩුමහල හදන්න කියා. එම වාර්තාව අනුව තමයි. නමුත් කලින් මේ ගොඩනැඟිල්ල කඩා ඉවත් කරන්න කියා තිබුණේ. ඊට පසු පරික්ෂා කර බලා වාර්තාවක් දී තිබුණා . මෙන්න මේ විදියට ගියොත් මේ ගොඩනැඟිල්ල පාවිච්චි කරන්න පුළුවන් කියා. ඒ අය සමාගම් වගයක් දී තිබුණා. ඒ වනවිට ඒ සමාගමක් තමයි මේ ධම්මික මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබුණේ. ඒ අය දෙන උපදෙස් අනුව තමයි අපිට යට තට්ටුවට යන්න වෙන්නේ. මේ යට තට්ටුවට දීපු ඇස්තමේන්තුවක් නෙමෙ ගරු මන්ත්‍රීතුමා. මේ ඉහළ මාලයට තමයි මේ ඉල්ලීම කර තිබෙන්නේ . කම්බි 06ක් හා සිමෙන්ති කොට්ට 10ක්. හැබැයි මාත් කනගාටු වෙනවා. මේ ඉල්ලීම කර තිබෙන්නේ 05වෙනි මාසයේ 14වෙනිදා. අද හයවෙනි මාසයේ 02දා. මෙය මා දන්නා විදියට නගර සභාවේ අණපණත් අනුව අත්‍යවශ්‍ය සේවාවක් නම් ටෙන්ඩර් කිරීමේ ක්‍රමයක් තිබෙනවා. මිළ ගණන් තුනක් ගෙන කරන්න ක්‍රමයක් තිබෙනවා. මේ පොඩි දෙයක්. එහෙම දෙයක් කරන්න මේ සභාවට දානකම් ඉන්නවා මෙච්චර කල්. සභාපතිතුමා සභා අනුමැතියට යටත්ව කියා දමා තිබෙනවා නම් මෙය කරන්න පුළුවන්. ඉතිං සභාපතිතුමා ඇයි දන්නේ නැහැ එහෙම ගැහුවේ. දැන් මේකේ වැඩය කරනවාද ? ඇයි මේ කම්බි ටිකයි සිමෙන්ති කොට්ට 10 අරගෙන දුන්නේ නැත්තේ. මා දන්න ටිකක් කියන්නේ . අර කාර්මික නිලධාරීන් දෙදෙනාට දොස් කියන්න එපා. එක්කෝ මෙතැන මේ වෙනත් තැන්වල මේ හිරවීම් තිබෙන්නේ. මා දන්න නිසා කියන්නේ . ඒ මිනිසුන් දෙදෙනාට දොස් කියන්න එපා. මොකද ඒ අයට වැඩ කිරීමේ සීමාවක් තිබෙනවා. දැන් මෙතැන ලක්ෂ්මි මන්ත්‍රීතුමිය කිව්වා දවස් පහකින් ඇස්තමේන්තු දෙන්න කියා. මේ නිලධාරීන්ට තාම ඇස්තමේන්තුවක් දීගන්න බැරුව ඉන්නේ. තාම ඇස්තමේන්තුවක් ආවේ නැති නිසා. ඒක තමයි මූලික ගැටළුව. සාධාරණ මේකක් තිබෙනවා. ඔබතුමා කියන එක අපි පිළිගන්නවා. මේ පොඩි දෙයක් දැන් මේ පැයකට වැඩියේ මේ සභාව කෑවා. මේ මේ ගන්න පුළුවන් දෙයක්නේ. මේ මන්ත්‍රීවරු එක එක්කෙනාට දොස් කියන්නේ. මේ සිමෙන්ති කොට්ට 510යි කම්බි 10 ලැබුණාද ? දැන් මෙහි තත්ත්වය මොකද ? මේ උඩුමහල කපරාදු කර පොට් ඇඳ තින්ත ගා කොච්චර කාලයකින් දෙන්න පුළුවන්ද ? මා මේ ඇත්ත කතාව කියන්නේ. මේ සභාව වැඩක් කරන්න ගත්තාම අනා ගන්නවා. හේතුව බස්නැවතුම්පොළේ අර තහඩු ගෙනවිත් දැන් අවුරුද්දකට වැඩියි. තාම දාන්න බැරි වුණා. මේ මන්ත්‍රීවරු කතා කරන එක සත්‍ය වැඩක්. ඒ අය කියන්නේ ඇත්ත. අපියි මිනිසුන්ට මුහුණ දෙන්න ඕන. ජනතාවට මුහුණ දෙන්න ඕන අපි. මන්ත්‍රීවරු ඇවිත් කිව්වාම. වහින කොට හැමදාම කතා කරනවා. අද දාන්න වගේ තමයි ගෙනාවේ. තහඩු ටික දිරා යනකම් අතන තිබෙනවා. මන්දන්නේ නැහැ ඇයි කියා මේ තීන්දු ගන්නේ නැත්තේ. ලබන සභාව වන විට මෙහි තත්ත්වය හැම මන්ත්‍රීවරයෙකුටම පිටපතක් සහිතව වාර්තාවක් ලබා දෙන්න. මෙන්න මේකයි තත්ත්වය. මෙන්න මේ අඩුපාඩු කරන්න තිබෙනවා කියා. එම වාර්තාව ලබා දීමට ලබන සභාවට කටයුතු කරන්න. එතකොට මන්ත්‍රීවරු දැන ගනීවි මේකේ තිබෙන්නේ මොනවාද කියා. මෙහි ගැටළු මොනවාද ? මෙන්න මේ තැන් ගැටළු තිබෙනවා. එමනිසා මෙන්න තත්ත්වයට මුහුණ පා තිබෙනවා කියා. හැම මන්ත්‍රීවරයෙකුටම වාර්තාවක් ලබා දෙන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

දැන් මට තිබෙන ගැටළුව. දැන් වයරින් එකෙත් පයිප්ප එල්ලි එල්ලි තිබෙනවා. දැන් ඔය වහල තෙමෙනකොට පොට් එහෙම ඇඳලා තේරුම මොකක්ද?

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

දැන් ලබන සභාවට වාර්තාව දෙන්නම් කිව්වා. දැන් ඔබතුමා වාඩිවෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

විහළුවකට කතා කරනවා නෙමේ. දැන් මේවා දමනකොට අවශ්‍ය කරන භාණ්ඩ තිබෙනවා නම් සරත් මන්ත්‍රීතුමා කිව්වා වගේ එකපාරට ලියා එවන්න. ඕක නගර සභාව කරනවා. එමනිසා මා ඕවා එකින් එක. ප්‍රායෝගික ගැටළු තිබෙන්න පුළුවන්. ප්‍රායෝගික ගැටළු තිබෙන්න පුළුවන්. අපි ඔය හිටියේ ඔය ඉර තිබේද්දි තමයි. ඕක කවුද දන්නේ නැහැ මේවා කළේ. නමුත් කඩාගෙන වැටුන්නේ නැහැ. දැන් ඕක කඩාගෙන වැටුණානම් මේ නිලධාරින් ඉවරටම ඉවරයිනේ. මේ නිලධාරින් යටතේ ඉන්නේ.

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා , දැන් මා මෙතෙක් කල් නොකියා හිටියේ. මා මෙහි දිස්ත්‍රික් ඉංජිනේරුතුමා ගෙන්නුවා මෙහි තත්ත්වය මොකක්ද බලන්න. හිටපු ලේකම්තුමියත් , අපේ තාක්ෂණසේවා නිලධාරිනුත් අපිත් ගියාම ඒ මහතා කිව්වේ මෙහි කිසිම අනතුරුදායක තත්ත්වයක් නැහැ කියා. අනතුරුදායක තත්ත්වයක් නැහැ කිව්වාට දකුණු පළාත් සභාවෙන් තමයි මෙය අබලන් තත්ත්වයේ තිබෙන බව කියා තිබෙන්නේ. එම ඉංජිනේරු මහතා යටතේ තමයි මේ නිලධාරින් දෙදෙනා සිටින්නේ. මා මේ කියන්නේ රාහුල මන්ත්‍රීතුමාට. එමනිසා පිළිගන්න. මේ නිලධාරින් දෙදෙනා සිටින්නේ ඒ ඉංජිනේරුතුමා හරහා. එම ඉංජිනේරුතුමා ගොඩනැගිල්ල කඩා ඉවත් කරන්න කියා කරන ලද නිර්දේශ කරන්න කියා ඒ යටතේ සිටින මේ නිලධාරි දෙදෙනාට බැහැ ඇස්තමේන්තු හදන්න. ධම්මික මන්ත්‍රීතුමා ඇත්ත කතන්දරය මේකයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මොනවා හරි ප්‍රශ්නයක් ගැටළුවක් ඇතිවුණොත් එහෙම මේ සභාවේ මන්ත්‍රීවරු සභාව වගකියන්නේ නැහැ. මොකද හේතුව පහළ තමයි මේ නිලධාරින් ස්ථාන ගත කර තිබෙන්නේ. ඊට වඩා භායනකයි මේ ගොඩනැගිල්ල කඩා ඉවත් කරන්න කියා තිබෙන නිසා තවත් මේවා එකක් තිබෙනවා. අපේ වගකීමකින් තොරව අපි මෙය ප්‍රකාශ කර තිබෙනවා. එමනිසා අපි වගකියන්නේ නැහැ කියන එකත් සටහන් කර තියා ගන්න. මොකද මෙය පරක්කු වෙන කොට අපටත් අවධානමක් තිබෙනවා. මෙහි වහළ හදන්නේ නැහැ. පොටි ඇඳලා. එක්කෝ වහල හදන්න එපැයි ඉස්සෙල්ලා. මොනවාහරි ක්‍රමවේදයකට යන්න ඕන ඉස්සර වෙලා. අපිට බැරි සභාවට මේ නිලධාරින් හරහා කරන්න . අධ්‍යනය කටයුතු කර ඒ තාක්ෂණසේවා විභාග සමත් වී පැමිණ තිබෙන්නේ ඕකට. මේ මොකක්වත් නොදන්න සාමන්‍ය මන්ත්‍රීවරු ටිකත් ඕක කියනවා නම් ඉතිං ඕක ගැන මොකක්ද කතන්දරය. ලේකම්තුමිය මේ වගකීම අනිවාර්යෙන් ලියා තියන්න. අපි කියන එක අනිවාර්යෙන් සටහන් කර තියා ගන්න. අපිට වගකීම් ගන්න බැහැ. අනිවාර්යෙන්ම කතා කර තිබෙනවා. සියළු මන්ත්‍රවරු ඒ ගැන සාකච්ඡා කර තිබෙනවා. ඔය ප්‍රධාන පුටුවල ඉන්න උදවියටත් කිව්වා. දැන් ඔබතුමා අද ඉන්නවා. ඔබතුමාත් මා දන්නේ නැහැ. එමනිසා සියළු වගකීම් ඔබ දෙපළ භාර ගන්න. අපිනම් භාර ගන්නේ නැහැ. අපි කියන්නේ මෙහි එහෙම අවධානම්

තත්ත්වයක් තිබුණා නම් එදාම වෙන එකක් ගහන්නත් තිබුණා. අවුරුද්දක් යනකොට. මෙය ඉදිවෙන එකනම් අපිට දැන් සිහිනයක් වගේ තියෙන්නේ. එමනිසා අපි සටහන් කර තියනවා අපිට ඔය වගකීම ගන්න බැහැ කියා.

<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

මීට කලින් ඔබතුමා මෙය හදන්න කියා අත ඔසවා තිබෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

හදන්න කියා නෙමේ. අපි කිවුවා මෙය කඩා ඉවත් කරන්න කියා. ඔය සභා වාර්තා වල තිබෙනවා. ඕනනම් මා ගෙනත් පෙන්වන්නම්. ඇඟ බේර ගන්න යන්න එපා. අපි ඇඟ බේර ගන්නේ නැහැ. අපි කියන්නේ අපි කියන දේවල් කරන්න කියා. සභාව ගත්ත තින්දු තීරණ කිසි දෙයක් මෙතැන ක්‍රියාත්මක වෙන්නේ නැහැ. හැබැයි ලේකම්තුමිය අපි හොඳින් මේ වැඩයට කටයුතු කරන්නේ. නැතිනම් ඊට එහාට මේවා කරන්න පුළුවන්. අපි කියන්නේ මේ සභාව හැල්ලුවට ලක් වෙලා තිබෙන්නේ. මන්ත්‍රිවරු ගන්නවා තින්දු . එකක්වත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. එක්කෝ නායකත්වයේ ඉන්න ඔබතුමන්ලා මේවා ක්‍රියාත්මක කරන්න ඕන. එහෙම නැතිනම් මේ මන්ත්‍රිවරු 09ක් සිටිනවා. මේ මන්ත්‍රිවරුන්ට කොට්ඨාශය කොට්ඨාශය භාර දෙන්න. හොයා බලා කරාවි.

<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ඔබතුමා දැන් වාඩිවෙන්න. දැන් කතා කලානේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

දැන් ඔබතුමාට කරන්න පුළුවන් මොකක්ද කියන එක කියන්න. තීරණය කියන්න.

<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

තින්දුවක් ගත්තේ ලබන සභාවට මෙහි අඩු පාඩු මෙය කරන්න පුළුවන්ද නැද්ද කියන එක ගැන වාර්තාවක් ලබන සභාවට ලබා දෙන ලෙස.

<u>ගරු නගර සභා මන්ත්‍රී අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මටත් පොඩ්ඩක් අදහස් ප්‍රකාශ කරන්න තිබෙනවා. දිර්ඝව කතා කරන්නේ නැහැ. අපේ ජේෂ්ඨ මන්ත්‍රිවරු මේ සම්බන්ධව කතා කළා. ඇත්තම කියනවා නම් මේ නගර සභාවේ මේ මන්ත්‍රිවරු හැල්ලුවට ලක් වෙලා තිබෙනවා මේ කතන්දරය නිසා. සමහරක් වේලාවට මන්ත්‍රිවරු අදහස් ප්‍රකාශ කරන විට ඒවා නවත්වන වේලාවල් තිබෙනවා. අපි නවක මන්ත්‍රිවරු විදියට අපිට වඩා දැනුවත් මන්ත්‍රිවරු ඉන්නවා මේ සභාවේ. මා ඇත්තටම සතුටු වෙනවා මේ මාතෘකාව සම්බන්ධව. මොකද මෙය බාලගිරි දෝෂය වගේ මෙය කවදා හැදෙයිද? එක වේලාවකට සිමෙන්ති කොට්ට ගන්නැයි කම්බි ගන්නැයි කියා යෝජනා එනවා. විශේෂයෙන් අපේ සරත් මන්ත්‍රිතුමා ගැන විශේෂයෙන් රාහුල මන්ත්‍රිතුමා ගැන . ඔබලා නියෝජනය කළා දැනට

අවුරුදු 15ක් 20ක් විතර මේ ගරු සභාව. අපිට මතකයි. එතකොට අපි අවුරුදු 25 26වයසේ තරුණ කොල්ලෝ. ගරු හිටපු සභාපති ජී.එම්.එස්. ද සිල්වා මැතිතුමා සභාපතිව සිටින වේලාවේ ලංකාවේ හොඳම නගර සභාව පිට පිට තුන්වතාවක් මේ නගර සභාව වුණා. මේ හැම දෙයක්ම අද අපිට හදා ගන්න පුළුවන්. අපි නවක මන්ත්‍රීවරුනේ. ජේෂ්ඨ මන්ත්‍රීවරු සිටිනවා අත්දැකීම් තිබෙන මේ සභාවේ. ඒ අත්දැකීම් තිබෙන මන්ත්‍රීවරු හඩ අවදි කරන්න ඕන. හඩ අවදි කරනකොට හඩ පාලනය කරන්න බැහැ කාටවත්. මොකද මා ඉන්නවා . මට ඕන විදියට එක්සත් ජාතික පක්ෂයේ තනියම මට මේ දේවල් කරන්න බැහැ. හරියට මේ නගරයට නගර සභාවක් විදියට ගිහිල්ලා මොකද අවුරුදු 5යි සිටින්නේ . අපි වැඩ කොටසක් කළා කියා අපිට සතුටක් තියෙන්න ඕන මන්ත්‍රීවරයෙක් විදියට. මා මේ විෂය ගැන වැඩියේ කතා කරන්නේ නැහැ. එමනිසා හොඳ කළමනාකාරිත්වයක් , හොඳ සැලැස්මක් , හොඳ දැක්මක් තියෙන්න ඕනේ මේ වැඩ කරන්න. මේ සරත් මන්ත්‍රීතුමා කිවු පරිදි කළමනාකරණ කමිටු සැලසුම් කමිටු තිබෙන්නේ මේවාටනේ. ටෙන්ඩර් කමිටු තිබෙන්නේ මේවාට. මේ එක එක වේලාවට ඇවිත් පොඩි පොඩි දේවල් වලට යෝජනා දමනවා. ප්‍රායෝගිකව ලොකු ගැටළුවක් මතුවෙලා තිබෙනවා. සාධාරණව හරියට මේවා ඉදිරියට කරගෙන යාමට හැකිවේවා කියා මා ප්‍රාර්ථනා කරනවා. විශේෂයෙන්ම මන්ත්‍රීවරුන්ට ස්තූතිවන්ත වෙනවා මේ අවස්ථාවේ හඩ අවදි කළාට.

<u>**මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

අපේ ධම්මික මන්ත්‍රීතුමා මෙහි තත්ත්වය කුමක්ද ? එතුමා කියපු කතාව ඇත්තනේ දැන්. මේ වාර්තාව කොච්චර කාලයකින් ලබා දෙන්න පුළුවන්ද ?

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

මා මෙයින් ඉවත් වෙන්න හැදුවේ. රාහුල මන්ත්‍රීතුමා මාගේ තනතුර භාර ගෙන එය කරයි.

<u>**මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

නැහැ . ඉවත් වෙන්න නෙමේ . අපි භාරගත්ත දේ කරන්න ඕන. සාධාරණ හේතු තිබෙනවා. මෙය දිගින් දිගටම යනවිට ඒ ගොල්ලන්ටත් තිබෙනවා. රාහුල මන්ත්‍රීතුමා වාඩිවෙන්න. ඔබතුමා නෙමේ . මෙයට මා දෙන්නම් විසඳුමක් . ධම්මික මන්ත්‍රීතුමා දැන් අපට පළාත් පාලන ඉංජිනේරුතුමා දුන්නානේ මේ අයගෙන් වාර්තාවක් ගෙන මෙය කරන්න කියා. දැන් එකේ තත්ත්වය කොහොමද? ඔයාට මෙය ඉක්මනට ගෙන්වා ගන්න බැරිද?

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

වාර්තාවත් හරි. දැන් ඒ ගොල්ලන් පැමිණ මේ විදියට කණු මේ විදියට ගැහුවාම හරි කියා ඒ දෙන්න පොරොන්දු වෙලා තිබුණා. ඒ අය තාක්ෂණ නිලධාරි මහතුන්ට එවන්නම් කිවුවා. මේ

වෙනකම් එවා නැහැ. මාත් කතා කළා. සැරින් සැරේ කතා කළා. අරයා හම්බවුණේ නැහැ. මෙයා හම්බ වුණේ නැහැ කියනවා. මා කතා කර බලා කියන්නම් .

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ඒ වාර්තාව අනුව පාළාත් පාලන ඉංජිනේරුතුමා කිවුවා එයට අනුමැතිය දෙනවා කියා. එම වාර්තා අනුව. දැන් මොකද ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් කරපු නිසානේ තිබෙන්නේ ප්‍රශ්නය. ඒ පළාත් පාලන ඉංජිනේරුතුමා වාර්තාව දුන්නාම මේ අයට වැඩ කරන්න කිසිම බාධාවක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මා එය කතා කර බලන්නම්

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මෙය අපිට ගිහින් කර ගෙන එන්න බැරිද? දැන් මේ නිලධාරින්ට උඩ ඇස්තමේන්තු කර ගන්න ඒ ගොල්ලන්ගේ අනුමැතියනේ ඕනේ. මෙතුමන්ලාට ඕන අනුමැතියනේ. පළාත් ඉංජිනේරුතුමාට සැලැස්ම අවශ්‍ය වෙන්නේ නැහැනේ. අනුමැතියනේ ඕනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

අනුමැතිය දෙන එක ප්‍රශ්නයක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

තාක්ෂණ නිලධාරින්ට ප්‍රශ්නයක්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

අනුමැතිය නැති වුණාට ප්‍රශ්නයක් නැහැනේ.

ධම්මික මන්ත්‍රිතුමා කියන දේ හරි. නමුත් තාක්ෂණ නිලධාරින් කියන්නේ ඒ අයට ප්‍රශ්නයක් කියා. ඒ ගොල්ලන්ට මේ හදපු ටිකකටත් අනුමැතියක් නැහැ කියා. එමනිසා වැදගත්ම දේ සැලැස්ම නෙමේ. සැලැස්ම දෙයි ඒ අය. අපිට බරි ද ගිහින් අනුමැතිය අරගෙන එන්න. මේ සැලැස්ම අනතුරුදායක නැහැ. මේ සැලැස්මට අනුව මේ සඳහා අනුමැතිය දෙනවා කියා. එය ඒ විදියට දුන්නාම ඉවරයිනේ.

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ධම්මික මන්ත්‍රිතුමා අපිට සඳුදා ඒ දෙන්නා අරින්න පුළුවන් කොළඹ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික  මහතා කතා කරමින්</u>**

මේක මේ විදියට කළාම හරි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එගොල්ලන්ට පරිගණක සැලැස්මක් දාන්න පුළුවන්නේ. කලින් එකට අනුව අනුමැතිය දෙන්න. එතකොට එය ඉංජිනේරුතුමාට දුන්නාම ඒක අනුමත කරයි. ඉංජිනේරුතුමා අනුමත කළහොත් එහෙම අපිට පුළුවනි මේ කමිටුව රැස්වෙලා ටෙන්ඩර් කමිටුව දමා මෙය අවසන් කරන්න.

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එක ඔබතුමා ලැහැස්ති කරන්න. අපේ කාර්මික නිලධාරි මහත්වරු කාට හරි යන්න පුළුවන් නේද? ධම්මික මන්ත්‍රීතුමා එය කතා කර හදා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙතැන තාක්ෂණසේවා නිලධාරින් කියන ආකාරයට ප්‍රධාන ඉංජිනේරුතුමන්ගේ අවසරය නැතුව එතුමන්ලා මෙතැන වැඩ කරන්නේ භයෙනි. එතුමන්ලාට යම්කිසි දෙයකට වග කියන්න වෙයි කියා. එතුමන්ලා කියන කතාව හරි. එහෙම නම් පලමුව මෙයට අනුමැතිය අරගෙන ඉන්න ඕන.

**තීරණය -**

නගර සභා කාර්යාලයේ උඩුමහලේ අලුත්වැඩියා කටයුතු සඳහා සිමෙන්ති බෑග් 10 ක් සහ දගරවානේ කම්බි 06 ක් ලබාදෙන ලෙස ඉල්ලා වැඩ ක්ෂේත්‍ර පරිපාලක විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව එම ද්‍රව්‍ය ලබාදීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.03 2020 අප්‍රේල් මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව සභාගත කරන ලදී.**

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ 2020 අප්‍රේල් මාසයේ වාර්තාව. ආයතනය සායන පැවැත්වූ දින ගණන 08. ආයතනයට පැමිණි රෝගීන් සංඛ්‍යාව 273. රෝගීන් පැමිණීමේ දෛනික සාමාන්‍ය ගණන 34. මාසයක් සඳහා වැය වූ ඖෂධවල මුළු වටිනාකම රු.25114.74. එක් රෝගියෙකු සඳහා වැය වූ මුදල රු92/=. මෙය සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි මට දැන ගැනීමට දෙයක් තිබෙනවා. ඔය නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවට කටු චික්ස්තාව කරනවා කියා ද්‍රව්‍ය වගයක් මිලදී ගත්තා. එහි තත්ත්වය කොහොමද?

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එයට ඔබතුමියට මා ලබන සභාවට පිළිතුරු දෙන්නම්.

**තීරණය -**

2020 අප්‍රේල් මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ගරු සභාවේ දැනගැනිම පිණිස ඉදිරිපත් කරන ලදී.

**03.04 පියසේන ක්‍රීඩාංගනය වෙන්කර ගැනීම සඳහා නගර සභාවට ගෙවූ මුදල් නැවත ලබාදෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ, කළුවඩුමුල්ල පදිංචි එම්.ඩබ්.එම්.විශ්වජිත් මහතා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>**මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

පියසේන ක්‍රීඩාංගනය වෙන්කර ගැනීම සඳහා නගර සභාවට ගෙවූ රු.13000/= ක මුදල් නැවත ලබාදෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ, කළුවඩුමුල්ල පදිංචි එම්.ඩබ්.එම්.විශ්වජිත් මහතා විසින් එවා ඇති ලිපිය සභාගත කිරිම.

**තීරණය -**

පියසේන ක්‍රීඩාංගනය වෙන්කර ගැනීම සඳහා නගර සභාවට රු.13000/- ක මුදලක් ගෙවූ බවත් එම දිනට ක්‍රීඩාපිටිය අවශ්‍ය නොවන බැවින් නැවත එම මුදල් ලබාදෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ, කළුවඩුමුල්ල පදිංචි එම්.ඩබ්.එම්.විශ්වජිත් මහතා විසින් එවා ඇති ලිපිය අනුව රු.13000/- ක මුදල නැවත ගෙවීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.05 ලදුපත් අංක 4587 යටතේ ආදාහනාගාරය වෙන්කර ගැනීම සඳහා නගර සභාවට ගෙවූ මුදල් එම සේවාව ලබා නොගැනීම හේතුවෙන් නැවත ඉල්ලා කුලීගොඩ,සුරාජ් නිශාන්ත මහතා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>**මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ලදුපත් අංක 4587 යටතේ ආදාහනාගාරය වෙන්කර ගැනීම සඳහා නගර සභාවට ගෙවූ මුදල් එම සේවාව ලබා නොගැනීම හේතුවෙන් නැවත ඉල්ලා කුලීගොඩ, සුරාජ් නිශාන්ත මහතා විසින් එවා ඇති ලිපිය සභාගත කිරිම. මේ මරණය මේ අය භූමිදාන කර තිබෙන්නේ. මෙය ලේකම්තුමිය නිර්දේශ කර තිබෙනවා. එය ගරු සභාපතිතුමා විසින් අනුමත කර තිබෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

එය ලබා දෙන්න.

**තීරණය -**

ආදාහනාගාරය වෙන්කර ගැනීම සඳහා නගර සභාවට ලදුපත් අංක 4587 යටතේ රු.7500/- ක මුදලක් ගෙවූවද එම සේවාව ලබා නොගැනීම හේතුවෙන් ගෙවන ලද මුදල් ඉල්ලා කුලීගොඩ,

සුරාජ් නිශාන්ත මහතා විසින් එවා ඇති ලිපිය අනුව රු.7500/- ක මුදල නැවත ගෙවීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.06 රෝගී වූ සාමාජිකයෙකු හට මුදල් ආධාර ලබාදීමට අනුමැතිය ඉල්ලා පනියන්දූව ප්‍රජා මණ්ඩල කමිටුව විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

රෝගී වූ සාමාජිකයෙකු හට මුදල් ආධාර ඉල්ලා පනියන්දූව ප්‍රජා මූල මණ්ඩලය විසින් ඉල්ලීමක් කර තිබෙනවා. රොගු වූ සාමාජිකයෙකුට මුදල් ආධාර ලබා දීම. අප කමිටුවේ හිටපු ලේකම්වරයෙකු වන ගිම්සන් මානවඩු මහතා මේ වනවිට දරුණු පිළිකා රෝගී තත්ත්වයකින් පෙළෙන බැවින් හා ඔහුගේ භාර්යාවද මේ වනවිට අසනීප තත්ත්වයේ පසුවන බැවින් මේ අසිරු අවස්ථාවේ ඔහු හට උපකාරි කිරිමට අවශ්‍ය වන බැවින් ප්‍රජා කමිටු නිලධාරි මඩුල්ල මඟින් ඔවුන් හට රු.10000/= ක ආධාර මුදල් ලබා දීමට තීරණය කළ අතර මේ තත්ත්වය සලකා බලා ඒ සඳහා ඔබතුමාගේ අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. ප්‍රජා සංවර්ධන නිලධාරි විසින් කරන ලද ඉල්ලීම ප්‍රජා මණ්ඩල ව්‍යවස්ථාවේ අංක 04 ඇ යටතේ කටයුතු කිරිමේදි  කියා තිබෙනවා. ප්‍රජා මන්ඩලය නිර්දේශ කර තිබෙනවා. ගරු සභාපතිතුමා සභාවට යොමුකරන්න කියා තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් මෙහෙමයි. අපිට ගෙවීම් පිළිබඳ කිසිම ප්‍රශ්නයක් නැහැ. නමුත් පොදුවේ ගත්තාම ප්‍රජා මණ්ඩල කොට්ඨාශ 13 තිබෙනවා. එතකොට මේකට මේ  වගේ ක්‍රමවේදයක් හදා තිබෙනවා ද මේ වගේ ගෙවන්න. මොකද අනිත් කට්ටියත් ඉල්ලුවොත් එහෙම අපි ඒ ගැනත් සලකා බලන්න එපැයි. අන්න එහෙම නිත්‍යානුකූලව ගෙවන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා නම් එක දැන ගන්නයි ඕන. නැහැ මොනවා හරි ක්‍රමයක් ඇතිනේ. හැමෝටම බලපාන විදියට. එහෙම මානුෂික විදියට මිනිසුන්ට උදවු කරන්න පුළුවන් නම් ප්‍රශ්නයක් නැහැ. හැබැයි මේ කොට්ඨාශ 13ටම මෙය බලපැවැත්වෙන විදියට යන්න ඕන. නැතිනම් තව කෙනෙක් මෙහෙම ලිපියක් එව්වොත් එහෙම එය පූර්වාදර්ශයක් වෙනවානේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

එහෙම ඉල්ලීමක් කරන්න ඕන. නැතිනම් මේ අය වැරදි විදියට වටහා ගනීවි. මේ පනියන්දූවට විතරයි. දැන් අර නිලානි මන්ත්‍රීතුමිය කිවු විදියට අත්සන් කළේ පනියන්දූව ප්‍රජා මණ්ඩලය විතරයි. මනුස්සයකු මැරුණේ. දැන් මනුස්සයා මැරුණ එකට පනියන්දූවෙන් ඉල්ලන්න එපා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නයේදි මා මේ වේලාවේදිම යෝජනා කරනවා. මිට කලින් මේ ප්‍රජා මණ්ඩලය මඟින් කළා කොන්ත්‍රාත් එකක් මහ අම්බලන්ගොඩ. මානිමුල්ල ප්‍රදේශයේදි ජීවිතයක් නැති වුණා. ඒ අය ඉල්ලීම් කළ දැම්මා සභාවට. ඒ අයට ප්‍රජා මණ්ඩලයේ තිබෙන මුදලින් යම්කිසි මුදලක් ලබා දෙන්න කටයුතු කරන්න. මොකද ජීවිතය අහිමි වෙලා ඒ මියගිය අයගේ දියණිය ඇත්ත වශයෙන්ම උසස් පෙළ සමත්වෙලා විශ්ව විද්‍යාලයට තෙරිලා ආදායම් තත්ත්වය නිසා ඒ විය හියදම්වලටත් ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. එමනිසා මා මේ සභාවෙන් ඉල්ලා සිටිනවා. පනියන්දුව ප්‍රජා මුල සංවිධානයෙන් තමයි එම කොන්ත්‍රාත්තුව කළේ. එමනිසා මේ වගේ ගෙවීම් කරන්න පුළුවන් නම් අපේ ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය එකත් දැනුවත් කරන්න මේ මුදලක් යම්කිසි විදියකින් ඒ අයට දෙන්න පුළුවන් නම් දෙන්න. මෙකත් මානුෂිය ප්‍රශ්නයක්. ජීවිතයක් අහිමි වුවා කියන්නේ . ඒ අවස්ථාවේ අවමංගල සභාවට රු.1000/= වගේ දමා අපේ සභාවේ මන්ත්‍රිවරු විසින් තමයි යම්කිසි මුදලක් ලබා දුන්නේ. නමුත් මේ වගේ දෙයකින් එහෙම කරන්න පුළුවන් නම් මේ වෙලාවේ ඒ ජීවිත හානි විමට සභාවේ මුදල් දෙන්න බැරි තත්ත්වයක් තිබුණා. ඒ සභාවේ මුදල්. මේ වගේ ඒ ප්‍රජා මුල සංවිධාන මඟින් යම්කිසි මුදලක් ගෙවන්න පුළුවන් නම් ඒ වගේ උදවුවක් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මෙකේ සටහන් කරන්න ප්‍රජා සංවර්ධන නිලධාරිගේ නිර්දේශය පරිදි කියා. ඒ තිබෙන චක්‍රලේඛ ප්‍රකාරව ගෙවීම් කටයුතු අනුමත කළා කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ඒ අනුව තමයි රු.10000/= දෙනවා නම් දෙන්න පුළුවන්.

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

අනුමතයි.

**තීරණය -**

රෝගී වූ සාමාජිකයෙකු හට රු.10,000/- ක මුදල් ආධාර ලබාදීමට අනුමැතිය ඉල්ලා පනියන්දුව ප්‍රජා මණ්ඩල කමිටුව විසින් එවා ඇති ලිපිය අනුව චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රජා සංවර්ධන නිලධාරිණියගේ නිර්දේශය සමග එම මුදල ගෙවීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.07 පාසල් හා රජයේ ආයතන විවෘත කිරීමත් සමග අවශ්‍ය විෂබීජහරණ කටයුතු සිදුකිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා රථවාහන පහසුකම් ඉල්ලා මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

අපේ මහජන සෞඛ්‍ය පරික්ෂක මහතා විසින් ඉල්ලා තිබෙනවා. පාසල් හා රජයේ ආයතන විවෘත කරන විට විෂබීජහරණ කටයුතු සිදු කිරිම. බොයිලර් යන්ත්‍ර දෙකක් සහ විෂබීජහරණය කිරිමට අවශ්‍ය ආරක්ෂිත ඇඳුම්. එය ලබා දිමට සභාව අනුමැතිය දෙනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එය ලබා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මහජන සෞඛ්‍ය පරික්ෂක මහතා පොඩ්ඩක් ඉදිරිපත් කලානම් හරි. මොකද ගන්න ආයතනය හා ගන්න ඒවා ගැන. මොකද වැඩි කාලයක් ඔයාට නැහැ. මොකද පාසැල් අරින්න කලින් මේ විෂබීජ හරණ මේවා අවශ්‍යයි. අඩුම ගණනනේ සති දෙකක් ඇතුළත මේ උපකරණ එන්න ඕන. ලබන මාසය වෙනකම් එන්නේ නැහැ මේ විදියට ගියොතින්.

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එම දෙකට ඉල්ලිමක් කරලා ද තිබෙන්නේ. මිල ගණන් ඉදිරිපත් කර ඕනේ මෙය ලබා ගන්න. මොකද සභාවෙන් අනුමත කළොත් එපැයි මෙය ලබා ගන්න. අපි මෙය අනුමත කරනවා. මෙහි මිල ගණන් කැඳවන්න. විශේෂ ටෙන්ඩර් කමිටුවක් හරි යොදා. ඉතා ඉක්මනින් ලබා දීමට කටයුතු කරන්න.

**තීරණය -**

පාසල් හා රජයේ ආයතන විවෘත කිරීමත් සමග අවශ්‍ය විෂබීජහරණ කටයුතු සිදුකිරීම සඳහා මිස්ට් බොලොවර් යන්ත්‍ර 02 ක්, ආරක්ෂිත ඇඳුම් 30 ක් හා රථවාහන පහසුකම් ලබාදෙන ඉල්ලා මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවටත් , යන්ත්‍ර 02 සහ ආරක්ෂිත ඇඳුම් සඳහා මිල ගණන් කැඳවා **විශේෂ ටෙන්ඩර් කමිටුවකට** ඉදිරිපත් කරන ලෙසටත් මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.න්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

- **පෙ.ව.11.35 ට පමණ ගරු සභාපති එම්.ඩබ්. ඇරුණ ප්‍රදිප් මහතා සභාවට පැමිණියහ.**

**03.08 සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2020 යන මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමිය සංවර්ධන වැඩසටහන 2020. උක්ත කරුණ සම්බන්ධයෙන් අම්බලන්ගොඩ ප්‍රා දේශීය ලේකම් කොට්ඨාශය තුල ක්‍රියාත්මක කිරිම සඳහා සංවර්ධන ව්‍යාපෘති 101 ක් අනුමත වී ඇත.ඒ අතුරින් ඔබ පළාත් පාලන බල ප්‍රදේශ සීමාව තුල

ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත සංවර්ධන ව්‍යාපෘති ඇතුලත් ලේඛනය කාරුණික දැන ගැනීම ඉදිරිපත් කරයි. ඒ සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

| ග්‍රාම නිලධාරි වසම | ව්‍යාපෘතියේ නම | අනුමත මුදල |
|---|---|---|
| මහ අම්බලන්ගොඩ | මානිම්මුල්ල ආදර්ශ නිවාස වලට යන පාර නැවත තාර දමා සංවර්ධනය කිරීම | රු.500,000/= |
| මහ අම්බලන්ගොඩ | තුඩුවමුල්ල දෙල්දූව පාර ( ග්‍රාම නිලධාරි නිල නිවසේ සිට තොටුපළ දක්වා තාර දමා සංවර්ධනය කිරීම | රු.500,000/= |
| මහ අම්බලන්ගොඩ | විජේවික්‍රම අතුරු පාර සපත්තු කාණුවක් දමා සංවර්ධනය කිරිම | රු.500,000/= |
| මහ අම්බලන්ගොඩ | ධම්මකුසල විද්‍යාලය ඉදිරිපිටින් ඇති චන්ද්‍රිකා මහත්මියගේ නිවස අසළ ඇති පාර සහ කාණුව සංවර්ධනය කිරිම | රු.500,000/= |
| හිරේවත්ත | නම්බිමුල්ල හරස් පාරේ ඉතිරි කොටසේ කොන්ක්‍රිට් කිරිම හා කාණුව ඉදිකිරිම( මීටර් 80 පමණ ) | රු.500,000/= |
| හිරේවත්ත | හිරිකැටිය පාරේ පෝයසීමාව දෙපස කොන්ක්‍රිට් කිරිම | රු.500,000/= |
| හෙප්පුමුල්ල | ආර්.ඊ. ද සිල්වා මාවත තාර දමා ප්‍රතිසංස්කරණය කිරිම මීටර්900 පමණ) | රු.1,450,000/= |
| හෙප්පුමුල්ල | මේධානන්ද මාවතේ කපිල මහතාගේ නිවසේ සිට ගාලුපාර දක්වා කාණු පද්ධතිය සකස් කිරීම | රු.550,000/= |
| විලේගොඩ | අකුර අධ්‍යාපන ආයතනයට යන මාවත කොන්ක්‍රිට් කිරිම ( මීටර්50 පමණ) | රු.500,000/= |
| විලේගොඩ | ගෞරි මියගේ නිවස දක්වා මාර්ගය වටරවුම ද ඇතුළුව (එස්.ජී.ඒ.ද සිල්වා මාවතේ පළවන පටුමග අවසාන කොටස) ඉන්ටර්ලොක් ගල් අතුරා සංවර්ධනය කිරීම | රු.500,000/= |
| විලේගොඩ | හිරිගල්දූව මාර්ගයේ අවසාන කොටස කොන්ක්‍රිට් කිරීම (මීටර් 50 පමණ) | රු.500,000/= |
| පනියන්දූව | එඬේරමුල්ල මානාන පාර යා කර සංවර්ධනය කිරීම | රු.1,000,000/= |

| | | |
|---|---|---|
| පනියන්දුව | එඬේරමුල්ල මාර්ගයේ කාණු පද්ධතිය සකස් කිරීම | රු.1,000,000/= |
| පොල්වත්ත | නුගේතුඩුව 1වන පටුමඟ මර්සි මහතාගේ නිවස අසළසිට ජගත් විජේනායක මහතාගේ නිවස දක්වා මාර්ගය ඉන්ටර්ලොක් කිරිම | රු.500,000/= |
| පොල්වත්ත | නුගේතුඩුව පාරේ දයානන්ද මහතාගේ නිවස අසල සිට රන්ජන් මහතාගේ නිවස දක්වා මාර්ගයේ පස් පුරවා කොන්ක්‍රිට් කිරිම ( මී300පමණ ) | රු.700,000/= |
| පොල්වත්ත | බුද්ධදත්ත මාවත ගලප්පත්ති මහතාගේ නිවස අසල සිට වාස් ගුණවාර්ධන මහතාගේ නිවස දක්වා සපත්තු කාණුව සැකසිම හා ඊට යාබද දයාවතී මියගේ නිවස අසල සිට ඇළ ඇළ දක්වා කාණුව සැකසීම ( මී160පමණ ) | රු.800,000/= |
| කළුවඩුමුල්ල | මාර්ග සති පාර සංවර්ධනය කිරිම ( පැති බැම්ම සමඟ පිරිස් වෙද මාවත අරම්භයේ සිට පාර කොන්ක්‍රිට් යොදා සංවර්ධනය කිරිම ) – ( පාර මිටර්51 පමණ / පැතිබැම්ම මිටර්63 පමණ) | රු.200,000/= |
| කෙරමිණිය | පින්නදුව සුනාමි නිවාස පිහිටි මාර්ගය තාර දමා සංවර්ධනය කිරිම හා අවසාන කොටසේ කාණුව වෙල දක්වා සෑදීම (මිටර්75 පමණ) | රු.661,000/= |
| කෙරමිණිය | පොකුණ පාරේ ආරම්භක ස්ථානයේ සිට මිටර්150 පමණ දුරක් U කාණුවක් පිහිටුවීම | රු.700,000/= |
| කෙරමිණිය | පින්නදුව පටුමගේ 4වන අතුරු මාර්ගයේ (අඩි 30ත් පළල ඇති සැපයුම් විදුලි කණු පාර මැදින් අයිනට අයින් කර පැති කාණු ගොඩනැංවීම | රු.600,000/= |
| පෝරඹ | පෝරඹ මංසන්දියේ සිට සුගතබිම්බාරාම පාර අවසානය දක්වා පාර තාර දමා සංවර්ධනය කිරිම හා පන්සල ඉදිරිපස සිට අවසානය දක්වා කාණුව ද සමඟ (කාණුව මිටර්66/ පාර මිටර් 262) | රු.1,196,000/= |
| පෝරඹ | පන්සල අසල සිට තොටුපල ඇල දක්වා දකුණු පස කාණුව (නිවෙස් වලට යන ) ස්ලැබ් සමඟ සංවර්ධනය කිරිම (මිටර් 80 පමණ) | රු.500,000/= |
| තල්ගස්ගොඩ | නිව්යෝක් ගම්මානයට යන මාර්ගය පස් දමා බෝක්කුවද සමඟ සකස් කිරීම ( මිටර් 100 පමණ ) | රු.1,000,000/= |

තල්ගස්ගොඩ සුදුවැල්ල පාරේ බේකරිය පැත්තට වන පැති කාණු සකස් කිරීම ( මීටර් 100 පමණ ) රු.1,000,000/=

ඕකන්ද ඕකන්ද පුස්තකාලය අසල සිට විහාරගොඩ මාවතට සම්බන්ධ වන මාර්ගය දෙපස කාණු සකසා පාර ගල් අතුරා තාර දැමීම (මීටර්200 පමණ ) රු.2,000,000/=

**පානීය ජල සැපයුම් ව්‍යාපෘති යටතේ නැවත අනුමත කර තිබෙනවා.**

හිරේවත්ත හිරේවත්ත පුස්තකාලය අසල ළිඳ ප්‍රතිසංස්කරණය රු.500,000/=

**වෙනත් භෞතික යටතල පහසුකම් සංවර්ධනය කිරිම**

පටබැඳිමුල්ල ධිවර ප්‍රජාව සඳහා දැල් මැසීමේ ගොඩනැගිල්ල සෑදිම රු2,000,000/=

මෙහිදි මා ඉල්ලා සිටිනවා. දැන් මේ රු.2,000,000/= න් හිරේවත්ත ග්‍රාම නිලධාරි වසමේ මේ ගොඩනැහිල්ල අවසන් කරන්න බැහැ.ඒ සඳහා ඉතිරි මුදල සභාවෙන් දැරිම සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා. මා එය යෝජනා කරනවා. තවම ඇස්තමේන්තු කර නැහැ. මන්ත්‍රිතුමිය එය ස්ථිර කරන්න.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි , මා ඉල්ලා සිටිනවා අනිත් කොට්ඨාශ වලටත් ලබා දෙන්න කියා. මොකද

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

අනිත් කොට්ඨාශ වලට මදිවන සෑම මුදලක්ම අපි ලබා දෙන්නම්.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

දැන් ඔකේ තල්ගස්ගොඩ නිව්යෝර්ක් ගම්මානයට යන පාරේ බෝක්කුව ළඟ පස් දමන්න ඉල්ලා සිටියේ . බෝක්කුව දමන්න බැහැ ඔය ලක්ෂ 10න් පස් දමන්නැයි බෝක්කුව දමන්නයි. අපි ඉල්ලුවේ පස් දමන්න

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

එය මන්ත්‍රිතුමාට අවශ්‍ය විදියට කරන්න.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

මේ යෝජනාවේ තමයි වැරදියට තිබෙන්නේ. අපි යෝජනාව හරියට ඇරියා. තාක්ෂණසේවා නිලධාරි මහතා ඊයේ ගියා නේද බලන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සිලින්ඩර් දමන්න බැරිද?

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මාගේ දැනුමේ හැටියට මා තාක්ෂණසේවා නිලධාරි මහතාට යෝජනාවක් කළා. එතුමා කිවුවා එය නිවැරදි කියා. ඒ ආකාරයට කළ හොත් අපිට ලක්ෂ 15ක වගේ මුදලකින් කරගන්න පුළුවන් වෙයි කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අනිවාර්යෙන්ම මෙය කළ යුතු පාරක්. අපි සභාවෙන් මුදල් දෙන්නම්. එහි ඉතිරි මුදල අපෙන් ඇස්තමේන්තු කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, හොඳ වැඩසටහනකි. ග්‍රාමීය සංවර්ධන වැඩසටහනක්. මා හිතන්නේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය තමයි මෙය ක්‍රියාත්මක කරන්නේ. එතකොට අපේ මේ ප්‍රජා මූල හරහා හදන ලද යෝජනා සමඟ නේද මෙය යන්නේ. එතකොට මෙය හරියටම කර ගැනීමට නගර සභාවේ පූර්ණ දායකත්වයක් ලබා දෙන්න. මොකද දන්නවාද මෙය හරියට කරන්නේ නැහැ. මෙය කාටහරි කොන්ත්‍රාතුව දුන්නා කියන්නකෝ. මෙය නගර සභාවේ අධික්ෂණය හරි ඔබතුමා ගිහිල්ලා හරි බලන්න. බලා මෙය හරියට කර ගන්න. මොකද ආර්ථික සංවර්ධන නිලධාරි හරහා කරන්න ගියාම දැනුමකුත් නැහැ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙතැන කාර්මික නිලධාරින් ඉන්නවා. මට එක මහත්මයෙක් ඇවිත් කිවුවා. කොන්ත්‍රාත්කරුවෙක්. එහෙම වුණොත් මේ වැඩ නොකර යයි. සාමාන්‍යයෙන් අපි ඇස්තමේන්තු කරන්නේ වර්ග මිටරයට ලීටර් 2ක් නේද? මය ඒ මහතා කිවු විදියට මා බැලුවා ඇස්තමේන්තුව අනුව තාර බැරල් 4 ½ වගේ තමයි යන්නේ තාර දැම්මට. හැබැයි ඒ මනුස්සයා මට ඇවිත් කියනවා බලන්න කමල් මහත්තයා මට තාර බැරල් 7ක් ගැස්සුවා කියා. කාර්මික නිලධාරි විසින්. එහෙම වුණොත් කොන්ත්‍රාත්කරුවන් නැති වෙයි. අපි කියන්නේ නැහැ එහෙම අනවශ්‍ය විදියට කරන්න කියා. ඇස්තමේන්තුගත විදියට තාර වර්ග මිටරයට ලීටර් 2ක් ගහන්නේ . ඊට වැඩියේ එම ප්‍රමාණයට වැඩියේ ගහන්න ගියොත් වැඩ කරන කොන්ත්‍රාත්කරුවන් නැතිවෙයි. මා දන්න විදියට ඒ පුද්ගලයා කිවුවා මිට පස්සේ කරන්නේ නැහැ කියා. එමනිසා ගරු සභාපතිතුමා ප්‍රාදේශිය ලේකම්තුමිය මේ වැඩයට අත ගහන්නේත් නැතිනම් මෙය දිස්ත්‍රික් ලේකම්තුමාට කතා කරලා හරි මෙය කරන්න. ප්‍රමුතියට කළාට කිසි ගැටළුවක් නැහැ. ඒ පුද්ගලයාට තාර බැරල් 4 ½ ට තාර බැරල් 7ක් ගැහුවා කියන්නේ ඔහුට අතින් රු.50,000/= ක මුදලක් පාඩුයි කියා කිවුවා. මා දන්නේ නැහැ ඇත්තක්ද බොරුවක් ද කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි ලියන්න මෙම කාර්ය අම්බලන්ගොඩ නගර සභාවේ කාර්මික නිලධාරින්ගේ අනුමැතිය සහිතව අධික්ෂණය සහ මුදල් ගෙවීමේදි එම ලිපියේ නිර්දේශය වැදගත් කියා. ඒ වගේම මතක තියා ගන්න මේ සෑම එකම කොට්ඨාශයේ මන්ත්‍රිවරයා වග කියන්න ඕන. තමන්ගේ කොට්ඨාශය වෙනුවෙන් වැඩ කටයුතු කරන එම කොට්ඨාශය වෙනුවෙන් ජයග්‍රහනය කරන මන්ත්‍රාවරයා. ලැයිස්තුගත මන්ත්‍රිවරයාට පුළුවන් . කොට්ඨාශ මන්ත්‍රිවරයා තමන්ගේ කොට්ඨාශයේ තිබෙන වැඩකටයුතු වල අධික්ෂණය කරලා වගකිම දරන්න ඕනේ. නැතිනම් බැහැ කරන්න. එය දැනුවත් වෙන්න ඕන. එමනිසා මේ දැනුවත් කිරිම තමයි මේ අද කළේ. මේ යෝජනා සියල්ලම අරගෙන තිබෙන්නේ අපේ කොට්ඨාශ මන්ත්‍රිවරුන්ගෙන් සහ ඔබතුමන්ලා සියළු දෙනාගේම ජන සහභාගිත්වය තිබුණ සාකච්ඡා වලින්. ඉතිං දැනට මේ සභාවෙන් අනුමැතිය දෙන්න. දිලා ඒ වැඩකටයුතු හොඳින් අධික්ෂණය කරලා මේ කියන චෝදනා නිතරම අපේ සභාවලින් එන එකක්. එමනිසා චෝදනා නැති වෙන්න ඕන. මේ මුදල් සියල්ලම මේ රටේ ජනතාවගේ මුදල්. ඒ මුදල් නිසි විදියට ජනතාවට ලැබෙනන විදියට කරන්න. වැරදි විදියට කරන ඕනෑම වේලාවක ඒ මන්ත්‍රිවරුන් තමන්ගේ අදහස් නොබියව ඉදිරිපත් කර මේ සභාව තුළ කතා කරලා මේ සඳහා අනුගාමිව වෙන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මේ සඳහා ගරු මන්ත්‍රිවරු දැනුවත් වෙන වැඩපිළිවළක් සකස් කරන්න. දැන් ඕකන්දේ ගිහින් වැඩය පටන් අරගන්න ගිහින් තිබෙනවා. නමුත් මන්ත්‍රිවරු දන්නේ නැහැ. වැඩ පටන් ගන්න කොට අපි දැනුවත් වෙන්න ඕන.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේකත් ලියා යවන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඇස්තමේන්තු ගන්නකොට අපි දැනුවත් කළා. ඒවා සකස් කරන අවස්ථාවේ ආර්ථික සංවර්ධන නිලධාරිතුමියත් , ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේන් අපව දැනුවත් කරලා , ගරු නගර සභා මන්ත්‍රි ලක්ෂ්මි මෙනවිය දැනුවත් කරලා එතුමියට යන්න බැරි අවස්ථාවලදී මා ගිහින් ඒවාට සහායෝගය දුන්නා. ඒ වුණාට අපේ නිවසට පැමිණියා. ගරු නගර සභා මන්ත්‍රි ලක්ෂ්මි මන්ත්‍රිතුමියත් මුණ ගැසෙන්න ආවා. මහ අම්බලන්ගොඩ වැඩිහිටි සමිතියේ නිලධාරි මහත්වරු . ඒ අයට කොන්ත්‍රාත් එක දෙන්න මන්ත්‍රිවරුන්ගේ නිර්දේශ අරගෙන එන්න කිවුවා කියා. එතකොට ප්‍රාදේශිය ලේකම්ට කියන්න මේ වගේ වැඩ කරන්න කලින් මන්ත්‍රිවරු දැනුවත් කරන්න කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නැහැ. ඒ දැනුවත් කිරිම තමයි දැන් කරන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>**

දැන් මේවා කරන්නත් ගිහින්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ ලිපියේ පිටපතක් අපේ සියළුම මන්ත්‍රීවරුන්ට යවන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එතකොට අනිත් කොට්ඨාශ වල ඒවා මොනවාද? කරිත්තකන්දේ

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කරිත්තකන්දේ විතරයි ප්‍රජා ශාලාව කියන අර්ථය නිසා ප්‍රජා ශාලා මේ ව්‍යාපෘති යටතේ අනුමත කරන්නේ නැහැ කියන එක තමයි කියා තිබෙන්නේ. ඔබතුමාට ඉදිරිපත් කරන්න කිවුවා වෙනත් යෝජනා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ මගේ යෝජනාවක් නෙමේ. මුළු ගමේම යෝජනාවකි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එක ලියා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ඒක තමයි මේ අය ලිඛිතව ලියා දෙනවාද මෙය හදන්නේ නැහැ කියා. මට ජනතාවට ඉදිරිපත් කරන්න ඕනනේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මට කතා කරලා කිවුවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මට ජනතාවට දැන ගන්න ඕන. පෙන්වන්න ඕන . මා මේ යෝජනාව කරලා තිබෙන්නේ . අනුමත වෙලත් තියෙන්නේ. මෙය එක පාරක් ප්‍රතික්ෂේප වුණාම . මා ගාල්ල දක්වා කතා කරලා නිවැරදි කර ගත්තා. ආයේත් ප්‍රතික්ෂේප වෙලා තිබෙනවා. අමාත්‍යාංශය අතිගරු ජනාධිපතිතුමාගේද ගරු අගමැතිතුමාගේද කියා අපි දැන ගන්න ඕන. ප්‍රජා ශාලා හදන්නේ නැහැ කියා. ආණ්ඩුවේ වුණත් කියන්න ඕන ඇත්ත. මොකද ඒ අය මරාගන්න එනවා මා සමඟ දැන් අවුරුදු ගාණක් තිස්සේ මේක කෙරෙන්නේ නැහැ කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ . මේ ව්‍යාපෘති යටතේ මුදල් දෙන්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මා මේ කතා කරන්නේ ප්‍රාදේශිය ලේකම්ට අයිති නිලධාරින් 4 දෙනා සිටින සේවා පියස සමඟ ප්‍රජා ශාලාව . කරිත්තකන්ද කොට්ඨාශයට කිසිම ප්‍රජා ශාලාවක් නැහැ. අපි නගර සභාවෙන් හැදුවේත් නැහැ. අපේ ජනතාවගේ ප්‍රධාන ඉල්ලිම ප්‍රජා ශාලාව. කාණුව දමන එකටවත් කාණුව දමන එකටවත් කලින්. ඉතිං මේ ජනතාවගේ ඉල්ලීම් තමයි මා දමා තිබෙන්නේ. යෝජනා 4ක් මා මේ සභාවට දමා තිබෙන්නේ. ඔය ඔය ස්ථානයේම අපි නගර සභාවෙන් හදන්නත් අනුමත කර තිබෙනවා. ඒ අවශ්‍යතාවය වැඩි නිසා. ජනතාවගේ ඉල්ලීම. මට ඉල්ලා අස්වෙන්න කියා තිබෙනවා මන්ත්‍රිකමෙන්. මට කවුරු හෝ වේවා. ප්‍රාදේශිය ලේකම් කට වචනයෙන් කිවුවාට මට පිළිගන්න බැහැ. ඒක ලිඛිතව දෙන්න . මා ජනතාවට අලවා පෙන්වන්නම්. මෙන්න මේකයි ප්‍රජා ශාලා හදන්නේ නැහැ කියා.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්__

මට කතා කරලා කිවු විදියට ඕක තමයි කිවුවේ.

__ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්__

මට වෙනත් යෝජනාවක් දෙන්නත් කිවුවා. මේ සභාවේ එපැයි කතා කරන්න. නිත්‍යානුකුල ස්ථානය මෙතැන. මෙතනදි මා ඉල්ලිමක් කරනන් ඕන. ලිඛිතව මට දෙන්න කියා . මෙයට විරුද්ධ වෙන්න හේතුව. එතකොට මට පුළුවනි වෙනත් යෝජනා ඉදිරිපත් කරන්න.

__ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්__

මේ ප්‍රතිපාදන වලට අයිති නැද්ද?

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්__

මේ දෙනු ලබන මුදල් තුළට එය වැටෙන්නේ නැහැ කියන ඒක. වෙන දෙයක් නෙමේ. මෙතුමා ඒක දන්නවා. මෙතනදිම පලමු වතාවේම ප්‍රතික්ෂේප වුණා. ප්‍රතික්ෂේප වුණාම මෙය ඇතුළත් කිරිමට එතුමා මේ සම්බන්ධව කතා කළා. මේක මා හිතන විදියට නම වෙනස් කර ගත්තා නම් හොඳයි. අපි ඉල්ලන්නේ ප්‍රජා ශාලාවක් කියා නෙමේ ඉල්ලා තිබුණේ. සේවා පියසක් වශයෙන් තමයි සමෘද්ධි නිලධාරින්ට ඒ නිලධාරින්ට සිටිම සඳහා ස්ථානයක්. නගර සභාවෙන් හරි අපි හදන්නම්.

__ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්__

වෙනත් ප්‍රතිපාදන වලින් හරි හදන්නම්.

__ගරු නගර සභා මන්ත්‍රි මඟගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, සපිරි ගමක් යටතේ සේවා පියසක් ඉදිකිරිම. දැන් ඔබතුමා කිවුවා මාගේ කොට්ඨාශයේ දැන් ප්‍රජා මණ්ඩල හරහා ගත්තේ  මේ යෝජනා. මුලික යෝජනා දෙක. මේකේ එකතුව ගත්තොත් ලක්ෂ 20කට වැටෙන්නේ නැහැ. 5% සමිති වලට යන වියදමයි බැලුවාම. මේහි ඇස්තමේන්තු හදපු විදිය පොඩ්ඩක් දැන ගන්න පුළුවන්ද?

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්__

ඒක ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් දැන ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

තව එකක් ගරු සභාපතිතුමනි, ගරු උප සභාපතිතුමා කිවූ පරිදි අපේ කොට්ඨාශයේ යහපාලන ආණ්ඩුව යටතේ කෝටි 30ක වැඩ කටයුතු කළා. එයට ස්තුතිවන්ත වෙනවා යහපාලන රජයට. වසමකට ලක්ෂ 20 ක් වගේ වෙනවා. ලක්ෂ 5යි මට වැටුනේ. අපේ ගරු උප සභාපති කිවූ පරිදි ලොකු ගැටළුවක් තිබුණා. අතිතයේ දෙනු ලැබූ ඇස්තමේන්තුවට වලට තමයි මේ කොන්ත්‍රාත් හදා තිබෙන්නේ. ගොඩක් කොන්ත්‍රාත්කරුවන් කොන්ත්‍රාත් අතහැර දැමුවා. අපට ලක්ෂ 30ක 20ක වැඩ කරගන්න බැරි වුණා. එම හේතුව නිසා. ඉතිං මේවා නිවැරදි කර ගත යුතුයි. තව එකක් තමයි වැඩ කිරිමේදි ප්‍රායෝගික ගැටළු තිබෙනවා. කාණු පද්ධති සැදිමේදි. මහ අම්බලන්ගොඩ කාණු පද්ධති. ඒ වගේම දැන් අපේ පැත්තෙම කාණු පද්ධති දමා තිබෙනවා. මා මේ කියන්නේ ප්‍රායෝගික ගැටළු. තොටුපොළ පාරේ දිගටම කාණු පද්ධති තිබෙනවා. බැකෝ එකකින් හරන්නත් බැහැ. අඩුම ගණනේ මේ කොන්ත්‍රාත්කරු මේ අවධානම ගන්නවා. නිලධාරින් එක්ක දැනුවත් වෙලා අඩුම ගණනේ මේ සම්බන්ධව ලිපියක් ගන්න. එහි වගකීමක් තිබෙනවා. දැන් තව වගකීමක් තිබෙනවා .

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

දැන් මෙහෙමයි. ගරු මන්ත්‍රීවරු කොන්ත්‍රාත්කාර මහත්වරු ගැන කතා කරන්න එපා. අපට රජයෙන් නියම කරනු ලැබූ දිස්ත්‍රික් කමිටු මිල ගණන් වාර්තා අනුව ඊළඟ ලිපි යටතේ තමයි ඉදිරිපත් කරන්නේ. ඒ අවස්ථාව අනුව තිබෙන මිළ ගණන් අනුව තමයි කාර්මික නිලධාරින්ට දැනුම් දෙනු ලබන්නේ. කාර්මික නිලධාරින් හිටියත් රජයෙන් අනුමත කරන මුදලට වඩා කරන්න බැහැ. ඔන්න අද තමයි සම්මත වෙන්නේ. පලමු ලිපිය යටතේ අනුමත කර තිබෙනවා. එතකොට ඒ මිළ ගණන් යටතේ අනුමත කර තිබෙනවා. පිටපතක් ඕන නම් ගන්න පුළුවන්. ඒ මිල ගණන් යටතේ තමයි තිබෙන්නේ. මේ කොන්ත්‍රාත්කරුවන් ගැන සාකච්ඡා කිරිම වැරදියි. මිළ ගණන් අපිට ප්‍රශ්නයක් කර ගන්න එපා. අපිට වැඩය තිබෙන්න ඕන. වැඩයේ විචලාතාවයක් ඇති වුණොත් අපි රජය සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හා සාකච්ඡා කරන්නම්. අපි මෙතනදි කොන්ත්‍රාත්කරුවන්ගේ ප්‍රශ්න කතා කිරිම වැරදියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එතකොට මේ පාරවල් ඒවා හදන ඒවා හොඳයි. නමුත් අපි දැන ගත යුතුයි පාරක් කියන්නේ මොකක්ද කියා නිර්වචනය කර ගන්න. මේ තාර  කට්ටිය පාරට දමන ඒවා තමයි පාරක් කියන්නේ. පාර දැනට අවුරුදු 25කට එහා දාපුවා නෙමේ තිබෙන්නේ. ඒ කාලයේ වාහන ගමන් කිරිමට වැඩියේ වාහන 1500ක් 2000ක් විතර මේ පාරවල් වල යනවා. එතකොට පාරේ ගමන් කරන්නේ වාහනය විතරක් නෙමේ. පයින් ගමන් කරන මිනිසුනුත් ඉන්නවා. එතකොට තාර ටික දැම්මාට තාර කට්ටයේ මනුස්සයකුට යන්න බැහැ. ඒ තාර කට්ටය හා කාණුව අතරේ තිබෙනවා ඉඩ ප්‍රමාණයක්. ඒ කොටසේ තමයි පයින් මිනිසුන් ගමන් කරන්නේ. සුදු ඉර ගසා තිබෙන්නේ පාරේ තාර කට්ට අයිනේම. එතකොට පයන් ගමන් කරන කෙනා පාරේ

කොහේද යන්නේ. ඒ කෙනා යටවුණත් වාහන අයිති කෙනා වග කියන්නේ නැහැ. එයාට අයිතියක් තිබෙනවා. සුදු ඉර දක්වා වාහනය අයින් කරන්න. එතකොට අපි මේ පාරක් කියන්නේ මොකක්ද කියා නිර්වචනය කර ගතයුතුයි පාරක් හදන්න කලින්. මා දන්නේ නැහැ සභාව මොන වගේ අදහසක් ගනිද කියා. පාර කට්ටය පිළිබඳව. පාර කට්ටය දෙපැත්තේ පස් පුරවා හදා දිය යුතුයි. කාණුව තිබෙන්න ඕනේ. මීට කලිනුත් මේවා කතා කර තිබෙනවා. ගේට්ටුවෙන් පාරට පිවිසීමට තිබෙන ඒ බෑවුම් ඉවත් කරන්න ඕන. ඒවා මිනිසුන්ගේ අයිතිය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

පාරක ගස් වැටිලා තිබෙනවා නම්. පාරට අතු නැමිලා තිබෙනවා නම් ඒවා අයින් කරන්න ඕන. පාරක් කියන්නේ අන්න එහෙම එකක්. දැන් මේ තාර ටික දමා කියනවා අපි පාර හැදුවා කියා. එක පාර හැදීමක් නෙමේ.තාර දමනවා මේ වසරේත් දමනවා, ලබන වසරේත් දමනවා. අපි ඇස්තමේන්තු කරනවා. අපි මුදල් ගෙවනවා. මට පුද්ගලිකවම මේ පාරවල් හදන ක්‍රමයට මට කොහෙත්ම එකඟ වෙන්න බැහැ. එමනිසා හදන ආයතන වලට හෝ මුදල් ගෙවන ආයතන වලට දැනුවත් කරන්න පාරක් කියන්නේ මොකක්ද පාරක කොටස් කියන්නේ මොකක්ද ? පාරේ ගමන් කරන්නේ කවුද ? වාහන විතරද ? පයින් ගමන් කරන්නන්ට තිබෙන අයිතිය මොකක්ද? අන්න ඒවා පිළිබඳව විශ්ලේෂණයක් කරලා ඒ අනුව කටයුතු කරන්න කියා මා ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන ලද්දේ සත්‍යයක්. විශේෂයෙන්ම මා පසුගිය රජය කාලයේ අර ගොඩහේන පාර කාපට් කළා. දෙපැත්ත පස් නිකං දාන්න ඕනවට දමාගෙන ගියා . දැන් මේ වනවිට තාර කට්ටය උඩින් තිබෙනවා. පස් යටින් තිබෙනවා. ඉතාමත් භායනක තත්ත්වයක්. කාපට් එක තිබෙනවා අඩි 10ක් විතර වගේ. එතකොට වාහනයක් ගියාම මිනිසුන්ට යාමට අපහසුයි. දැන් සම්පූර්ණ කැළය වැවිලා. හොඳම උදාහරණය තමයි තල්ගස්ගොඩ ප්‍රදේශයේ පුංචි පාලමත් මහ පාලමත් අතර ප්‍රදේශය. යන්තම් තාර කට්ටය විතරයි. මා පසුගිය කාලයේ ශ්‍රමදානයක් දමා සුද්ද කළා. දැන් මාස තුනකට හතරකට ඉස්සර වෙලා. දැන් ආයේත් කැළය වැවිලා. එමනිසා එතුමා හොඳ යෝජනාවක් කළේ. ඒ පාරවල් කරමාන්තය කෙරෙනවා නම් ඒ දෙපැත්ත පස් දමා ඒ තාර කට්ට ගණනට කරන්න ඕන. එමනිසා අපි අපේ කාර්මික නිලධාරි මහත්ම මහත්මීන්ට කියන්න ඕන. මාගේ කොට්ඨාශයේ නම් ඊයේ දිනයේදි ත් මා පාරවල් මනින විට කිවුවා ඒවා ගන්න කියා. කොට්ඨාශයේ මන්ත්‍රීවරයා විසින් එම පාරවල් ඇස්තමේන්තු කරන විටම එය කළ යුතුයි. පාරවල් තාර දමනවා නම් දෙපැත්තේ පස් දමන්න කියන එකත් ඇස්තමේන්තු කළ යුතුයි. ඒවා ඇතුළත් නොවුණහොත් කොන්ත්‍රාත්කරුවාට ඒවා දමන්නත් බැහැ. එය කළේ නැහැ කියා කොන්ත්‍රාත්කරුට දොස් කියා වැඩක් නැහැ. එමනිසා කොට්ඨාශභාර හා මන්ත්‍රීවරුන්ගේ වගකීමක් වෙනවා එය නිසියාකාරව කර ගැනීම. එමනිසා ගරු මන්ත්‍රීවරු ඒ ගැන අවධානයෙන් සිටින ලෙස මා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ඇත්තටම අපේ ගරු නගර සභා මන්ත්‍රී සරත් මන්ත්‍රීතුමා කිවූ දෙයට මට මුහුණ දෙන්න සිදු වුණා. කළුවඩුමුල්ල කොඩිකාර ප්‍රදේශ තාර දැමීමේදි. දිස්ත්‍රික් ලේකම් එකෙන් අනුමත කර තිබුණේ ඔය දෙපැත්තට කිසිම දෙයක් නොමැතිව. ඒ ගැන ගම්වාසින් සියළුම දෙනා මට කිවුවා. මා නෙමේ මේ පාර කොන්ත්‍රාත් එක කරනු ලැබුවේ. මා කිවුවා මා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට මේ ගැන

කියන්නම් කියා. ප්‍රාදේශිය ලේකම්තුමිය එහි තාක්ෂණසේවා නිලධාරිට කිවුවා එකත් බලන්න කියා. මිනිසුන් යන්න ඕනේ. කාණුවට බහින්නද කියා. හැබැයි ඊට පසු එය හරියටම සකස් කර දුන්නා. එහෙම කියන්න ඕනේ . මොකද එතුමන්ලා දන්නේ නැහැ. ඔබතුමා කිවුවා හරි අධික්ෂණ කටයුතු අපි කරන්න ඕනේ. එහි තාක්ෂණසේවා නිලධාරි මහත්මියට මා කතා කර කිවුවා. මට ලොකු ප්‍රශ්නයක් මා දන්නේත් නැහැ. දැන් මිනිසුන්  කැගහනවා. මේ පාරේ දෙපැත්තේ මිනිසුන්ට යන්න විදියක් නැහැ. පාර හදන්නේ නැතුව. හැබැයි ඊට පසු පාර දෙපැත්තම සකස් කර දුන්නා. ඔබතුමා කිවුවේ හොඳ අදහසක්. එහෙම වෙන්න ඔනේ පාරවල් හදනවා නම්. දැන් පාරවල් ලැයිස්තුවක් කියෙව්වානේ. දැන් ඒ පාරවල් හදනවා නම් ඒ වගේ වෙන්න ඔනේ. දැන් සපිරි ගමක් කියා. නිවෙස් වල ඉන්න හම්බ වෙන්නේ නැහැ. අනිත් එක හොඳ චේතනාවෙන් වැඩක් කරන්න ගත්තාට බැණුම් අහන්නේ අපි. එකෙන් බෙරෙන්නත් ඔනේ. අනිත් එක මේ සපිරි ගමක් කියා වෙන් කරනු ලබන්නේ අපේ මුදල්. මොන රජය වුණත් අපේ ජනතාවගේ බදු මුදල් වලින් එකතු කරන මුදල්. එමනිසා මෙහි උපරිම ප්‍රායෝජනය ගන්න. මෙතුමිය කිවුවා වගේ ප්‍රාදේශිය ලේකම්තුමියට ඒ යවන ලිපියේ එකත් ලියා යවන්න. මොකද මේ පාරවල් සකස් කිරිමේදි මේකත් ඇතුළත් විය යුතුයි කියා. ඊට වඩා එම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ තාක්ෂණසේවා නිලධාරින්ට වඩා අපේ නගර සභාවේ කාර්මික නිලධාරියෙකුත් අනිවාර්යෙන්ම සහභාගි වෙන්න කියා මා ඉල්ලිමක් කර යවන්න. ඒ අයත් අධික්ෂණය කරන්න කියා මෙය.

<u>ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

මා මිට කලිනුත් මේ සභාවේ මෙය සාකච්ඡා කර තිබෙනවා. රොසේත් හංදිය සිට පොල්වත්ත හංදිය දක්වා පාරේ මිනිසුන්ට යන්න බැහැ. අර ලංගම සේවයේ බස් රථයක් හා තවත් වාහනයක් පැමිණි විට ජනතාවට කැළයට පනිනවා. ඒ එහා පැත්තේ නිවසකට පනින්න ඔනේ. ඔය කියන කතාව එක්ක අපේ මුදල් ප්‍රතිපාදන එන්නේ පළාත් සභාව හරහා මෙහේට. එක ප්‍රතිපාදනයක් ඇවිත් තිබෙනවා කාණු වැසිමට ෂැල්බ් දැම්මට. කාණුවලට වසා පස් දමා තිබෙනවා මිටර් 100ක් විතර  නිකං ෂැලැබ් කැලි දමා අර මිනිසුන්ට යන්න හරි ගස්සලා. එක ගිහින් බලන්න. කොහොමත් යන පාරනේ. හවස 5.00 ට බලන්න යන්න පුළුවන් ද කියා ඔතන. හරිම මරණස්ථානයක්. මිනිසුන් නොමැරි සිටින එක පුදුමයක්. ඉතිං මා හැම සභාවකම මෙය කතා කර තිබෙනවා. සම්බන්ධිකරණ රැස්වීමකදිත් ඉල්ලා සිටියා. හැබැයි එය නිවැරදිව අද වනතුරු සිද්ධ වුණේ නැහැ. එයට සමගාමී නිසායි මා මේ ප්‍රකාශය කරනු ලැබුවේ.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

සභාවේ කතා කළා කියන්න විශේෂයෙන්ම කුලරත්න පාර සිට බටපොළ පාර දක්වා පාර දෙපස මට්ටම් කරන ඇල්පිටිය  ඉංජිනේරු වෙත දන්වා යවන්න. අදාළ ඇල්පිටිය. එමනිසි ඇල්පිටියට දන්වා යවන්න. ඒ කටයුත්ත ඉතා ඉක්මනින් කරන්න කියා.

**තීරණය -**

**සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2020** යන මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එවා ඇති අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත සංවර්ධන ව්‍යාපෘති ඇතුළත් ලේඛනය සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා  විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

❖ **පෙරවරු 11.45 ට පමණ ගරු සභාපතිතුමා සභා ගර්භයෙන් නික්ම ගිය අතර ගරු උප සභාපතිතුමා ගරු සභාවේ මූලාසනයට පැමිණියහ.**

**03.09 අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ කොරෝනා වසංගතය හේතුවෙන් අපහසුතාවයට පත් ජනතාවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් රු.5000/- දීමනාව ලබාදීම පිළිබඳ තොරතුරු සභාගත කරන ලදී.**

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ කොරෝනා වසංගතය හේතුවෙන් අපහසුතාවයට පත් ජනතාවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් රු.5000/- දීමනාව ලබාදීම පිළිබඳ තොරතුරු සභාගත කිරිම. තමන්ගේ කොට්ඨාශ වලට ලබා දුන් ලැයිස්තුව තිබෙනවා. එය මන්ත්‍රිවරු ලබා ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

අපටත් එය ලබා ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම කතා කරමින්</u>**

එය ලබා දීම වගේම පොඩි මේවා එකක් තිබෙනවා. තමුන්නාසේලාගේ කොට්ඨාශ මන්ත්‍රිතුමා , සරත් චන්ද්‍ර මන්ත්‍රිතුමා , මමත් සහභාගි වුණා. අපේ ලැයිස්තුව අපි කලින් හදා දුන්නා. හැබැයි ඔගොල්ලන්ගේ චක්‍රලේඛණ වල තිබෙනවා මන්ත්‍රිවරු අත්සන් කරන්න ඕන කියා. ගෙවිම් කරන කොට අපි තුන්දෙනාගේ අත්සන් තුන ගියේ නැහැ. ඒ තුළ දන්වා ලිපියක් යවන්න කියා අපි කිවුවා. මා ධම්මික කොඩිකාර මන්ත්‍රිතුමාටත් කිවුවා. අන්න එක යවන්න කියා අපි ඉල්ලා සිටිනවා. ගෙව්ව ක්‍රමය අපට වැඩක් නැහැ. ඕන විදියකට අපට ගෙවන්න තමයි ඕන. මන්ත්‍රිවරුන් හැල්ලුවට ලක් කිරිම ගැන. ඇත්තටම කොට්ඨාශ මන්ත්‍රි මෙතුමාට තමයි බලය යන්නේ . එයට ලිපියක් යවන්න කියා අපි ඉල්ලා සිටිනවා.

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

කළුවඩුමුල්ල හා ඕකන්ද යන කොට්ඨාශ දෙකේ රු.5000/= ලබා දීමේදි මහජන නියෝජිතයා සම්බන්ධ කර ගන්න කියා චක්‍රලේඛණයේම සඳහන් කර තිබුණා. එම කොට්ඨාශ වල මන්ත්‍රිවරු තිදෙනා සහභාගි වුණත් අත්සන් නොමැතිව ගෙවීම සම්බන්ධව විරෝධතාවය ප්‍රකාශ කළා කියා ප්‍රා දේශිය ලේකම්තුමියට නිර්දේශ ලිපියක් යවන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත කතා කරමින්</u>**

ග්‍රාම නිලධාරිතුමිය මෙතැනින් අයින් වුණානේ මේ රු.5000/= දීමනාව දීමේදි . ඊට පසුව ග්‍රාම නිලධාරින් නැතිව අභියවනා 44767 ක් පැමිණ තිබෙනවා. ප්‍රවෘත්ති වලට පෙන්නුවා රු.5000/= දිමනාව සම්බන්ධ අභියවනා. මේ අභියාචනා දීමේදි මා හිතන්නේ මේ ලැයිස්තු වලට මේය ඇතුළත් වෙලා නැහැ. මේ අපිට දිපු ලැයිස්තු වලට ඇතුළත් වෙලා නැහැ මේ අභියාචනා. මෙය කොහොන්ද එන්නේ . කොතනින්ද එන්නේ කියන ගැටවවක් තිබෙනවා. තව

එකක් මේ කමිටුවේ ග්‍රාම නිලධාරිතුමිය නැහැනේ . මගේ ගමේ නම් 9ක් විතර තිබුණා. මන්ත්‍රිවරයා විදියට මා අත්සන් කළා. ග්‍රාම නිලධාරිතුමිය නැහැ. මේ 44767 පිළිබඳව විනිවිදභාවයක් තිබෙනවා ද කියන පොඩි ගැටළුවකුත් තිබෙනවා. මුදල් පාලනය පිළිබඳව . ඉතිං ඒ සම්බන්ධව පොඩි දැනුවත් කිරිමක් කරන්න පුළුවන්ද ඔබතුමාට.

<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

මෙය නොලැබුණු කට්ටිය අභියාචනා ඉදිරිපත් කරන්න කියා තිබෙනවා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන්. ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට ඉදිරිපත් කර තිබෙනවා. ඉතිං මාගේ කොට්ඨාශයේ දෙදෙනෙක් සිටිනවා. ඒ දෙදෙනා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට භාර දී තිබෙනවා. සමහර වේලාවට මන්ත්‍රිවරුයි නිලධාරිනුයි විශ්වාසය නැති නිසා තමයි භාර දි තිබෙන්නේ. ඒ වගේ ලංකාවෙන්ම භාර දිපු ගණන තමයි ඔය 44767.

<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත කතා කරමින්</u>

ඒ භාරදිපු අයට අමතරව ද මේ 44767 කියා දැනුවත් කිරිමක් කරන්න කිවුවේ. ඒ කියන්නේ මේක දේශපාලනික වෙලා.

<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

මා දන්නා තරමට නැහැ.

**තීරණය -**

අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ කොරෝනා වසංගතය හේතුවෙන් අපහසුතාවයට පත් ජනතාවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් රු.5000/- දීමනාව ලබාදීම පිළිබඳ තොරතුරු ගරු සභාවේ දැනගැනිම පිණිස මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

## 03.10 මහජන ක්‍රීඩාංගනයට Side Turf Wicket 03 ක් සකස් කරදෙන ලෙස ඉල්ලා ක්‍රීඩා භූමි භාරකරු සහන් සංකල්ප මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.

<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

මහජන ක්‍රීඩාංගනයට Side Turf Wicket 03 ක් සකස් කරදෙන ලෙස ඉල්ලා ක්‍රීඩා භූමි භාරකරු සහන් සංකල්ප මහතා විසින් ඉල්ලිමක් කර තිබෙනවා. මහජන ක්‍රිඩාංගණයේ විකට්ටු සම්බන්ධයෙන්. අප නගර සභාවේ පුළුල් ලෙස සංවර්ධනය කරන ජනතා අයිතියට භාරදීමට කටයුතු කරන මහජන ක්‍රිඩාංගණයේ ප්‍රධාන තණතිලි තුන ක්‍රිකට් සඳහා පමණක් තබා ගනිමින් ලබා නොදි පුහුණු විම් කටයුතු සඳහා පැති විකට් තුනක් සකස් කර නඩත්තු කරගෙන යාම වඩාත් යෝග්‍ය වෙයි. මන්ද ප්‍රධාන විකට්ටු තුනේ තරඟයට අමතරව පුහුණු විම් වල නිරත වීම

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

මෙහි අන්තර්ගතය දන්නවා. කලින් මෙහි විකට් තුනක් තිබුණා නේද ?

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

නැහැ . මේ ඉල්ලා තිබෙන්නේ තණනිලි

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා  කතා කරමින්</u>**

Side Wicket එකක්. මා දැක්කා එහා පැත්තේ ඔය වගේ ඒවා තුනක් ද කොහේ තිබුණා. එතකොට මෙය දැන් නගර සභාවෙන් ඉදිකරන එක හරි . ඕක ක්‍රිඩා කමිටුවට යවලා ද? ක්‍රිඩා කමිටුවට ලියුම යවලාද ?

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

නැහැ. ක්‍රිඩා කමිටුවට යවා නැහැ. ගරු සභාපතිතුමා නිර්දේශ කර තිබෙන්නේ සභාවට යොමු කරන්න කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා  කතා කරමින්</u>**

එහෙනම් හරි. අනුමත කරනවා.

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එය සකස් කිරිමට සභාව තින්දු කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා  කතා කරමින්</u>**

ඕක නිත්‍යානුකුලව අදාළ නිලධාරින් එවා තිබෙනවා ද?

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එතුමාගේ නිර්දේශය තිබෙනවා. එහෙනම් එය ඉදිකිරිමට අනුමැතිය දෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා  කතා කරමින්</u>**

දැන් මේක ගත්තාම . මෙයට පරික්ෂණ වාර්තා ගන්න කියා සභාව තින්දු කළා. එහි මැටි දමනවා කියා එක එක්කෙනාගේ දෝෂාරෝපණය එක්ක තමයි මේවා කළේ. එතකොට මේ සභාව තින්දුව ගත්තාම දැන් මාස අටක් විතර වෙනවා මේ සභා තින්දුව අරගෙන . ඇයි මේක ක්‍රියාත්මක නොවෙන්නේ.

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එක අහන්න ඕන ලේකම්තුමියගෙන් තමයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා  කතා කරමින්</u>**

ඒක තමයි අපිට ඕන මේවා එක. මොකද හේතුව . දැන් සභාව ගත්ත තීන්දුව අනුව මොනවා හරි ගෙවීමක් කරන්න ආපහු ආවම දැන් කොන්ත්‍රාත්කරුත් අපිත් සමඟ තරහා වෙනවා. මොකද හේතුව අපි මෙය හිර කරගෙන ඉන්නවා කියා. අපි හිරකරගෙන ඉන්නේ නැහැ. අදාළ කර්තව්‍යයට සභාවෙන් තීන්දුවක් දී තිබෙනවා. මොකද කොන්ත්‍රාත්කරුවනුත් අමාරුවෙන් තමයි යන්නේ. එතකොට මේ මුදල් ගෙවන්න නම් අපිට අවශ්‍ය ඒ මේවා ටික ඔබතුමියලා දෙන්න ඕන. නීත්‍යානුකූලව කටයුතු කරන්න.

<u>**මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

මේ කොන්ත්‍රාත්කරු වියදම් කර තිබෙනවා මෙයට ලක්ෂ 5ක් විතර . එයා කැමති නැද්ද මෙයට මුදල් ගන්න. නැතිනම් ඔගොල්ලන් උනාන්දු නැතිද කියා. දැන් පරීක්ෂණ වාර්තාවක් ලබන්න බැහැනේ. දැන් තණකොළත් හිටවා තිබෙන්නේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා  කතා කරමින්**</u>

දැන් මට දැනගන්න ඕන . මෙකෙන් තාම ලියුමක් එහෙට යවා තිබෙනවාද ? මේ යවන ලද ලිපිය සභාගත කරන්න. අපිට ප්‍රශ්නයක් නැහැ. මේ තිබෙන ප්‍රශ්නය උඩ ගෙවීම් කරන්න පරක්කු වුණාම එපාර තවත් ප්‍රශ්නයක්. ඒ පාර පෞද්ගලිකව එක එක්කෙනා අපිත් එක්කත් අමනාප වෙනවා අප සමඟ . එමනිසා මෙය විනිවිදභාවයෙන් කරන්න කියා ඉල්ලා සිටිනවා. ඔය යවන ලද ලිපි වල පිටපත් අපිට ලැබෙන්න සලස්වන්න.

<u>**මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

එහෙමනම් මේ Side Turf Wicket 03 සෑදීමේ විරෝධතාවයක් නැහැනේ.

**තීරණය -**

මහජන ක්‍රීඩාංගනයට Side Turf Wicket 03 ක් සකස් කරදෙන ලෙස ඉල්ලා ක්‍රීඩා භූමි භාරකරු සහන් සංකල්ප මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව Side Turf Wicket 03 ක් ලබාදීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

04. යථා පරිදි කල් දි ප්‍රශ්න නැත

05. යථා පරිදි කල් දී යෝජනා

**05.01** **ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව සභාගත කරන ලදී.**

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

**05.01.01** **තල්ගස්ගොඩ පාරෙන් අතුරු පාර කොන්ක්‍රීට් කිරිමේ යෝජනාව ගරු සභාපතිතුමා ඉවත් කරන්න කියා තිබෙනවා.**

**තීරණය -**

තල්ගස්ගොඩ පාරෙන් අතුරු පාර කොන්ක්‍රීට් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ඉවත් කරන ලෙස එතුමා විසින් දැන්වූ බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් දැනුම් දුන් අතර එම යෝජනාව ඉවත් කිරීමට තීරණය කරන ලදී.

**05.01.02** **නගර සභා ක්‍රීඩාංගනයේ පුහුණු පැති විකට්ටු ඉදිකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

නගර සභා ක්‍රීඩාංගනයේ පුහුණු පැති විකට්ටු ඉදිකිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

නගර සභා ක්‍රීඩාංගනයේ පුහුණු පැති විකට්ටු ඉදිකිරීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.03** **නගර සභා ක්‍රීඩාංගනයේ ක්‍රීඩාගාරය ඉදිරිපිට පොළොවට ඉන්ටර්ලොක් ගල් ඇල්ලීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

නගර සභා ක්‍රීඩාංගනයේ ක්‍රීඩාගාරය ඉදිරිපිට පොළොවට ඉන්ටර්ලොක් ගල් ඇල්ලීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා  මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

නගර සභා ක්‍රීඩාංගනයේ ක්‍රීඩාගාරය ඉදිරිපිට පොළොවට ඉන්ටර්ලොක් ගල් ඇල්ලීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති  කමල් වැල්ලගේ මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා  මන්ත්‍රී  ඒ.ඩබ්.ජගත් කුමාර මහතා   විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.04 හල්වතුර සහ විලේගොඩ යාකරන පාරේ බෝක්කුව සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

හල්වතුර සහ විලේගොඩ යාකරන පාරේ බෝක්කුව ඉදිකිරීම සුදුසු  බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා  මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

හල්වතුර සහ විලේගොඩ යාකරන පාරේ බෝක්කුව ඉදිකිරීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති  කමල් වැල්ලගේ මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා  මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා  විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.05 පනියන්දුව හරස් පාර අලුත්වැඩියා කිරීමේ  යෝජනාව සභාගත කරන ලදී.**

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

පනියන්දුව හරස් පාර අලුත්වැඩියා කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා  මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

පනියන්දුව හරස් පාර අලුත්වැඩියා කිරීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති  කමල් වැල්ලගේ මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා  ඒ.ඩබ්.ජගත් කුමාර මහතා   විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.06 නගර සභා ක්‍රීඩාංගනයේ ලකුණු පුවරුව ඉදිකිරීම යෝජනාව සභාගත කරන ලදී.**

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

නගර සභා ක්‍රීඩාංගනයේ ලකුණු පුවරුව ඉදිකිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

නගර සභා ක්‍රීඩාංගනයේ ලකුණු පුවරුව ඉදිකිරීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.02 ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව සභාගත කරන ලදී.**

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

05.02.01 ගරු ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව සභාගත කරන්න.

**05.02.01 සෑම කොට්ඨාසයකම ගෙවතුවලට වගා බීජ කට්ටල සපයා දී රජයේ වගා වැඩසටහන ප්‍රවර්ධනයට අනුබල ලබාදීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

සෑම කොට්ඨාසයකම ගෙවතුවලට වගා බීජ කට්ටල සපයා දී රජයේ වගා වැඩසටහන ප්‍රවර්ධනයට අනුබල ලබා දිය යුතුයැයි මා යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ආර්ථික නිදහස නොමැති තැන කිසිදු නිදහසකින් ප්‍රයෝජනයක් නැතැයි කියා කියමනක් තිබෙනවා. මේ රට රු.1000/= දිමනාව ලබා ගන්න ගිහින් ජීවිත තුනක් නැතිවුණු රටක්. කොච්චර අභිමානයෙන් කතා කළත් . අපේ පුරවැසියෝ ඒ තරමටම ආර්ථික අපහසුතාවයෙන් දුක් විදිනවා. මෙන්න මේ බඩවියත රැක ගැනීමේ මහ අරගලයට එකම විසඳුම නම් වගාවයි. අපිට සමීපතම වගාව ගෙවතු වගාවයි. ඒ අනුව තමයි අපේ වර්තමාන රජය සෞභාග්‍යා කියා වගා

ක්‍රමයක් ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ අනුව පසුගිය වසංගත අවදියේදී අපේ රට වැසියන්ට ඔනැවටත් වඩා කාලය ලැබුණා මේ වගාවට. ඒ අනුව ඔවුන් හරි හරියට වගා බිම් සැකසුවා.

- පස්වරු 2.05 ට ටෙන්ඩර් විවෘත කරන ලදී.

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>

ඔවුන් තමන්ට තිබෙන බීජ භාවිතා කර , මිලට ගෙන , සොයා ගෙන වගා කළා. අපි දකිනවා ජන සමාජයේ වගාව ඉතා අලංකාරව ප්‍රචලිත වන අන්දම. මේ වනවිට ඔවුන්ට ඇති ප්‍රධානම ගැටළුව නම් සුදුසු තත්ත්වයේ බීජ නොමැති කමයි. එමනිසා අපේ පුරවැසියෝ මේ බීජ පිපාසයෙන් එහේ මෙහේ සරනා ආකාරය අපට පෙනෙනවා. පසුගිය කාලයේ මට මතකයි අර පරණ පාරේ බීජ කඩයත් ගිනි අරගෙන තිබුණා. එම කඩයේ එක ඇටයක්වත් නැති වෙන තරමට හිස් වුණා. මේ අවස්ථාවේදී අපි අදහස් දක්වන්නේ මේ නගරයේ සිටින ඒ පවුල් ඒකක වලට අවශ්‍ය ප්‍රමාණයෙන් උසස් තත්ත්වයේ බීජ ලබා දිලා මේ අවශ්‍යතාවය සපුරන ලෙසයි. අපි දකිනවා කොන්ක්‍රීට් ස්ථර වල පවා ඒ නවතම තාක්ෂණය අනුව වගා කරනවා අපේ නගර වැසියෝ. නගරයේ මුල් පුරවැසියා අපට ආදර්ශය දුන්නා. ඒ වගේම අපේ ඉංජිනේරු මන්ත්‍රීතුමාගේ පසුබිමත් අප දුටුවා ගෙවත්ත. ඒ වගේම සෙසු අයටත් මේ අවශ්‍යතාවය සපුරා මේ නගර සභාවෙන් ආදර්ශය දිලා මේ මූලික අවශ්‍යතාවය සපුරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

හොඳම වේලාව. හොඳම යෝජනාව වශයෙන් හඳුන්වන්න පුළුවන් මේ මාස ගණන තුළ අපේ ශ්‍රේෂන් මන්ත්‍රීතුමා ගෙන එන ලද යෝජනාව. සෑම කොට්ඨාශයකටම ගෙවතු වගාව බීජ කට්ටලයක් ලබා දී රජයේ වගා ව ප්‍රවර්ධන වැඩ සටහනට දායකත්වයය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. ඉතාමත්ම හොඳ යෝජනාවකි. කොරෝනා පැමිණි පසු ආහාර ප්‍රශ්න , එළවළු ප්‍රශ්න ගැටළු ගොඩක් පැමිණියා. මා හිතන්නේ මෙයට හොඳ වැඩපිළිවලක් ලබා දිය යුතුයි. ගෙවතු වගාව සඳහා මහජනතාවට ඉතාමත්ම උනාන්දුවකින් වැඩ කරනවා. නමුත් බීජ ඇට ගන්න තැනක් නැහැ. කඩවලත් නැහැ. මේකට ඔබතුමලා ව්‍යාපෘතියක් හරි හදලා මෙය ලබා දීමේ වැඩ පිළිවලක් සකස් කරන ලෙස ඉල්ලා සිටිනවා. මෙය ඇත්තටම හොඳ යෝජනාවක් . සියළු දෙනාටම. සෞඛ්‍ය පැත්තට හොඳයිනේ. ආර්ථික වාසි හොඳයි. හැබැයි ඔබතුමාම මෙයට මැදිහත් වුණානම් හොඳයි. අපේ ලොකු මහතා මැදිහත් වුණානම් හොඳයි. එමනිසා ඔබතුමා මැදහත්වෙලා මෙයට මොනවා හරි ක්‍රමවේදයක් ඇති කරන ලෙස ඉල්ලා සිටිනවා. මොකද මේ වගේ දේවල් ඇත්තටම එන්න ඕන. ධම්මික මන්ත්‍රීතුමාත් ඇත්තටම උනාන්දුයි. ගෙවත්ත වගා කරලා තිබෙනවා. මා දැක්කා අපේ ලොකු මහත්තයාත් පතෝල කරලක් අල්ලා ගෙන ඉන්නවා. එමනිසා මා ඉල්ලා සිටිනවා නිගං නෙමේ මොනවා හරි ක්‍රමවේදයක් ඇති කරන ලෙස. සියළු දෙනාට මෙය යනවිදියට ඒ නිර්නායක සමඟ ඒ ක්‍රමවේදයක් ඇති කරන ලෙස. කලින් අපි වැඩ සටහන හදා තිබුණා. බීජ ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද   මහතා කතා කරමින්</u>

ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් මහතා ගෙන එනු ලැබූ යෝජනාව ඉතාමත් හොඳ කලෝචිත යෝජනාවක් විදියට පිළිගන්නවා. එම වැඩ පිළිවල හොඳයි. හැබැයි මේ බිජ ලබා දීමේ වැඩ පිළිවළ මොන විදියට සකස් වෙනවාද කියන එක මට තිබෙන ප්‍රශ්නයක්. මොකද පසුගිය සමයේ බැලුවාම රු.5000/= අයදුම්පත් බෙදීම වගේ ප්‍රශ්න බැලුවාම මේ සභාවේ කටයුතු බැලුවාම මා සැහිමකට පත් වෙන්නේ නැහැ. මා මීට කලිනුත් කතා කළා. මේවා මැතිවරණ අල්ලස් විදියට අර්ථ දැක්වීමට ඉඩ නොදී නිලධාරින් ලවා මෙම වැඩය කරනවා නම් හොඳයි. මන්ත්‍රීවරුන් මේවාට මැදිහත්වීම මා හිතන්නේ නිත්‍යානුකුල නැහැ කියා. යෝජනාව ඉතාම වටිනවා. කලෝචිතයි. හැබැයි මේවා මැතිවරණ අල්ලස් නොවිය යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු උප සභාපතිතුමනි, මා ආරධනා කරනවා මන්ත්‍රීවරුන්ට මාගේ ගෙවත්ත බලන්න එන්න කියා. අපි බැලුවා මේ කෘෂිකර්මෙන් බෙදා දිපු බිජ. එතරම් හොඳ ඒවා නෙමේ. ඒවා පැළ වෙන්නෙත් නැහැ. පැළ වුණාට අපේක්ෂා කරන අස්වැන්න නැහැ. මා බිජ ගෙන එනු ලැබුවේ වැලිමඩින් හා නුවරඑළියෙනි. එතරම් අමාරු වුණේ නැහැ. ෆොන්ටෝ කර ගෙනවාවේ. රු.3600/= ක් වුණා. මා කියන්නේ හොඳ බිජ ලබා දෙන්න ඕනේ. එහෙම නැත්නම් වැඩක් නැහැ. ඔබතුමන්ලාට ඕන නම් ඔය හැම ජාතියෙන්ම දෙන්නම් පැළ ටිකක්. මා කියනවාට ටිකක් ඇවිත් බලන්න. ඒ ක්‍රමවේදයක් එක්ක. ඉතාමත්ම සතුටුයි. මා පැල කර තිබෙනවාත ශ්‍රේෂන් මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාවට පුර්ණ සහායෝගය පුද්ගලිකව ලබා දෙනවා. අපි දෙන්නා ක්‍රියාත්මක කරන්නම්. සභාවෙන් බැරි නම් සරත් මන්ත්‍රීතුමා කිවු පරිදි එය දේශපාලන අල්ලසක් වෙනවා නම් අපි දෙන්නා හරි පුද්ගලිකව ක්‍රියාත්මක කරන්නම්. පෞද්ගලික වියදමින් බෙදා දෙන්න පුළුවන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ශ්‍රේෂන් මන්ත්‍රීතුමා ගෙන එනු ලැබූ කලෝචිත යෝජනාව ගැන අප සතුටු වෙනවා. මෙම රජයෙන් ගෙවතු වගා දස ලක්ෂයේ වැඩ සටහන ක්‍රියාත්මකයි. මේ කොරෝනා වසංගතය නිසා මාස දෙක තුනක් අප නිවෙස් වලට වී සිටින විට තමයි මේ වටිනාකම තෙරුණේ. විශේෂයෙන්ම මේ මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව ක්‍රියාත්මක කිරිමේ ප්‍රශ්නය පමණයි තිබෙන්නේ. ඒ සරත් මන්ත්‍රීතුමා කිවු පරිදි. එකට හොඳ බිජ ප්‍රභේද නැති කමයි තිබෙන්නේ. මේ හොඳ බිජ ප්‍රභේද කොහොන්ද කාගෙන්ද ගම්වලට යන්නේ කියන ඒක තිබෙනවා. මේ ළඟදි මට මතකයි මේ බිජ පැකට් වගයක් ගම්වලට ඇවිත් තිබුණා. කාෂි නිලධාරි හරහා. පැකට් 20ක් 25ක් හරහා. අපිනම් ගම්වල දේශපාලනය කරනවා කියා දේශපාලනයෙන් තොරව තමයි බිජ පැකට් එක ලබා දෙන්නේ. එහෙම දේශපාලනය අපි කරන්නේ.

**<u>මුලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මා දන්නේ ඔබතුමා කිවුවාට පසුවයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

කෘෂි නිලධාරි සමඟත් අපේ පැත්තේ ප්‍රශ්න ඇතිවුණා. බීජ පැකට් ගන්න ගිහින්. එමනිසා විනිවිදභාවයකින් මෙය ලබා දිය යුතුයි.

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

දේශපාලනයකින් තොරව තමයි රු.5000/= ලබා දුන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

සාමාන්‍යයෙන් ප්‍රායෝගිකව කරන්න ගියාම සිද්ධ වෙන දේවල්නේ. ඇත්ත කියනවා නම් මේ වැඩ සටහන හොඳයි. අපි ගොවියන් ආරක්ෂා කරමින් මෙය කළ යුතුයි. ගොවියන්ගේ ආදායම, ඒ පිළිබඳ නියාමන තිබෙනවා. එමනිසා මේ කලෝචිත යෝජනාව දැම්ම සම්බන්ධයෙන් ශ්‍රේෂන් මන්ත්‍රීතුමාට ස්තුතිය පුද කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

මා මේ යෝජනාවට ස්තුති කරන ගමන් අපේ ප්‍රජා මණ්ඩල නිලධාරිතුමිය ඉන්නවා. අපේ කාන්තා කමිටු තිබෙනවා. ඒ හරහා මේ වැඩ සටහන ක්‍රියාත්මක කිරිම ඉතාමත්ම හොඳයි. මොකද කාන්තාවන් අපට මෙයට යොමු කරන්න පුළුවන් නම් හොඳයි. විශේෂයෙන්ම නිවෙස් වල රැඳි සිටින කාන්තාවන් ඉන්නවා. මා විශේෂයෙන්ම කියනවා මේ අම්බලන්ගොඩ ප්‍රදේශයේ භූමිවල ඉඩ පහසුකම් මදියි. එමනිසා පොච්චි ක්‍රමයක් ඒ වගේ පහසුකම් ටිකකුත් ලබා දෙන්න වෙනවා. ඒ වගේ පෝච්චි ටිකක් ලබා දිය යුතුයි. කොම්පොස්ට් පොහොර හදන විදිය උපදෙස් මාලාවක් මෙහි දමා තිබුණා. ඒ ටික සාර්ථක කරගෙන අපේ ප්‍රජා සංවර්ධන නිලධාරිතුමියත් සමඟ අපේ මන්ත්‍රීවරියනුත් ඉන්නවා. මේ වැඩසටහන ක්‍රියාත්මක කරන්න අපට ඔබතුමලාගේ සහායොගයත් ලබා දෙන්න. මොකද අපිට කාන්තා කමිටු කැඳවන්නම බැරි වුණා මේ කොරෝනා වසංගතය නිසා. එමනිසා අපට පහසුවෙන්ම මේ වැඩ සටහන කර ගැනීමට පුළුවන් වෙනවා. මා සිටින නිල නිවාසයේත් අපට අවශ්‍ය කරන කංකුං , ගොටුකොළ, මුකුණුවැන්නා ටිකක් වගා කර තිබෙනවා. බණ්ඩක්කා ටිකක් වගා කර තිබෙනවා. ඒ කරල් තුන හතරක් ගත්තාත් අපිට ඇති. ඇත්තටම එය වැදගත් දෙයක්. ගෙදර සිටින අයට. ගෙදර රැදී ඉන්න කොට මෙය කරන්න පහසුයි. එමනිසා මා අපේ ධම්මික මන්ත්‍රීතුමාට බීජ ගෙනත් දෙන්න. ඔබතුමා ඇපවෙලා , කැපවෙලා කොහොම හරි ඒවා අරගෙන දෙන්න. මොකද අපට අම්බලන්ගොඩ මේක කරන්න පුළුවන්. ශ්‍රේෂන් මන්ත්‍රීතුමා කිවු පරිදි මෙය කාන්තා කමිටු හරහා මෙයට උදවු කර ප්‍රජා මුල සංවිධාන හරහා අපේ නිලධාරි මහත්මිය අපි ඊළඟට මෙය කිරිමට කටයුතු කරන්න. මොකද අපි කාන්තා කමිටු ඊළඟට ආරම්භ කරන්න කටයුතු කරන්න. මෙය ඇත්තටම ක්‍රියාත්මක කරන්න හොඳ වැඩ සටහනකි. ඒ අය දැනුවත් කර සභාවේ උදවු ගෙන මෙය ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා සිටිනවා. අපි අල්ලස් දෙන්නේ නැහැ. ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය ගියාම ප්‍රජා මුල සංවිධාන වල සිටින අය එකතු කර ගත්තාම එය අල්ලසක් වෙන්නේ නැහැනේ. ගමේ කණ්ඩායමේ කට්ටිය තමයි එන්නේ. මෙතැන දේශපාලනය නැහැනේ. ඔක්කොම කාන්තාවන් සහභාගී වෙනවානේ රැස්වීමට. ගරු සභාපතිතුමා එනවා, ගරු උප සභාපතිතුමා එනවා . එතකොට මන්ත්‍රීවරු සියළු දෙනාම සහායෝගය දිලා අපි ගිහින් වවන්න කරන්න එන්නේ නැහැ . ඒ අවශ්‍ය දේවල් ලබා දිලා අවශ්‍ය දේවල් කර ප්‍රජා

සංවර්ධන නිලධාරිතුමිය එනවා. ගම් මට්ටමින් මෙය කරන්න. කාන්තා කමිටුවෙන් අපි මෙය කරනවා. අපි කැමතියි . අපි මේක කරන්නම්. දැනුවත් කළා වෙනවානේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකා මහතා කතා කරමින්</u>

මා කියන්නේ අර පෝච්චි ක්‍රමය වෙනුවට.

<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ඔබතුමා වාඩිවෙන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකා මහතා කතා කරමින්</u>

ඔබතුමාගේ ඔය කතාවට මා විරුද්ධයි. ඔබතුමා ඉස්සෙල්ලාත් කියා මා වාඩි වුණා. රාහුල මන්ත්‍රීතුමා දෙපාරක් කතා කළා. මා කට වහාගෙන හිටියා. හරිද මා ඕකට විරුද්ධයි. ඔබතුමිය මට විතරක් කියන්න එපා.

<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

හරි. දිගින් දිගටම ගරු රාහුල මන්ත්‍රීතුමාට කොහොමත් කියනව මේ වෙලාවක සිද්ධ වෙනවා ඉතින් බලෙන් හරි එළියට දාන්න. ඔය තත්ත්වෙන් ගියොත් එහෙම.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

අපේ පක්ෂෙ අපිට දෙන්නෙ නැහැ අවස්ථාව .ඔබතුමා ගරු රාහුල මන්ත්‍රීතුමාට දෙනවා දෙපාරක්. මම කියන්නෙ අර පෝච්චි වෙනුවට පොලිතින් කවර තියෙනවා.ඒව අරන් කරන්න පුළුවන්. වැඩි වියදමක් යන්නෙ නැහැ. ඕන්නම් සභාවෙන් අරන් බෙදන්නත් පුළුවන්.

<u>ගරු නගර සභා මන්ත්‍රීනී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මම හිතන විදියට අද ලංකාව පත්වෙලා තියෙන තත්ත්වය අනුව ඇත්තෙන්ම කොරෝනා ව්‍යසනයෙන් රටේ ආර්ථික තත්ත්වය අනුව මේ වගේ යෝජනාවක් ගෙනාපු ගරු මන්ත්‍රීතුමාට ඇත්තෙන්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම ඒ බීජ ලබාදීමේදී මම හිතනවා ගරු සභාපතිතුමනි ගුණාත්මක තත්ත්වයේ බීජ ලබාදීමට තමයි කටයුතු කරන්න ඕන. ඒ වගේම මම ඔබතුමාට මේ සභාවට යෝජනා කරනවා මේක හැම නිවසකටම ලැබෙන විදියට කොට්ඨාස දහතුනේම හැම නිවසකටම ලැබෙන විදියට ඒ කියන්නෙ තියෙන අයටද ගන්න පුළුවන් ද බැරිද වැඩක් නැහැ යම්කිසි රුපියල් සීයකටද ඒ බීජ පැකට් එකක මුදල සියලුම දෙනාට ලැබෙන විදියට වැඩපිළිවෙලක් යොදන්න කටයුතු කළොත් හොඳයි. මොකද ගරු මන්ත්‍රීතුමා ගැන කතාකළොත් ගරු මන්ත්‍රීතුමා පහුගිය කාලෙ අභ්‍යාස පොත් ලබාදීමේදී කටයුතු කරපු හින්දා

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමිය අනවාශ්‍ය දේවල් කතා කරන්න එපා. අදාල දේ විතරක් කතා කරන්න.ඔබතුමිය කොයි වෙලාවෙත් කතා කරන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>**

මට කතා කිරීමේ අයිතිය තියෙනවා. මං කියන්නෙ නිවැරදිව ඒ වැරැද්දත් හදාගෙන සියලු දෙනාටම මහජනතාවටම ඇත්තෙන්ම අම්බලන්ගොඩ නගර සීමාවේ සිටින සියලු දෙනාටම බීජ දෙන්න. අභ්‍යාස පොත් දුන්නෙ එහෙම නෙමෙයිනෙ. අන්න ඒක මම කිව්වෙ. මොකද එතුමා ඒ වැරැද්ද හදාගන්න කැමති වුණානම් අනිත් ගරු මන්ත්‍රීවරු ඒකට උඩ පනින්න අවශ්‍ය වෙන්නෙ නැහැ. මොකද ගරු මන්ත්‍රීතුමා පිළිගත්තා ඒකයි. යම් කිසි දෙයක් සිද්ධවුණා කියන එක. මටත් ඕන මොකද ගරු ශ්‍රේෂන් මන්ත්‍රීතුමා ගැන ඔබතුමා මෙන්ම මමත් එතුමත් එක්ක මීට කලිනුත් නගර සභාවෙ කටයුතු කරල තියෙනවා. එතුමාට මම ඇත්තටම උප සභාපතිකමට සභාපතිකමට එතුමා උපාධිධාරී මහත්මයෙක් හින්දා මම හරි කැමැත්තෙන් හිටියා . මොකද අන්න ඒ ප්‍රශ්නෙ උඩ තමයි කරන දේ නිවැරදිව කරන්න අවශ්‍ය හින්දා තමයි මම මේ අවස්ථාවේ ඒ දේ කිව්වේ. මොකද මේක කිසිම පක්ෂ භේදයක් නැහැ මේ ව්‍යසනයේදී ඇත්තෙන්ම ඉස්සරහට අපේ රට ආර්ථික වශයෙන් සෑහෙන ප්‍රශ්නවලට මුහුණ දෙනවා. ඒ නිසා ඇත්තෙන්ම ගෙවතු වගාවෙන් අපි යම්කිසි අපේ ආර්ථිකය ශක්තිමත් කරන්න හවුල්වෙලා රජයට සහයෝගයක් ලබාදෙනව නම් ඒක තමයි අපෙන් විය යුත්තේ. ඒ සඳහා මම හිතන්නෙ නගර සභාව මගින් සුළුවෙන් හෝ අපේ ප්‍රජා මූල සමිතිය හරහා අපට පුළුවන් හැම කොට්ඨාසයකටම අපේ නිලධාරීතුමිට සම්බන්ධ කරගෙන ඒ වැඩ පිළිවෙල කරන්න. ඒ හින්ද මම ඒ සියලුම දෙනාට සියලුම මහජනතාවට ඒ බීජ කට්ටලය ලබාදීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

වාඩිවෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,මට වචනයක් කතා කරන්න ඉඩ දෙන්නකො. දෙපාර දීල තියෙනව අනන්තවත්. ඔබතුමා හරි වැරදියිනෙ. ඔබතුමා එහෙම කරන්න එපා.

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මෙහෙම සභාව ගෙනියන්න බැහැ නැත්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී  මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

මට වචනයක් කියන්න දෙන්න. ඔබතුමා එහෙම කරන්න එපා. එහෙමනම් ඔබතුමා හැමෝටම කියන්න ඕනනෙ එහෙනම්. මට කියන්න තියෙන්නෙ මෙච්චරයි. ගරු නිලානි මන්ත්‍රීතුමිය උදාහරණයක් දුන්නෙ බීජ සම්බන්ධව  පොත් සම්බන්ධව. උදාහරණයක් ගන්න බැරිද කතාවකදි.හැබැයි ඔබතුමා මේකයි අවස්ථා දෙකක් කාටවත් දෙන්න බැහැ. එච්චරයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී  ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි මං හිතන්නෙ අපේ ගරු ශ්‍රේෂන් මන්ත්‍රීතුමා මේ සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව වත්මන් ආණ්ඩුවේ සංකල්පය ඇත්තටම මේ අවස්ථාවෙ හැටියට රජය රටක් අසීරුතාවයට පත්වෙලා තියෙන අවස්ථාවක අපි ගෙවතු වගාව යටතේ හෝ එළවළු පලතුරු ටික ගම් මට්ටමින් මිනිස්සුන්ට වගා කරගන්න පුළුවන්නම් ඒ ආර්ථිකයට විශාල ශක්තියක් වෙන බව තමයි ආණ්ඩුවේ මතය. ඒ මතය අනුව සෞභාග්‍ය වැඩසටහන ක්‍රියාත්මක වෙද්දි මේ ගරු මන්ත්‍රීතුමා විසින් කරන ලද යෝජනාව ඉතාමත්ම කාලෝචිතයි. ඒකට පැහැදිලි හේතුවක් මම දකිනවා. ආණ්ඩුවක් විසින් ඒ යෝජනාව කරනු ලැබුවත් අර පහුගිය කාල වකවානුවට බීජ වර්ග හෝ පැළ වර්ග කිසිම ගැමියෙකුට කිසිම කෙනෙකුට ගන්න තැනක් තිබුණෙ නැහැ. දැනටත් නැහැ. ඒක නිසා මෙතුමා කරන ලද යෝජනාවට අනුව මා දන්නා තරමින් කෘෂිකර්ම පර්යේෂණ නිලධාරීන්ගෙන් අසා දැනගත යුතුව තිබෙනවා බීජ වර්ග දෙකොටසක් තිබෙනවා. එකක් හයිබ්‍රීඩ් එක. අනෙක සාමාන්‍ය එක. එතකොට මේ ගෙවතු වගාවට සූදානම් වෙන අපේ ගෙවල්වල අය සාමාන්‍ය බීජ වැව්වහම සමහරවිට කුප්පමේනියා වෙන්නත් පුළුවන් පැළ වෙන්නෙ. ඒ වගේ. එතකොට ඒක අසාර්ථක වෙනවා. ඒ නිසා අපි දෙනවනම් දිය යුත්තේ හයිබ්‍රීඩ් ඇට. ඒ ඇට හැබැයි කිලෝ එකක් රුපියල් හයදාහක් හත්දාහක් වෙයි. එතකොට අපි කල්පනා කරන්න ඕන. කොපමණ ප්‍රමාණයක් මොන ක්‍රමවේදයට මේක බෙදල දෙනවද කියන එක. අනිත් එක සියලුම ගරු මන්ත්‍රීවරු හරහා මේක බෙදුවත් අනිවාර්යයෙන්ම කෘෂි කාර්මික පර්යේෂණ සහායිකාවන් යටතේ මේක කළ යුතුයි කියන මතේ මම ඉන්නවා ගරු සභාපතිතුමනි. ඒක නිසා අපි සභාවක් විදියට මුදල් වියදම් කරල කරනවනම් මේක හොඳයි කියන මතේ මම ඉන්නවා ගරු ශ්‍රේෂන් මන්ත්‍රීතුමාගේ යෝජනාව යටතේ. ඒ වගේම හයිබ්‍රීඩ් වර්ගයේ බීජ ඇට 05 ක් හෝ එක ගෙදරකට ලබාදීම හොඳයි කියන මතෙත් මම ඉන්නවා.මොකද මම එහෙම කියන්නෙ මේ යෝජනාවට අනුවත් මම වුණත් වගාවට බොහොම ප්‍රියකරන පුද්ගලයෙක්. ගෙදර තියෙනවා මල් පෝච්චි සිය ගණනක්. බොහොම අමාරුවෙන් තමයි කාන්තා පක්ෂයෙන් මේක ජය අරගෙන වවන්න අවසරය ගත්තෙ. නමුත් බීජ නැහැ. කෘෂිකර්ම නිලධාරිතුමිය මට මිරිස් පැළ 05 ක් ගෙනත් දුන්නා. ඒක දවස් දෙකෙන් මැරිල ගියා. එතකොට අර හයිබ්‍රීඩ් ඇට වර්ග එහෙම නැහැ. ඒක ටිකක් සාර්ථක ක්‍රමයක්. එතකොට උත්සාහයක් ඇති වෙනව අපේ අයට මේ ගෙවතු වගාව කරන්න. ඉතින් ඒක නිසා ඒ අදාල නිලධාරීන්ගෙන් උපදෙස් අරගෙන අපට කරන්න පුළුවන්. ඒ වගේම සෑම කොට්ඨාසයකම තිබෙනවා ප්‍රජා මණ්ඩලයක්. මේ ප්‍රජා මණ්ඩල හැම එකකම මුදල් තිබෙනවා. කිලෝ දෙකක් වගේ ගන්න රුපියල් දහ දොළොස් දාහක් වියදම් කරන්න පුළුවන් ප්‍රජා මණ්ඩලයකට. නගර සභාව ලක්ෂ ගාණක් වියදම් කරනවට වඩා සෑම ප්‍රජා මණ්ඩලයකටම අනුමැතිය දුන්නනම් බීජ මිලදී ගැනීම සඳහා කිලෝ දෙකකට. ඒක විශාල සේවයක් වෙනවා.ප්‍රජා මණ්ඩලෙය්  මිස්ට

තියෙනවනම් ඒකට ව්‍යවස්ථාවේ අවසර නැහැ කියලා අපි ගරු ආණ්ඩුකාරතුමාගෙන් හරි ඒ අවසරය ලබා දෙන්න කියන යෝජනාව මම කරනවා ගරු සභාපතිතුමනි. අපේ ගරු ශ්‍රේෂන් මන්ත්‍රීතුමාගෙ යෝජනාව ඉතාමත්ම කාලෝචිතයි කියන මතයේ ඉඳගෙන .

<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි ගරු ශ්‍රේෂන් මන්ත්‍රීතුමා විසින් කරන ලද යෝජනාව ඉතාම වටිනා යෝජනාවක්. මමත් මේ කාලෙ තුළ නෙමේ කලින් ඉඳලම හිටවනවා වගා කරනවා. ඉතින් ඇත්ත වශයෙන්ම දැන් අර ගරු සරත් මන්ත්‍රීතුමා කිව්ව ආකාරයට හයිබ්‍රීඩ් බීජ තමයි ඇත්තටම හොඳ. මොකද මම පහුගිය කාලෙ ඉබේ පැළ වුණා තක්කාලි ගහක්. එකෙන් තක්කාලි ගෙඩි 40 ක් 50 ක් විතර කැඩුවා. නමුත් කඩෙන් රු.20/- පැකට් එකක් ගෙනැල්ල හිටෙව්වා.දැන් තක්කාලි ගස් ගොඩක් ලොකුවෙලා. නමුත් මල් එනවා. ගෙඩි එන්නෙ නැහැ. ඒ රු.20/- ට තියෙන පැකට් ඇත්තටම ඉතාමත්ම බාල සහිතයි. ඇත්ත වශයෙන්ම ඒ හයිබ්‍රීඩ් බීජ ගෙනැල්ල දෙනවනම් විශාල මුදලක් යනව මං හිතන්නෙ. මං කියන්නෙ එහෙම මුදලක් දීල හොඳ වර්ගයේ බීජ ගෙනැල්ල දෙනකොට නොමිලේ දෙන එකෙන් මං හිතන්නෙ ඒක වෙන්නෙ නැහැ. මොකද මේ මාස තුන හතරෙදි ගෙදරට වෙලා ඉන්න රජයේ සේවකයන් නොයෙක් ආකාරයේ ආයතනවල වැඩ කරන අය නිකන් ගෙදර ඉන්න නිසා වවනවා. නමුත් රැකියාවට යන්න පටන් ගත්තට පස්සෙ ඕව වල් බිහිවෙලා සාත්තු කරන්නෙ නැහැ. නිකන් විනාශ වෙලා යනවා. ඒක නිසා මේ බීජ වැඩි මුදලක් දීල ගෙන්නනවා නම් මං හිතන්නේ යම් කිසි මුදලකට සහන මුදලකට අඩුගානෙ යන මුදලටම ලබාගෙන නිකුත් කරනවනම් හොඳයි. වටිනාකමකුත් තියෙනවා. එතකොට හොඳට ආරක්ෂා සහිතව කටයුතු කරනවා. මම එහෙම යෝජනාවක් කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මැදිහත් මතධාරී ගරු සරත් මැතිතුමා කිව්වා මෙම වැඩසටහන දේශපාලනීකරණය වුවහොත් අපේක්ෂිතාර්ථ ඉටු නොවන බව. අපි එකඟයි. ගරු මන්ත්‍රීතුමනි අපි මෙයින් අදහස් කළේ නැහැ දේශපාලනයක් කිරීමට. මොකද වර්තමාන අවශ්‍යතාවයට අනුව එම බීජ සම්පාදනය අපි එයින් අදහස් කළේ. මෙහිදී කෘෂිකර්ම පර්යේෂණ නිලධාරී තැනගේ දායකත්වයත් ලබාගෙන අපි මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී අපට මහජන නියෝජිතයින්ටත් මහජනතාව සමග සුහදත්වය වැඩිවර්ධනය කරගැනීමටත් ඇති කරගන්න පුළුවන් කියල අපි විශ්වාස කරනවා. ඒ වගේම මෙහිදී හයිබ්‍රීඩ් බීජම අවශ්‍ය නැහැ. යම් සංයුතියක් පමණක් තිබෙනවා නම් පමණක් හොඳයි අපේ ගරු සරත් මැතිතුමා කියන විදියට. ලබුදූව, ගන්නෝරුව ආදී අපේ මධ්‍යස්ථානවල මෙම ඇට වර්ග තිබෙනවා. ඒ වගේම ඒවයෙ හිඟ කමක් තිබෙන බව ආරංචියි. අපේ ගරු කොඩිකාර මැතිතුමාගෙ උපදෙස් අනුව ඉක්මනින්ම මෙය ක්‍රියාවට නැංවීමයි අවශ්‍ය වන්නේ. ගරු සභාපතිතුමනි ගරු මන්ත්‍රීවරුන් ඔබලා සියලු දෙනාගේම අපට අවධානය ලැබුණා. කාගෙ අවධානය ලැබුණත් අපේ විධායක නායකත්වයේ අවධානය නොවන්නට අපිට මේ යෝජනාවත් කුණු කූඩයට දමන්නට වෙනවා. ඒ නිසා අප තරයේ මේ යෝජනාව මෙම උදාවන මාසය තුළම ක්‍රියාවට නැංවීමට ඔබලාට දිරිය ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු ශ්‍රේෂන් මන්ත්‍රීතුමාගෙ යෝජනාව ඉතාමත්ම කාලෝචිත හොඳ යෝජනාවක්. හැබැයි ක්‍රියාත්මක කිරීමේදී අපි අද සභාව තියෙන තත්ත්වය ඉතාමත්ම ආර්ථික මට්ටමින් ඉතාමත් පහත් තත්ත්වෙක තමයි සභාව තියෙන්නෙ. ගරු සරත් මන්ත්‍රීතුමා කිව්ව වගේ දේශපාලනීකරණය එතුමා ඉන්න දේශපාලන පක්ෂය අනුව තමයි එතුමා ඒ ප්‍රකාශ කිරීම් කරන්නෙ. නමුත් මේ සභාවෙ ඉන්න ගරු මන්ත්‍රීවරු මං හිතන්නෙ රු.5000/- දීමේදි කවුරුවත් දේශපාලනය ගාගෙන වැඩ කරේ නැහැ. සියලු දෙනාට රු.5000/- ලබාදීමට කටයුතු කළා. එතුමත් සහභාගි වුණා ඒ කොට්ඨාස දෙකේම ඒ රු.5000/- ලබාදීමේදි. ඒ නිසා ඒක දේශපාලනය කියන එකට අපි විරුද්ධයි. මේ වැඩසටහනේදි ඇත්තටම ගෙවතු වැඩසටහන කිරීමේදී ගරු මන්ත්‍රීවරු සියලු දෙනාම මේකට එකඟයි. හැබැයි ක්‍රියාත්මක කිරීමේදී සභාව අද තියෙන තත්ත්වය මොකද ඔබතුමාල දන්නවා පහුගිය මාස දෙකක්ම අපට කිසිම ආදායමක් තිබුණෙ නැති සභාවක් බවට පත්වුණා. ඉතින් ඒ නිසා ක්‍රියාත්මක කිරීමේදී මං හිතන්නෙ තමුන්නාන්සේලා මොකක්ද මේ සභාවට ගන්න කියන ක්‍රියාමාර්ගය. එක්කො බීජ ගෙනැල්ලා ජනතාවට ලබාදීමට කටයුතු කරනවද ? නැත්නම් එක් කොට්ඨාසයකට යම් කිසි මුදලක් වෙන්කරනවද කියන එක මං විමසා සිටිනවා. අපි මේක ක්‍රියාත්මක කරනවනම් බීජ කොහෙන්හරි අපි සභාව මගින් ගෙන්නගෙන ජනතාවට බෙදා දෙනවද නැත්නම් කොට්ඨාස මට්ටමකට යම්කිසි මුදලක් වෙන්කරල අපේ ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය මොකක්ද ඒකට ගන්න පුළුවන් ක්‍රියාමාර්ගය. මෙහෙම කරන්න ගරු සභාපතිතුමා කලින් කිව්වා සල්ලි නැති ප්‍රජා මණ්ඩලවලට යම්කිසි මුදලක් දෙන්න කිව්වා යම් කර්මාන්තයක් කරාම අඩුකරගන්න. ඒ නිසා ප්‍රජා මණ්ඩලයකින් රු.10,000/- ගානෙ අරගෙන අර රු.10,000/- ත් යම්කිසි කොන්ත්‍රාත්තුවක් දීල අයකර ගන්න පුළුවන් විදියට එතකොට කොට්ඨාස දහතුනේම ප්‍රජා මණ්ඩල දහතුනෙන්ම රු.10,000/- ගානෙ රු.130000/- ක් අරගෙන ඒ බීජ ලබාගෙන මේ යෝජනාව ක්‍රියාත්මක කරන්නට කටයුතු කරන්න සභාව එකඟයි. රු.130000/- ක් එකතු වෙනවා.මං යෝජනාව ගේනවා. ප්‍රජා මණ්ඩලයෙන් ගන්න පුළුවන්නෙ සල්ලි එතකොට ගැටලුවක් නැහැනෙ ඔබතුමිය කතා කරල ඒකට යන මුදල ගන්න. හරි එහෙනම් මෙහෙම කරන්නකො සභාව සම්මත කරනවා. ප්‍රජා මණ්ඩලය අරගෙන කරන්න. ඊට පස්සෙ ඔබතුමිය ඒක ටෙන්ඩර් කැඳවල ටෙන්ඩර් කමිටුවට ඉදිරිපත් කරල ඉතා ඉක්මනින් ඒ කටයුත්ත කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

මෙන්න මෙහෙමයි ඕක කරන්න ඕන.

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා තීන්දුව දීල ඉවරයි දැන්. වාඩිවෙන්න. හැමෝටම එකවගේ තමයි සලකන්නෙ. ගරු රාහුල මන්ත්‍රීතුමාට ගොඩක් දීල කියල තමයි කතා වුණේ. ගරු සරත් මන්ත්‍රීතුමා විශේෂ සභා යෝජනාවක් දීල තියෙනවා. ඉදිරිපත් කරන්න.

**තීරණය -**

සෑම කොට්ඨාසයකම ගෙවතුවලට වගා බීජ කට්ටල සපයා දී රජයේ වගා වැඩසටහන ප්‍රවර්ධනයට අනුබල ලබාදීම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් කළ යෝජනාව අනුව ප්‍රජා මණ්ඩලවල මුදලින් (මුදල් නොමැති ප්‍රජා මණ්ඩල සඳහා කර්මාන්තයක් කළ පසු එම මුදල් අඩුකරගැනීමේ පොරොන්දුව මත) ප්‍රජා මණ්ඩල මගින්ම එම යෝජනාව ක්‍රියාත්මක කිරීමට අනුමත කිරීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් තීරණය කරන ලදී.

**05.03.** **ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.03.01** **අම්බලන්ගොඩ නගර සභාවට ගිනි නිවන රථ සේවාවක් ලබා දෙන රජයෙන් හෝ පළාත් සභාවෙන් ඉල්ලා සිටින ලෙස කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>**ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, නාගරික මන්ත්‍රී ගංහේ සරත් ශ්‍රී ලාල් ද සිල්වා වන මා විසින් ඉදිරිපත් කරන යෝජනාවයි. අම්බලන්ගොඩ නගර සභාවට ගිනි නිවන රථ සේවාවක් ලබාගැනීමට රජයෙන් හෝ පළාත් සභාවෙන් ඉල්ලා සිටින ලෙස කරනු ලබන යෝජනාවයි. පහුගිය කාල වකවානුව බැලුවත් ඒක ඉතාමත් දැඩිලෙස අත්‍යාවශ්‍ය බව දැනුණා. ඉතින් අම්බලන්ගොඩ නගර සභාව කියන්නෙ කලුතරයි ගාල්ලයි ඇරුණම අම්බලන්ගොඩ තමයි ප්‍රධාන නගරය. සියලුම තැන් ඒකරාශි වෙලා පරිපාලන දිස්ත්‍රික්කය වාණිජ නගරය, ආර්ථිකමය නගරය අම්බලන්ගොඩ නගරය. එතකොට ඉතාමත්ම කණගාටු වෙනවා අපි අද තියෙන තත්ත්වය ගිනි නිවන රථයක් අම්බලන්ගොඩ නගර සභාව සතුව නැහැ. ගින්නක් හට ගත්තොත් එක්කො ගාල්ලෙන් එන්න ඕන නැත්නම් කලුතරින් එන්න ඕන. සාමාන්‍යයෙන් පහුගිය කාල වකවාණුවේ ඇති වූ ගිනි ඉතා ඉක්මනින් නිවා ගැනීමට පුළුවන්කම තිබුණත් මර්මස්ථානයකට ගිනි අල්ලලා ඉතා ලොකු ගින්නක් ඇති වුණානම් අනිවාර්යයෙන්ම දවස් දෙක තුනක් ඉතා විශාල විනාශයක් සිද්ධ වෙන්න ඉඩ තිබුණා. ඒක නිසා අම්බලන්ගොඩ වගේ නගරෙකට ගිනි නිවන රථ සේවාවක අවශ්‍යතාවය දැඩි ලෙස දැනෙනවා. ඒක නිසා මං මේ යෝජනාව සභාවට ඉදිරිපත් කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි , අපේ සරත් මන්ත්‍රීතුමා විසින් ගෙන ආ යෝජනාව ඉතාමත් වටිනවා. මොකද පහුගිය දවසක මහවීදියෙ කඩයක් ගිනිගත්තා. ඒක පැතිරුණානම් මං හිතන්නෙ ඒ පැත්තෙ තියෙන සියලුම කඩ ගිනිගන්නවා. රාත්‍රී 1.00 ට විතර තමයි ගිනි ගැනීම් සිද්ධ වුණේ. ඒ අවස්ථාව වෙනකොට අපට ආසන්නව තියෙන ගාල්ල මහ නගර සභාවෙ ගිනි නිවන අංශයට කතා කරල එම වාහනය එනකොට පැය දෙකක් තුනක් විතර පරක්කු වුණා. ඒ අවස්ථාවේ කඩේ ¾ ක් විතර ගිනි අරගෙන තිබුණේ. අපේ නගර සභාවේ සේවක මහත්ම මහත්මීන් රියදුරු මහත්වරු සෑහෙන පරිශ්‍රමයක් දරල තමයි ඒක නිවුවේ. ඒ වගේ ගිනි නිවන යන්ත්‍රයක් ඇත්තටම අම්බලන්ගොඩට

අත්‍යාවශයයි. මොකද මේ අහල පහලටම එම වගේ සේවාවක් කිරීම සඳහා කිසිම පහසුකමක් නැහැ. මොකද ඒ ගාල්ලෙන් එම ගිනි නිවන යන්ත්‍ර ටික එනකොට පැය දෙකක් විතර ගියා. ඒවගේම එතන හිටපු තව මහත්මයෙක් අම්බලන්ගොඩ ඉපදිච්ච ධර්මාශෝක ඉස්කෝලෙට ගිය අපේ නාවික හමුදාපති පියල් මහත්තයටත් කතා කරා. එතුමාට විශේෂ ස්තූතියක් කරන්න ඕන. නාවික හමුදාවේ ගිනි නිවන රථත් ඒ එක්කම වගේ ආවා. එතුමන්ලත් ඇවිල්ල අපේ හමුදාවෙ අය තමයි ඇත්තටම සෑහෙන වැඩ කොටසක් කරා එතුමන්ල. එතුමටත් ස්තූති කරන ගමන්ම මේ කර්තව්‍ය කරන්න මං හිතන්නෙ සෑහෙන සේවක පිරිසක් අවශ්‍ය වෙනවා. ඒ නිසා මාගේ නම් තියෙන අදහස ගරු සභාපතිතුමනි අර අපේ බස් නැවතුම්පොල ළඟ තියෙනව මීටර් සීයෙන් සීයට වගේ වතුර නල. අන්න ඒ වගේ ටිකක් හන්දිවලට හරි හයිකරල මීටර් සීයෙන් සීයට වගේ. ඒකට හරියන බට අරගෙන ඒ බඩු ටික නගර සභාවෙ තියාගත්තනම් අපට ටිකක් මේක මැඩ පවත්වා ගන්න පුළුවන්. ඒ නිසා මං යෝජනා කරනවා අර වගේ කර්තව්‍යකට වඩා හොඳයි අපට වතුර නල ටිකක් එලාගන්න පුළුවන්නම් ජල සම්පාදනෙත් අවසර ඇතිව. මොකද ඒක අත්‍යාවශ්‍ය දෙයක් නගරයේ ගින්නක් ඇතිවුනොත් සමහරවිට අපිටත් දෝෂාරෝපණය එනවා. මං හිතන්නෙ දවස් තුනක් හෝ හතරක් නිව්වා අපි මේ නගර සභාවෙන් ගිහිල්ලා. මුල් දවසෙ නිවල ගියාම ඊට පහුවෙනිදත් ගිනිගත්තා. ඒකත් නිවල ඊට පස්සෙ දවස් හතරක් විතර ගිනිගත්තා. එතුමාගේ යෝජනාව හරි යෝජනාවක්. අපට ඒ තත්ත්වය ලබාග්න බැරිනම් වතුර වැඩේට යමු කියල මං යෝජනා කරනවා ගරු සභාපතිතුමනි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, වෙළඳ නගරයක් ලෙස අම්බලන්ගොඩට ලැබී ඇත්තේ ප්‍රමුඛස්ථානයක්. එදා ආසන්න දවසෙදි ඇති වූ ගින්න අපි අනාගත ආපදාවකින් මුදවා ගැනීමේ පෙර ලකුණක් හැටියට මම දකිනවා. අපේ ගරු මන්ත්‍රීතුමා ඒ ගැන අවධානය යොමලා මෙම ගිනි නිවීමේ යම්කිසි ඒකකයක් පිහිටුවන ලෙසට යෝජනා කරද්දි අපි ඊට අනුමැතිය අපේ එකඟතාවය මේ අවස්ථාවෙදි එලකරන අතරම වර්තමාන ආපදා කළමනාකරණ අමාත්‍යාංශයක් තිබුණත් මම හිතනවා අපේ ප්‍රදේශවල ඉන් නිසි ප්‍රයෝජනයක් ඉටුවනවාදෝ කියන එක සැකයි. පසුගියදා අපට මතකයි. තල්ගස්ගොඩ වෙල්යාය ගිනිගත්තා. ඒ අවස්ථාවේ ඒ ගින්න නිවන්නට ගාල්ල නගර සභාවේ ගිනි නිවන යන්ත්‍ර දෙකක් පැමිණියා. නමුත් හදිසියකට බෝට්ටුවක්කත් අපට නෑ එවැනි තැනකට ලංවෙන්න වෙලක් මැද්දට. ඒ නිසා ගරු සභාපතිතුමනි මෙවැනි ආපදා කොතැනක කිනම් වෙලාවක ඇතිවෙනවාදෝයි කියල කියන්න අමාරුයි. ඒ නිසා අපට ඒ අවශ්‍ය සම්පත් සංචිතය ගිනි නිවීමේ ඒකකය ඒ වාගේම තටාකයත් තරණය කරන්න අවශ්‍ය ඒ බෝට්ටු එවැනි දේ තිබිය යුතුමයි. මේ අවස්ථාවේ අපේ ගරු ජගත් මන්ත්‍රීතුමා කියන විදියට එම නල පද්ධතියක් හෝ වෙනත් රථවාහන ක්‍රමවේදයකට හෝ එම ගිනි නිවීමේ ඒකකයක් පිහිටුවීම සඳහා අදාල අංශ දැනුවත් කළ යුතුයි කියන අදහසට අපිත් එකඟ වෙමින් එතුමාට තුති එලකරමින් නවතිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු සරත් ශ්‍රී ලාල් මන්ත්‍රීතුමා යෝජනා කළ යෝජනාව ඉතාමත්ම කාලෝචිතයි.මොකද විපතක් වෙනකොට කරදරයක් වෙනකොට මොන මොහොතෙ මොන වෙලාවෙ වෙනවද කියන්න බැහැ. ව්‍යපාරිකයොත් මේකෙ ඉන්නවා. කාගෙහරි ව්‍යාපාරයක් අහිමි

වුණොත් ඒක මුළු අම්බලන්ගොඩටම අහිමිවීමක් වෙනවා. මොකද බොහොම දුක් මහන්සියෙන් තමයි ව්‍යාපාරයක් ආරම්භ කර ගන්නෙ. ඒක අපි නොසිතන ආකාරයට ගිනි අරගෙන ගිනිබත් වුණාට පස්සෙ මුළු අම්බලන්ගොඩටම ඒ වෙනුවෙන් අඩා වැටෙන්න වෙනවා. එක පුද්ගලයෙකුටනම් හානිය වෙන්නෙ අපි සමස්ත ජනතාවම දුක් විඳින්න වෙනව අම්බලන්ගොඩ. ඒ නිසා මම ගරු උප සභාපතිතුමනි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා මේක වැදගත් යෝජනාවක්. මොකද සභාව සතුව ඒ වගේ දෙයක් තියෙන්න ඕන. හදිසි කරදරයක් වුණාම ගාල්ලට නතා කරල නාවික හමුදාවට කතා කරල කලුතරට කතා කරල ඒ අවශ්‍ය උපකරණ මෙහෙට එනකොට ගිනි නිවන හමුදාව මෙහෙට එනකොට මෙහෙ වෙන්න ඕන ඔක්කොමෙ වෙලා ඉවරයි. ඉතාමත් යහපත් දෙයක්. මුදල් අඩුවෙන්න පුළුවන් මෙය සභාවට කරන්න. නමුත් ගරු ආණ්ඩුකාරතුමාට කතා කරලා හරි එන මුදල් ලබා ගෙන හරි විශේෂ අවශ්‍යතාවයක් කියා ඒ එන මුදල් ලබාගෙන මෙහි වැදගත්කම පෙන්වා දුන් පසු ගරු ආණ්ඩුකාරතුමා අපට එන මුදල් ටික හරි ලබා දෙයි. ඒ ටික ලබාගෙන හරි මෙය ලැබීමට කටයුතු සලස්වන්න. මෙය මුළු අම්බලන්ගොඩ ජනතාවටම කරන මෙහෙවරක්. අද අම්බලන්ගොඩ නගර සභාවට විතරක් නෙමේ අපේ අම්බලන්ගොඩ යාබද ප්‍රාදේශිය සභාවටත් මේ දේ නැහැ. ඒ අය කතා කරන්නේත් ගරු සභාපතිතුමාට මෙහෙට. ගරු මන්ත්‍රිවරුන්ට. අම්බලන්ගොඩ ආසනය අනතුරක් සිදු වෙනවා නම් ඒක මුළු නගරයටම බලපානවා. එමනිසා අපේ අසල්වැසි ආසන වලටත් නැහැ. බලපිටිය රත්ගම වගේ ආසන වලටත් නැහැ. නගර සභාවක් වශයෙන් කිර්තියක් ලබාගෙන ගරු නම්බු නාම ලබාගෙන මේ නගර සභාවේ විපතක් වුණොත් එය නිවන හමුදා ඒකකයක් නැති වුණොත් එහෙම අපේ ලොකු අඩුවක් වෙනවා. එමනිසා පුළුවන්තරම් බලා පුළුවන් තරම් ඉක්මනට මෙය ලබා ගැනීමට කටයුතු සලසා ගන්න. එමනිසා එය තිබෙනවා නම් ඉතාමත් හොඳයි. එතුමා ගෙන ආ යෝජනාව ඉතාමත් හොඳ යෝජනාවක්. එතුමාට විශේෂ ස්තුතිය පුද කරනවා. මොකද එතුමත් ව්‍යාපාරිකයෙක්. මොකද එතුමා දන්නවා ව්‍යාපාරයක් වැටුණාම ව්‍යාපාරිකයා වැටෙනවාද කියා. නැගිට ගන්න බැරුව කොච්චර උත්සාහයක් ගන්නවාද කියා. එමනිසා තමයි ඔබතුමා මේ වගේ යෝජනාවක් කර ඇත්තේ. මා විපක්ෂයේ මන්ත්‍රිවරියක් වශයෙන් මෙය ඉතාමත්ම වැදගත් දෙයක් ලෙස මා කියා සිටිනවා. එය ඉටු කිරිමට ඉක්මනින්ම අවශ්‍ය කටයුතු සලසා ගන්න කියා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේ සරත් ශ්‍රී ලාල් මන්ත්‍රිතුමා ගෙන ආ යෝජනාව ඉතාමත් කලෝචිත යෝජනාවකි. ඒ සඳහා අපගේ සහායෝගය එම කර්තව්‍යයට ලබා දෙනවා. මොකද ගාල්ලේ තමයි එම ගිනි නිවීමේ ඒකකය තිබෙන්නේ. හැබැයි මෙය විශාල ජාලයක්. මොකද උපකරණද , වාහනද , සේවකයන්ද අවශ්‍යයි. ආණ්ඩුවේ ආධාර තමයි ලබා ගන්න වෙන්නේ. එහෙම නැතිනම් ජාත්‍යාන්තර සංවිධාන වලින් ලබා ගැනීමේ හැකියාව තිබෙනවා. ඔබතුමලාගේ රජය. මේ සඳහා පළාත් පාලන අමාත්‍යාංශය හරහා මොනවා හරි ලබා ගැනිමට හැකිවෙයි. එය ස්ථාපනය කරන්න. දැන් පසුගිය දිනවලත් කරදරයක් වුණා. ගම්පහ ඉලෙක්ට්‍රිකල් ආයතනය ගිනි ගත්තා. මා හිතන්නේ ගාල්ලෙන් එනවිට පිච්චිලා ඉවරයි. මේක අත්‍යවශ්‍ය වු කාර්යයක් අම්බලන්ගොඩ නගර සභාවට . මොකද නගර සභාව කියන්නේ නගර සභා , ප්‍රාදේශිය සභා අවරණය කරන ප්‍රදේශයක්. ගාල්ල නගරය හැරුණාම ගිනි නිවන ඒකකයක් අම්බලන්ගොඩ නගරයේ ඇති කිරිමට ඔබතුමාට සහායෝගය දෙන අතර මෙය යෝජනාවක් නෙමේ . ක්‍රියාත්මක කිරිමට

කටයුතු කිරිම තමයි වැදගත් වෙන්නේ. එමනිසා ඔබතුමා උනාන්දු වෙන්න. උනාන්දු වෙලා පළාත් පාලනයෙන් හරි මෙය ලබා ගන්න. ඔබතුමාගේ සම්බන්ධකම් අනුව මෙය ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න. නැතිනම් මෙය යෝජනාවක් වශයෙන් ක්‍රියාත්මක කරන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු සරත් ශ්‍රී ලාල් මන්ත්‍රිතුමා ගෙන ආ යෝජනාව ඉතාමත් වටිනවා. මොකද පසුගිය දිනවල අම්බලන්ගොඩ නගරයේ කඩවල් තුනක් ඒ කියන්නේ ගම්පහ එකට තමයි විශාල වශයෙන් විනාශ වෙලා ගියේ. අපට බඩු ගන්න තිබුණ ස්ථානයක් අපට නැති වුණා. ඉතිං එහෙම යනකොට දිගින් දිගටම මේ වගේ දේවල් සිද්ධ වුණොත් අපේ නගරය ඉතාමත්ම කනගාටු දායක තත්ත්වයට පත්වෙනවා. නගරයේ කඩ සාප්පු විතරක් නෙමේ නිවසක් ගිනි ගත්තාත් අපට මේ වගේ දෙයක් කරගතහොත් අපට ලොකු ප්‍රයෝජනයක් වෙනවා. ගාල්ලෙන් කලුතරින් යනකොට ගොඩක් වෙලා යනවා. අපේ අම්බලන්ගොඩ නගර සභාවට මේ වගේ දෙයක් තිබෙනවා නම් අපට ඉතා ඉක්මනින් ක්‍රියාත්මක වෙලා ඒ වැඩ කටයුත්ත සාර්ථක කර ගැනීමට හැකියාව තිනෙවා. එමනිසා මේ යෝජනාව ඉතාමත් හොඳ යෝජනාවක් හැටියට මා දකිනවා. මේ යෝජනාව හොඳයි කියා මා මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, සරත් මන්ත්‍රිතුමා ගෙන ආ යෝජනාව බොහොම හොඳ යෝජනාවකි. මේ වගේ දෙයක් සිද්ධ වුණාම තමයි අම්බලන්ගොඩ ව්‍යාපාරිකයෝ ඇහැරි සිටින්නේ. මොකද මාසයක් විතර යනවිට මේවා අමතක වි යනවා. අම්බලන්ගොඩට සරත් මන්ත්‍රිතුමා කිවුවා ගිනි නිවන රථයක් ලබා ගැනිම. එක හොඳයි. නමුත් නඩත්තු කරන්න සේවකයෝ 40ක පමණ අවශ්‍යතාවයක් වෙනවා. ඒවාට පඩි ගෙවන්න අම්බලන්ගොඩ නගර සභාවට වත්කම් තිබෙනවාද කියා. 30ක් 40ක් විතර ඉන්නවා සේවකයෝ . රථය ගෙනවිත් තියාගෙන සිටිය හැකියි. පඩි ගෙවන එක තමයි ප්‍රශ්නය වෙන්නේ. එතකොට ඒකට වෙනම හදන්න වෙනවා. එතකොට ඒ අයට වෙනම ස්ථාන දෙන්න වෙනවා. ඒ වගේ දේවල් තිබෙනවා. නමුත් ඔය බස්නැවතුම්පොළේ දමා තිබෙනවා ගිනි නිවන බට වගයක් . ඒවා එකක් වත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. බස්නැවතුම්පොළේත් ගිනි ගත්තාම තමයි ඕක මතක් වෙන්නේ. ඔතන වැඩ කරන්නේ නැහැ කියා. ඉතිං කඩයක් ගිනි ගන්න ඕන. එහෙම ගිනි ගත්තාම තමයි හැමෝටම මතක් වෙන්නේ. දැන් එහෙම බට තිබෙනවා. දැන් ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒවා පොඩ්ඩක් බලවන්න. ජලසම්පාදන මණ්ඩලයට කියා. ඒවා එකක්වත් වැඩ කරන්නේ නැහැ. බස්නැවතුම්පොළේ ව්‍යාපාරිකයෝ කිවුවා ඒවා වැඩ කරන්නේ නැහැ කියා. වතුර ගන්න හැම කඩයක් ගාවම දමා තිබෙනවාලු. ඒවාට බට ටික ගන්න කියා මා යෝජනා කරනවා. මොකද සවිකරන්න පුළුවන්නේ ඕන වෙලාවක. පාරේන් එන වතුර පාරනේ. මීටර් 100ක් 200ක් දිග හෝස් එකක් ගහන්න පුළුවන් නම් කඩයක් නිවා ගැනීමට පුළුවනි. යෝජනා කරනවා අර වගේ දෙයක් කරන්න කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, සරත් ශ්‍රී ලාල් මන්ත්‍රීතුමා ඉදිරිපත් කර යෝජනාව ඉතාමත් හොඳ යෝජනාවකි. හොඳ දේවල් තිබෙනවා. නමුත් අපට කර ගැනීමට ශක්තිය නැහැ. දැන් මේ ලසන්ත මන්ත්‍රීතුමා කිවු පරිදි ණයවෙලා හරි වාහනයක් ගෙන්වා ගන්න පුළුවන්. සේවකයන්ට පඩි ගෙවන කටයුතු වලට යනවානේ. එහෙම වුණාම අපේ මූලික උවමනාව , අපේ මූලික අදහස පවත්වාගෙන යන්න බැරි වෙනවා. මෙය ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක්. මා කාලයක් නැව් අළුත්වැඩියා කිරිමේ කටයුතු සිදු කර නිසා ආරක්ෂාව පිළිබඳ මා යම් දෙයක් දන්නවා. මට අවසර ලැබෙනවා නම් මා චුටි විනාඩි දෙකක දෙයක් කියන්නම්. අපේ ඩොග් වාව් එකේ ගිනි ගත්තා ආරාබි කියන නැව. ඇමරිකන් ඩොලර් මිලියන 60ක් වටිනවා. එහි පරික්ෂණයට ආපු ලොක්කා කිවුවා කවුරු හරි ඇතුලේ ඉඳගෙන මෙයට මුතා කළානම් මේ ගින්න ඇති වෙන්නේ නැහැ කියා. මුතා කළානම් එතනට මිලියන 62ක විනාශයක් සිදු වෙන්නේ නැහැ. ඒක තමයි හැබැව. එච්චරයි කතාව. මට අදහසක් තිබෙනවා. ගිනි නිවිමේ ප්‍රාථමිකම උපකරණය තමයි වැලි පනිට්ටුව. හැම කඩයකටම තියා ගන්න පුළුවන් වැලි පනිට්ටුවක්. ඊට වඩා ටිකක් වැඩි දියුණු කර උපකරණ තිබෙනවා. යම් යම් තමන්ගේ ශක්ති ප්‍රමාණය අනුව මුදල් මට්ටම අනුව පාවිච්චි කරන්න පුළුවන් උපකරණ තිබෙනවා. කඩයක් කරන කෙනෙකුට රු.15000/=, රු.20000/=, රු.30000/= ක් වැය කර මේ උපකරණ තියා ගන්න පුළුවන්. හැම දේම අපි නගර සභාවෙන්ම බලාගෙන ඉන්නවා. කර දෙන්න පුළුවන් නම් හොඳයි. එහෙම කර ගන්න බැරි නම්. මේ කඩ විදියේ ආරක්ෂාව ගැන අපි වගකියන්න ඕන. එමනිසා මෙන්න මේ ගිනිනිවිමේ ප්‍රාථමික උපකරණයේ සිට තමන්ගේ හැකියාව අනුව යම් යම් මට්ටම් අනුව දැන් අපි හිතමු මහා ව්‍යාපාරිකයෝ දොළොස්මහ, ඩිලාන් , ASB. ඒ වගේ ඒවාට නම් ඇති. එතකොට කඩ විදියටම ගිනි නිවිමේ උපකරණ එක ගණනේ තිබෙනවා නම් ඔගොල්ලන් හිතනවා ද අර කඩය ගිනි ගන්න විට මේ කඩයේ එක පාවිච්චි නොකර ඉදි කියා. එහෙම එකමුතු කමක් අපේ තිබෙනවා. කොහොම හරි මිනිසුන් දැක බලාගෙන හිටියානේ. මූලික අවස්ථාවේදි ක්‍රියාත්මක වෙන්න පුළුවන් හොඳම විදිය තමයි ගිනි නිවිමේ උපකරණයක් තමා සතුව තබා ගැනිම. අපට ව්‍යාපාර පටන් ගන්නා විට අදාළ අයදුම්පත දෙනවිට කියනවා. ගිනි නිවිමේ උපකරණ අපි ළඟ මොනවාද තිබෙන්නේ කියා. එහි ප්‍රාථමික උපකරණය තමයි වැලි පනිට්ටුව. හැම එකටම වතුර ගහන්න බැහැ. හැම ගින්නක්ම වතුරෙන් නිවන්න බැහැ. එමනිසා අදාළ ද්‍රව්‍ය වලට ගිනි නිවිමේ ඒකක තිබුණාම ව්‍යාපාර කරනවා නම් තමා ඒ සඳහාත් යම් මුදලක් යට කිරිමේ හැකියාව තිබෙනවා. මා සරත් ශ්‍රී ලාල් මන්ත්‍රීතුමාගේ යෝජනාව යටපත් කරනවා නෙමේ. මා මේ තවත් මතයක් ඉදිරිපත් කරන්නේ. මොකද මට ඔය සම්බන්ධව අතිවිශාල අත්දැකිම් තිබෙනවා. මෙතැන කියන්න බැහැ. ජිවිතේ තවම මා ඉන්නවා. ඒ වගේ වැඩ කරලා. ඒ ඒ ආයතන වලට ඒ වගකිම යම් යම් ප්‍රමාණයන්ගෙන් භාර දෙන්න. එගොල්ලන්ව දැනුවත් කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

මා හිතන්නේ මා විසින් ඉදිරිපත් කරන යෝජනාවට සියළුම මන්ත්‍රිවරු අදහස් ඉදිරිපත් කළා. මා එයට ස්තුති වන්ත වෙනවා. ඒ වගේම මෙයට තවත් දෙයක් එකතු කළ යුතුව තිබෙනවා. ලේකම්තුමිය මෙයට තවත් දෙයක් එකතු කර ගන්න. ගිනි නිවන රථ මොනවා අපට ලැබුණත් ඒ අවශ්‍ය වේලාවට ජලය ටික ලැබුණේ නැතිනම් මේ ගින්න නිවීමේ කටයුත්ත ඉතාම අමාරුයි. එතකොට ගිනි නිවන රථයට වඩා අමාරුයි ජලය ටික ලබා ගැනීම. එතකොට අපේ තිබෙන

බවුසර් ටික පුරවා සේවකයන් නැගිට්ටවා ජලය ටික පුරවා ඉතාමත් අමාරු කාර්යයකි. එතකොට මේ තත්ත්වය එදා සිටිය නගාරාධිපතිවරයා දැක්කා. 2006 වසරේ .සුනාමි කලවකවානුවේදි. කේ.ඒච්.ඩබ්. ජල ව්‍යාපෘතියක් අම්බලන්ගොඩට පැමිණියේ ඒ කාල වකවානුවේ. එතකොට සාමාන්‍යධිකාරි හිටියේ අම්බලන්ගොඩ මනුස්සයෙක්. එයාට කතා කර කිවුවා මෙයාගේ අවශ්‍යතාවය මේකයි. අම්බලන්ගොඩ නගරයේ හදිස්සි ගින්නකදි ජලය ලබා ගැනීමේ අවශ්‍යතාවයේ ක්‍රමවේදයක්. එතකොට එතුමාගේ අධික්ෂණය යටතේ කේ.ඒච්.ඩබ්. ජල ව්‍යාපෘතිය යටතේ අම්බලන්ගොඩ ජල ව්‍යාපෘතිය පැමිණි කාල වකවානුවේ ජල සම්පාදන මණ්ඩලය විසින් ඉදිකර ඇති Fire hirdern 03 ක් තිබෙනවා. සෙලාන් බැංකුව ඉදිරිපිට ඇති පියදාස මහතාගේ ගරාජය ඉදිරිපිට , අනිත් එක ස්ථාපනය කර තිබෙනවා තැපැල් කන්තෝරුව ඉදිරිපිට, තුන්වෙනි එක ධර්මාශොක විද්‍යාලය ඉදිරිපිට. එතකොට මේ තුන මේ වැල් තුනක් . මේ වැල් වලින් කරන්නේ අගල් 3 බටය යන්නේ අහල් දෙකේ හොස් එකට සම්බන්ධකරන පොඩි කැල්ලක් තිබෙනවා. අපි තබාගත යුතුයි නගර සභාවෙන්. එතකොට අගල් තුනේ බටය තුලින් අගල් දෙකේ බටයට වේගය වැඩි කර දෙනවා . අපි සභාවෙන් ගෙනත් තියා ගන්න ඕනේ හෝස් එකයි අර කැල්ලයි. ඒ ජලසම්පාදන මණ්ඩලය විසින් ස්ථාපනය කරන ලද වැල් තුන. අද වෙනතුරු අත තියන්නෙත් නැහැ. ඒවා අරින්නේත් නැහැ. ඊළඟ තුන අම්බලන්ගොඩ ඉඳුනිල් හාඩ්වේයාර් එක ගිනි ගත්තා මිට අවුරුදු කිහිපයකට පෙර . එතැන ගිනි ගැනීම් දෙකක් වගේ සිදු වුණා. ඒ වෙළඳ ප්‍රජාව ඉදිරිපත් වෙලා නාගරාධිපතිතුමාට කැකෝ ගසා තව වැල් තුනක් සම්බන්ධ කරන්න එයාගේ උපරිම උත්සාහය ගත්තා. ඒ උත්සාහය මත එලිෆන්ට් එක ඉදිරිපිට ජී.එම්.එස් මහතාගේ කඩය ඉදිරිපිට එක එකක් . ඊළඟ එක ගිනි ගත්තු කඩය ළඟ. තුන්වෙනි එක සවිකර තිබෙනවා . පරණ ලංකා බැංකුව ඉදිරිපිට පොළ ඉදිරිපිට ( ආර්.ටි.එස් එක ඉදිරිපිට ) එතකොට මේ හයම වතුර ගන්න පුළුවන් Fire hirdern ඒ භාෂාවෙන් කියන්නේ ගින්න නීවිම සඳහා රුකුල් දෙන වැල් . ධම්මික මන්ත්‍රිතුමා හිටියා නම් කියයි. අපිට දැනුමක් නැහැ ඒ ගැන. ගින්න නිවිම සඳහා වතුර ලබා ගැනීමට උපකාර වන වැල්. ඉතිං මේ හය සම්බන්ධව කටයුතු කිරිමට ජල සම්පත් මණ්ඩලයේ ඒ නිලධාරිතුමා අප දැනුවත් කර තිබිය යුතුයි. ඇත්ත වශයෙන්ම මා වෙන වැඩකට ගිය වේලාවේ එතැන හිටියා ප්‍රාදේශිය කළමනාකාරතුමා. එතුමා මේ සම්බන්ධව කිසිම දෙයක් දන්නේ නැහැ. හැබැයි සභාවෙන් ලිඛිත ඉල්ලිමක් කරන්න කිවුවා. එයා හොයා බලන්නම් කිවුවා. ඒ වගේම මේ වගේ අවස්ථාවකදි පාවිච්චි කළහොත් වතුර. වතුර බිල ගෙවන්නේ කවුද කියන එකත් එයාට ප්‍රශ්නයක්. මා කිවුවා ඒ වගේ අවස්ථාවකදි දහවල් කාලයේ කඩයේ හිමිකරුට කියා ඒවා අයකර ගන්නවා කියා. නාගාරාධිපතිවරයා වශයෙන් එතුමාටත් බලයක් ඇති පණතේ එතුමාටත් බලයක් ඇති හදිසි අවස්ථාවකදි පිහිට වෙන්න. ඊට පස්සේ ජලසම්පත් මණ්ඩලයේ සාමාන්‍යධිකාරිවරයකුට කතා කළා. මෙහි තත්ත්වය මොකක්ද කියා. එතුමා කිවුවා චක්‍රලේඛණයේ තිබෙනවා පැහැදිලිවම ඒ අදාළ ස්ථානභාර නිලධාරියාට පැහැදිලි අයිතියක් තිබෙනවා කියා වතුර දෙන්න. නොමිලේ දෙන්න . මෙවැනි අවස්ථාවක. ගින්නකදි. ඊළඟට ජනාධිපතිවරයා , අගමැතිවරයා පැමිණෙන අවස්ථාවලදි ඒ වතුර නොමිලේ ලබා දෙන්න. එතකොට ඒ සියල්ල අපේ පැත්තට තිබෙන්නේ හොඳට. දැනට අපට තිබෙන්නේ ජල සම්පාදන මණ්ඩලය දැනුවත් කරලා වැල් හය පිරිසිදු කරලා හදිසි ගින්නකදි මේවා පාවිච්චි කිරිමේදි තව උපකරණ අවශ්‍ය වෙනවාද ? තව තිබෙනවාලු කැල්ලක් ඕකට ගෙන්න හෝස් . ඉතිරි ටික නගර

සභාවෙන් ගෙනත් තියා ගන්න විතරයි අවශ්‍ය වෙන්නේ. ඒ නගර සභාව මට්ටමින් අපට කරන්න පුළුවන් දේ කරන්න කියන ඉල්ලීම කරනවා.

<u>**මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

සරත් මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව හොඳ යෝජනාවක්. අපේ රාහුල මන්ත්‍රීතුමා උප සභාපති ඉන්න කාලේ අපේ නගර සභාවට ගිනි නිවීමේ උපකරණ කට්ටලයක් හම්බ වුණා. එය පළාත් පාලන අමාත්‍යාංශය හරහා තමයි ලැබුණේ. ඒ අවස්ථාවේ අපට ඒ උපකරණ ලැබුණාට ඒ අවශ්‍ය සේවකයන් ලබා දීමට බැහැ කියන එක තමයි කිවුවේ. උපකරණ ටික දෙන්නම් කිවුවා. එම උපකරණ ටික තමයි ගාල්ල නගර සභාවට ලැබුණේ. නවක මන්ත්‍රීවරයෙක් වුණත් අපේ ලසන්ත මන්ත්‍රීතුමා කිවුවා සේවකයන් 42ක් පමණ අවශ්‍ය වෙනවා කිවුවා. ඒ සේවකයන්ට පඩිනඩි සභාව විසින් ගෙවන්න කියා කිවුවා. ඒ උපකරණ ටික අතහරින්න සිද්ධ වුනේ අපට සම්පත් නැති නිසා. එම සම්පත් නැති නිසා එය කරගැනිමට නොහැකි නිසා තමයි අපි එය අතහැරියේ. හැබැයි ගාල්ල නගර සභාවට පසුව එය ලබා දුන්නා. දැන් ඔබතුමලා අනුමත කරනවා නම් අපට පුළුවන් පළාත් පාලන අමාතශ්‍යාංශයට යෝජනාවක් වශයෙන් ගෙනවිත් නැවත වතාවක් ඉල්ලීමක් කරන්න. ඒ කාලයේ ඒ තත්ත්වය උදා වුණා. දැන් මේ කාලය වෙනවිට අපට ලබා ගන්න පුළුවන් වෙයිද දන්නේ නැහැ. සේවකයන් සමඟ ඒ උපකරණ ටික. අපි ඉල්ලීමක් කරන්න. මේ යෝජනාවට මෙන්න මේ තත්ත්වයක් උදාවෙලා තිබෙනවා කියා. ගරු සභාවේත් මන්ත්‍රීවරු සියළු දෙනාම එකඟ වෙන්න. ගරු විෂය භාර අමාත්‍යාවරයාට මේ උපකරණ කට්ටලය සහ සේවක පිරිස ලබා දීමට කටයුතු කරන ලෙස ගරු සභාවෙන් ඉල්ලීමක් කර තිබෙනවා. ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලෙස. ඒ එක්කම අපේ ජගත් කුමාර මන්ත්‍රීතුමාත් යෝජනා කළා වැල් 6ක් තිබෙනවා නගරයේ . අපට මීටර් 200ක 300 විතර බට ටිකක් ලබා ගන්න. කාර්මික නිලධාරිතුමිය ටෙන්ඩර් කැඳවන්න. අපට බට ටික ලබා ගන්න. ටෙන්ඩර් කැඳවන්න. අපට බලන්න පුළුවන් කොච්චර මුදලක් යනවාද කියා. අනිත් එක සරත් මන්ත්‍රීතුමාගෙන් කියවුණා. ජල සම්පාදනයට කිසිම දැනුමක් නැහැ කියා මේ සම්බන්ධව. ඒ සම්බන්ධව අදාළ ලිපියක් යවන්න අපේ කාර්මික නිලධාරින් හරහා ඒ අදාල වැල් ස්ථාපනය කර තිබෙන්නේ මේ මේ තැන්වල . මේවා ක්‍රියාත්මක වන බව බැලීමට කටයුතු කරන ලෙසත් ඒවා හදන ලෙසත් ජල සම්පාදන මණ්ඩලයට ලිපියක් යවන්න.

**තීරණය -**

අම්බලන්ගොඩ නගර සභාවට ගිනි නිවන රථයක් ලබාදෙන ලෙස රජයෙන් හෝ පළාත් සභාවෙන් ඉල්ලා සිටින ලෙස ගරු නගර සභා මන්ත්‍රී ගංගේ සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව එම අනුව ගිනි නිවන උපකරණ කට්ටලය සහ ඊට අදාල සේවක පිරිස ලබාදෙන ලෙස පළාත් පාලන අමාත්‍යාංශයේ විෂය භාර අමාත්‍යාවරයා වෙත ඉල්ලීමක් කරන ලෙස මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් දන්වන ලදී.

06 **කාරක සභා වාර්තා**

**06.01 2020.05.19 දින පැවති මූල්‍ය කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

2020.05.19 දින පැවති මූල්‍ය කමිටු වාර්තාව සභාගත කිරිමට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

2020.05.19 දින පැවති මූල්‍ය කමිටුවේ කමිටු වාර්තාව පිළිගත යුතු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය

**06.02 2020.05.18 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

2020.05.18 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව සභාගත කිරිමට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**06.03 2020.05.18 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

2020.05.18 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව සභාගත කිරිම. මේ කමිටුව කරන නිලධාරිතුමිය දැනගන්න මේ කමිටුවෙන් ක්‍රියාත්මක වෙන කටයුතු එක කොට්ඨාශයකට පමණක් ක්‍රියාත්මක කරන්නේ නැතුව කොට්ඨාශ 13ටම සමානව ක්‍රියාත්මක කරන්න කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

සෞඛ්‍ය කමිටුවට මාගේ නම ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

එහෙම කිවුවේ සාධාරණව යන්නේ නැද්ද මේ වැඩටික. හේතුව කියන්න

**මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ඔබතුමා කැමති නැද්ද ? ඔබතුමාගේ කොට්ඨාශයේ වැඩ කරනවාට.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

වැඩ කරනවාට නෙමේ. මේ සියළුම දේ එහෙමයි. හැම කොට්ඨාශයකටම වැඩ කෙරෙනවා.

**මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

දැන් මගේ කොට්ඨාශයට වැඩ කෙරෙන්නේ නැති නිසා මා කිවුවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

වැඩ කෙරුණේ නැත්තේ ඔබතුමා උප සභාපතිතුමා නිසාද?

**මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

එක ඉතිං මා දන්නේ නැහැ. මාගේ කොට්ඨාශයේ වැඩක් කෙරෙන්නේ නැහැ. එකයි මා එවැනි ප්‍රකාශයක් කළේ. දැන් ඔබතුමාගේ කොට්ඨාශයේ වැඩ කෙරෙනවාද එහෙම.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

අපට ප්‍රශ්නය තිබෙන්නේ උප සභාපතිතුමාගේ කොට්ඨාශයේ වැඩ කෙරෙන්නේ නැති එක.

**මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මා කෙරෙන්නේ නැහැ කියන තේරුම් ගන්න එපා. මා කෙරෙන්නේ නැහැ කියන එක නෙමේ . මා කිවුවේ අනිත් කොට්ඨාශවලටත් ක්‍රියාත්මක කරන්න කියා.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**

සෞඛ්‍ය හා කර්මාන්ත අංශවල සේවක හිඟකම නිසාදෝ කියා මා දන්නේ නැහැ. අපට සේවකයෙකු ලබා ගැනීම බොහොම අමාරු වෙලා තිබෙනවා. අත්‍යවශ්‍ය දෙයකට වත් කම්කරුවෙකු ලබා ගැනීමට නොහැකි වෙලා මෙහි මන්ත්‍රීවරයෙකු වෙලා . එමනිසා ඔබතුමා වගේම මටත් තිබෙනවා නොමනාපයක්. අපේ පාරිපාලක මහත්වරු සේම අපේ කාර්මික නිලධාරි මහත්වරුන්ට අධික වැඩ නිසා ඒ අය බොහොම කාර්යශූල අය බවට පත්වෙලා. ඒ පරිපාලක මහත්වරු මෙහෙයවා අපට සෑම කොට්ඨාශයකටම සේවකයෙකු මෙහෙයවන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, සෞඛ්‍ය කමිටුවේදි තිරණයක් ගත්තා අයාලේ යන සුනඛයන් නැවත වන්දිකරණය කිරිම සඳහා එම ආයතනය නැවත අම්බලන්ගොඩට ගෙන්වන්න කියන එක. ඔබතුමාට මතක ඇති. එය නගර සභාවෙන් ඔබතුමා උනාන්දු වෙලා දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරිට හා පාශු වෛද්‍යවරියට දන්වා පුළුවන්තරම් ඉක්මනට ඒ සායනය අම්බලන්ගොඩ නගරයට ගෙන්වන්න කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, සෞඛ්‍ය කමිටු වාර්තාව ගැන කතා වුණා. මට කියන්න තිබෙන්නේ දින පහේ වැඩ සටහනට මේ කොරෝනා ප්‍රශ්නය නිසා සේවකයන් යොදවන්න අමාරුයිනේ. දැන් සතියේ වැඩ සටහන අපේ සරත් මන්ත්‍රිතුමාගේ යෝජනාව සම්මත කරලා අපේ කොට්ඨාශයේ ඇත්තටම වැඩ කෙරුණා. දැන් ඇත්තටම මැෂින් එකක් ඉල්ලා ගන්න අමාරුයි. මා දින තුනක් ගියා. වැඩ පරිපාලකතුමාට කිවුවා ලබා දෙන්න. අඩුම ගණනේ අපේ නිල සෙවණේ දැන් නිලධාරින් 4කු වැඩ. පිටුපස හා ඉදිරිපස තණකොළ වැවිලා. ඒ ටික සුද්ද කර දෙන්න කියා නිලධාරින් ඉල්ලා සිටියා. මා වැඩපරිපාලකතුමාගෙන් ඉල්ලා සිටියා. අද බැහැ කියනවා . හෙට දෙන්නම් කියනවා. බාලගිරි දෝෂය වගේ හරියට. දින හතේ කතන්දරය දැන් ඇත්තෙම නැහැ. දැන් මේක ඉදිරියට ක්‍රියාත්මක වෙනවාද? දැන් ඉදිරියට ඩෙංගු එනවා. නිරිතදිග මෝසම් සුළං එන්නේ ඉදිරියට. ඩෙංගු අවධානම තිබෙනවා. කාණු සුද්ද කරලා නැහැ. දෙපැත්ත මැෂින් වලින් ගහලා නැහැ. පිරිසිදු කමක් නැහැ. ඉතිං නගර සභාවක් විදියට මෙහෙම කරගෙන යන්න බැහැනේ. සතියේ වැඩ සටහන් වල මන්ත්‍රිවරයා අසරණයි. මෙයට පිළිතුරක් දෙන්න ඔබතුමා.

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

විශේෂයෙන්ම කියන්න ඕනේ තණකොළ කපන මැෂින් කැඩිලා තිබෙන්නේ. එකක් වගේ වැඩ කරන්නේ. නමුත් දැන් ඔබතුමා කිවුවානේ සතියකට එක කොට්ඨාශයට දෙනවා කියා. ඔබතුමාගේ කොට්ඨාශයේ එක සතියද වැඩ කළේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

මුලින් වැඩ කළේ එක පාරයි. ඊට පස්සේ වැඩ කළේ නැහැ.

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මගේත් එක පාරයි. යෝජනා කළ සරත් මන්ත්‍රිතුමාගෙක් කළේ නැහැ තවම. මේ කාලයේ වේලා තිබෙන්නේ අපේ කර්මාන්ත අංශයේ සියළු සේවකයන් යොදවා තිබෙන්නේ ආරක්ෂක අංශයට. මා ඉන්න කොට්ඨාශයේ මගේ ගෙදරට යන පාරේ තණකොළ ටික කපා ගන්න බැරි තත්ත්වයක් උදාවෙලා තිබෙන්නේ. සේවකයොත් නැහැ. දැන් ඔක්කොම යොදවා තිබෙන්නේ මේ හින්දා. මා

ලේකම්තුමියගෙන් ඇහුවේ 15දා වෙනකොට ආරක්ෂක අංශය සඳහා සේවකයින් පැමිණෙනවා. විශේෂයෙන්ම අම්බලන්ගොඩ නගරය කියන්නේ නගරය විතරක් නෙමේ. එය ව්‍යාප්ත වෙලා තිබෙන්නේ ගම්බද ප්‍රදේශවලට. විශේෂයෙන්ම ඒ ගම්බද ප්‍රදේශ පිරිසිදු වෙන්න ඕන. නමුත් එක මේ කාලයේ සිද්ධ වෙන්නේ නැහැ. මා පිළිගන්නවා එක. ඉදිරි කාලයේදි මෙය ක්‍රියාත්මක වෙන්න ඕන . මා හිතන්නේ නැහැ මන්ත්‍රිතුමා මේ ක්‍රියාත්මක වීම සේවකයන් දෙදෙනෙකු යොදවා කර වැඩක් නැහැ. ක්‍රියාත්මක වෙනවානම් කර්මාන්ත අංශය හා සියළු කර්මාන්ත අංශයේ සේවකයන් යොදවන්න වෙනවා. ඒ කොටස කරන්න. නැතිව දෙදෙනෙකු කරලා නම් වැඩක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ඔබතුමා කියන්නේ සතියේ වැඩ සටහන ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සතියේ වැඩ සටහන දැන් මේ වනකොට ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඔබතුමාගේ කළා. මාගේ කළා. ශ්‍රේෂන් මන්ත්‍රිතුමා එක පාරක් කළා. කළුවඩුමුල්ලේ , හෙප්පුමුල්ලේ කළා. එච්චරයි. වෙන මන්ත්‍රිවරුන්ගේ ක්‍රියාත්මක වුනේ නැහැ. එච්චරයි ක්‍රියාත්මක වුනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා, මෙය එක කොට්ඨාශයක විතරක් කර වැඩක් නැහැ. ලස්සනට තියෙන්න ඕන. කාණු සුද්ද කරලා , පාරවල් වල කැළැව සුද්ද කරලා කොට්ඨාශ පිරිසිදු කරන ඒ යෝජනාව ලස්සනට ක්‍රියාත්මක වුණා. හැම කොට්ඨාශයටම මැෂින් එකකද සෞඛ්‍ය කම්කරුවන්ද , අදාළ සේවකයන් ක්‍රියාත්මක කරන්න ඕන කොට්ඨාශ 13 ම ලස්සනට තියා ගන්න. ඔබතුමා ගරු උප සභාපතිතුමා විදියටත් , අපි මන්ත්‍රිවරු විදියටත් අපට ගම්වලට යන්න බැහැ. ජනතාව අපට බනිනවා. කොරෝන ප්‍රශ්නය නිසා . අපි හරියට කළමනාකරණය කර සැලැස්මක් ඇතිව හරියට වැඩ කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

කාර්මික නිලධාරි ජානක මහතා පැවසුවා. තණකොළ කපන යන්ත්‍ර පහෙන් හතරක් කැඩිලා කියා. එක මැෂින් එකයි වැඩ කරන්නේ කියා. එතුමා කිවුවා මැෂින් පහක් අවශ්‍යයි කියා. මා කිවුවා මැෂින් පහක් නොගන්නේ ඇයි කියා. සභාවෙන් අරන් දෙන්න කියා. මා කිවුවා අරන් දෙන්න ඔගොල්ලන් යෝජනා කරන්න ඕන කියා. මා තාක්ෂණ නිලධාරින්ගෙන් ඉල්ලා සිටිනවා . මේ ටෙන්ඩර් මණ්ඩලයට යෝජනාවක් දමන්න කියා. තිබෙන මැෂින් පහ හදන්න කෙනෙක් නැහැ කිය කිය ඉන්වාට වඩා අලුතින් මැෂින් පහක් ගන්න යෝජනාව දමන්න මේ ටෙන්ඩර් කමිටුවට. ටිකක් ලොකු ගණන් නෙමේ. රු. 15000/ = ක් නැතිනම් රු.16000/= මේ මැෂින් දෙක. මේ වැඩ කරන්නේ කොහොමද? එක මැෂින් එකකින් මේ මන්ත්‍රිවරු 21කුගේ වැඩ කරන්න බැහැනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, කතා කරන්න පුළුවන් නේද? දැන් මේ සෞඛ්‍ය අංශයේ උදලු සවල් මේ ඔක්කොම කැඩිලා. උදැල්ලක මේ කැලි නැහැ. කාණුවට දමා අපද්‍රව්‍ය ගන්න බැහැ. වැඩ කරන සේවකයින් ගිහින් බොරුවට මේවා කර එනවා. අවශ්‍ය උපකරණ ටික අරගෙන දෙන්න. ඔක්කොම කැඩිලා තියෙන්නේ. වැඩ කරන්න බඩු නැහැ.

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා , සාමාන්‍යයෙන් උදැල්ලක් සවලක් ගන්න එකට සෞඛ්‍ය පරිපාලක ඉල්ලීමක් කර තිබෙනවාද කියන එක මා දන්නේ නැහැ. නැතිනම් එගොල්ලන්ගේ වගකීමක් වෙනවා . එහෙම ඉල්ලීමක් කරන්න. සභාවක් වශයෙන් ලේකම්තුමිය දන්නේ නැහැ. මන්ත්‍රීවරු දන්නේ නැහැ. මේවා කැඩිලා තිබෙනවාද කියා. ඔගොල්ලන් මේවා ඉල්ලා තිබෙනවාද ? හිරාන් මහතා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

දන්න හින්දා තමයි මාගේ ඇස්දෙකට දැකපු ඒවා මේ කියන්නේ.

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

දැන් මන්ත්‍රීතුමා යෝජනාවක් කරන්න. ඔගොල්ලන් ඉල්ලීමක් කර තිබෙනවාද? එකේ වගකීම එගොල්ලන් භාර ගන්න ඕන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

හල්වතුරේ ඔක්කොම සුද්ද කළා. අපේ කට්ටියම ගෙනවිත් . නමුත් නගර සභාවේ ට්‍රැක්ටරයෙන් අරගෙන යන්නේ නැහැ. ඒ කපපු තණකොළ ටික. ඒ මිනිසුන් කපා ගත් තණකොළ ටික අරගෙන යන්නේ නැති නගර සභාවක් මෙතැන තිබෙන්නේ. අපේ ප්‍රධාන අමාත්‍යතුමා ඉදිකරනු ලැබූ ඇවිදින මංතීරුව. තණකොළ වැවිලා තිබුණේ. දැන් එක සුද්ද කළා. සුද්ද කර තිබෙන්නේ . ඒ ටික ඔක්කොම ගොඩ ගසා තිබෙන්නේ. ඒවා අරගෙන ගිහින් නැහැ.

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

හිරාන් මහතා ඒවා අරගෙන යන්න කිවුවා නම් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා , ගරු උප සභාපතිතුමා දැනුවත් කර කරන්න මේවා. ජනතාව සුද්ද කරගත් දේ අරගෙන යන්නේ නැහැ.

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා කතා කළා උදේ. දෛනික සේවකයන් නැවත සෞඛ්‍ය අංශයට බඳවා ගෙන වැඩ කරන්න කියා. ඉදිරියේදි ක්‍රියාත්මක වෙයි. හිරාන් මහතා අර මන්ත්‍රීතුමා යෝජනා කළ

සවලුයි උදැලුයි කැඩිලා තිබෙනවා නම් සේවකයන්ට ඉතා ඉක්මනින් ලබා දෙන්න. දැන් ඕවා කතා කළා වගේ නෙමේ අර මාධ්‍යවේදි මහතා පුවත් පතට ලිව්වාම එහි ලොකු අකුරින් යයි. මෙන්න මේ සභාවේ සවුලුයි උදැලුයි නැහැ කියා.  අඩුම ගණනේ මේවා බලා සභාවට ඉදිරිපත් කරන්න. ඔගොල්ලන්ගේ රාජකාරියක් එය ඉෂ්ඨ කරන්න.

## 07 ටෙන්ඩර් හා මිළ ගණන්

### 07.01 ටෙන්ඩර්

### 07.02 මිළ ගණන්

**07.02.01 අම්බලන්ගොඩ නගර සභාවවේ බැකෝ යන්ත්‍රයට අවශ්‍ය අමතර කොටස් සඳහා ඉදිරි පත් කර ඇති මිළගණන් සභාගත කරන ලදී.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | Saman Motors Ambalangoda | Avonsmart Engineering Colombo 2 | SM Motors Elpitiya |
|---|---|---|---|---|---|
| 01 | බ්රේක් ප්ලේට් | 04 | රු.11500/= | රු.13913.04 | මිළ ගණන් ඉදිරිපත් කර නැත |
| 02 | වානේ ඩිෂ් | 04 | රු.14750/= | රු.34722.22 | |
| 03 | ඕවරින් හිට් | 02 | රු.4500/= | රු.5445.08 | |
| 04 | වාස්ටර් පොම්ප වොෂර් ෂිට් | 02 | රු.1500/= | රු.1480/= | |
| 05 | බකට් දත් | 08 | රු.1975/= | රු.3988.58 | |
| 06 | බෝල්ට් ඇණ | 16 | රු260/= | රු.73.49 | |

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභාවවේ ZA 5185 අංක දරණ බැකෝ යන්ත්‍රයට අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනිම  සඳහා මිළගණන් ඉදිරිපත් කර ඇත්තේ ආයතන 2කි. බැකෝ යන්ත්‍රයේ අලුත් වැඩියාව ඉතා ඉක්මනින් සිදු කළ යුතු බැවින් අවම මිල ගණන් ඉදිරිපත් ඇති Saman Motors ආයතනයේ මිළ ගණන් පිළිගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

07.02.02

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | M. M කන්ට්‍රක්ෂන් වතුගෙදර | P.H.C.C. ද සිල්වා | රවි කන්ට්‍රක්ෂන් අලුත්වල |
|---|---|---|---|---|---|
| 01 | හල්වතුර කසල අංගනයේ කසල තුනි කිරිම සඳහා යන්ත්‍රය භාවිතා කිරිම ( මීටර පැයකට ගණන ) | මිට පැය 01ක් සඳහා | රු.3950/= | රු.3600/= | මිල ගණන් ඉදිරිපත් කර නැත |

**තීරණය-**

හල්වතුර කසල අංගනයේ කසල තුනී කිරීම සඳහා D4 යන්ත්‍රය භාවිත කිරීම සඳහා ඉදිරිපත් කර ඇත්තේ මිල ගණන් දෙකක් පමණි. ඒ අනුව ඇස්තමේන්තු වටිනාකම මීටර පැයකට රු.3300/= කි. ඒ අනුව අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති සැපයුම්කරු වන P.H.C.C. ද සිල්වා රු.3300/= මිලට යන්ත්‍රය සැපයිමට එකඟ වුවහොත් මෙම මිල ගණන් පිළිගැනිමටත් නැතහොත් නැවත මිලගණන් කැඳවීමටත් ගරු සභාව තීරණය කරන ලදී.

08. ගෙවීම්.

08.01 සභාව සතු සියලුම වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා  2020 මාර්තු මාසයට ඉන්ධන ලබාගැනීම වෙනුවෙන් රු.201769/- ක් සී/ස. අම්බලන්ගොඩ විවිධ සේවා සමූපකාර සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට  මූලාසනය හෙබවූ ගරු උප

සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.02 විහාරගොඩ හරස් පාර කාණුව ඉදිකිරීමේ කර්මාන්තයේ 10% ක රඳවුම් මුදල් රු.23159.50 ක් නිදහස් කිරීම පොල්වත්ත, ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේ 08.01 සිට 10% ගාස්තු නිදහස් කරන ඒවා මේවා ගිහින් බලා ඉවර වෙලාද නිදහස් කරන්නේ.

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

තාක්ෂණසේවා නිලධාරි මහතාණෙනි පිළිතුරු දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔබතුමා ගිහින් බලා ඉවර වෙලාද නිදහස් කරන්නේ. ප්‍රශ්න ගැටළු තිබෙනවාද? සියළුම ඒවා. 08.02,08.03,08.04,08.05,08.06,08.14. ගිහිල්ලා බැලුවාද ? වගකීමෙන්නේ කියන්නේ. ප්‍රශ්න ගැටළු නැහැනේ.

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මේ හැම එකකම එතුමාගේ නිර්දේශය පරිදි තමයි ගෙවීමට යොමු කර තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

නිර්දේශ තිබෙනවා. හැබැයි මොකක් හරි කැඩීමක් සිදු වෙලා තිබෙනවා නම් අපිත් ඒ වගකීම් වලට බැඳි සිටිනවා. මේවා අනුමත කරන විට. මා නම් කියන්නේ කොට්ඨාශයේ මන්ත්‍රීවරු වුණත් මේවා බැලුවානම් ඉවරයි. මේවා කැඩිලා තිබුණහොත් එහෙම. අපට ඇහෙනවා ජනතාව කතා කරනවා. මහ ජාරා විදියට කතා කරන්න. අපිත් අනුමත කරනවා. එමනිසා මෙය නිසියාකාරව කෙරෙනවාද කියන එකයි දැන ගන්න තිබෙන්නේ. නැතිනම් අපි සියළු දෙනා මේ ගෙවීම් වලට විරුද්ධ වෙනවා. එමනිසා ඔබතුමාගේ ලිපිය පරිදි අනුමත කරනවා.

08.03 ග්‍රාමණී විද්‍යාල මාවතේ පැති බැම්ම ඉදිකිරීම කර්මාන්තයේ 10% ක රැඳවුම් මුදල් රු.24749.50 ක් නිදහස් කිරීම කළුවඩුමුල්ල සහජීවන ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:04 තල්ගස්ගොඩ නිව්යෝර්ක් ගම්මානය අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයේ 10% ක රැඳවුම් මුදල් රු.39561.30 ක් නිදහස් කිරීම තල්ගස්ගොඩ ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:05 තල්ගස්ගොඩ සුදුවැල්ල පෙර පාසලේ සිවිලිම ඉදිකිරීම කර්මාන්තයේ 10% ක රැඳවුම් මුදල් රු.47378.52 ක් නිදහස් කිරීම තල්ගස්ගොඩ ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:06 සංඝරාජ හරස් පාර ධර්මාශෝක විද්‍යාලය පිටුපස ගේට්ටුව අසල මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයේ 10% ක රැඳවුම් මුදල් රු.60208.21 ක් නිදහස් කිරීම කරිත්තකන්ද ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:07 ඇණවුම් අංක 2418 යටතේ ඇණවුම් කරන ලද ෆොටෝ කොපි ටෝනර් 02 ක් ලබාගැනීම වෙනුවෙන් රු.60048/- ක් Metropolitan office (pvt) ltd ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:08 ඇණවුම් අංක 2420 යටතේ ඇණවුම් කරන ලද Infrared Thermometer 05 ක් ලබාගැනීම වෙනුවෙන් රු.84750/- ක් Evergreen Lighting and Electrical Lanka (pvt) ltd

ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:09 අම්බලන්ගොඩ විජයාරාම පාර කොන්ක්‍රීට් කාණු ඉදිකිරීම වෙනුවෙන් රු.48,309.62 ක මුදලක් කළුවඩුමුල්ල සහජීවන ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:10 ඇණවුම් අංක 2390 යටතේ Rydall OE ලීටර් 40 ක් ලබාගැනීම වෙනුවෙන් රු.100000/- ක් United Glass Lanka (pvt) ltd ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:11 ඇණවුම් අංක 2423 හා 2424 යටතේ ගර්භණී මාතාවන්ට භාණ්ඩ මිලදී ගැනීම වෙන්වෙන් රු.290625/- ක මුදලක් අම්බලන්ගොඩ ඩිලාන් ෆැෂන් හවුස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනී එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:12 කෙරම්ණිය ශාඛා පුස්තකාලයේ පොත් බැඳීම වෙනුවෙන් රු.55025/- ක මුදලක් අම්බලන්ගොඩ, ශ්‍රී මේධානන්ද මාවත පදිංචි එස්.ඩබ්හරිස්චන්ද්‍ර මහතා හට ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:13 ඇණවුම් අංක 2414 යටතේ ඇණවුම් කරන ලද පස් කියුබ් 42 ක් වෙනුවෙන් රු.121800/- ක මුදලක් අම්බලන්ගොඩ, එපිටමුල්ල පාර පදිංචි පී.එච්.සී.සී. ද සිල්වා මහතා හට ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ලබන සභාවට ඉදිරිපත් කරන්න. ක්‍රීඩා පිටිය සඳහා වියදම් කරන ලද සම්පූර්ණ මුදල. නගර සභාවෙන් වියදම් කරන ලද මුදල. ක්‍රිකට් ආයතනයෙන් කොච්චර මුදලක් වියදම් කළාද කියා. අපි දැන ගත යුතුයි මේ සඳහා කොපමණ මුදලක් වියදම් කර තිබෙනවාද කියා.

<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

මේ යෝජනාව ඇත්තටම හොඳ යෝජනාවකි. මමත් ඉල්ලීමක් කරන්න හිටියේ. ලබන සභාවට ක්‍රිකට් ආයතනයෙන් කියක් වියදම් කර තිබෙනවාද මේ වෙන කොට. නගර සභාවෙන් මේ වන කොට කියක් වියදම් කර තිබෙනවාද කියා ගරු මන්ත්‍රීවරුන්ට වාර්තාවක් ලබන සභාවට ලබා දෙන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

මොකද මේ මන්ත්‍රීවරු අපි අත ඔසවනවා. හදිස්සියේවත් විගණන පරීක්ෂණයක් අවොත් එහෙම කොහොමද ගෙවන්නේ. කෝටි ගණක්. එමනිසා අපි ආණ්ඩුකාරතුමාගෙන් අනුමැතිය ගත යුතුයි. ආවරණ අනුමැතියක්වත්.

<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

හැබැයි ලේකම්තුමිය මේ ගන්න තීන්දු ක්‍රියාත්මක වෙන්න ඕන. මීට කලිනුත් මේ සභාවේ වැඩ බලනවා වාඩිවෙලා. ගනු ලැබූ තීන්දු මේ වනකම් ක්‍රියාත්මක වුණේ නැහැ. මේ ගනු ලැබූ යෝජනා හා තීන්දු ක්‍රියාත්මක වුයේ නැහැ. ඔබතුමියගෙන් මා ඉල්ලා සිටිනවා අද ගන්න තීන්දු ක්‍රියාත්මක කරන්න කියා. ඔය වාර්තාව අනිවාර්යෙන් මන්ත්‍රීවරුන්ට ලැබෙන්න ඕන.

08:14 අම්බලන්ගොඩ , පටබැඳිමුල්ල ආදාහනාගාරයේ භූමියෙහි අභ්‍යන්තර මාර්ග ඉදිකිරීමේ කර්මාන්තයේ 10% ක රඳවුම් මුදල් රු.50,000/- ක් නිදහස් කිරීම කළුවඩුමුල්ල සහජීවන ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට මූලාසනය හෙබවූ

ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:15 කළුවඩුමුල්ල , විජයාරාම පාර කාණු කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් රු.257763.86/- ක මුදලක් කළුවඩුමුල්ල සහජීවන ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:16 පින්නදූව, එල්.සී. ද සිල්වා මාවතේ පැති කාණුව ඉදිකිරීම වෙනුවෙන් (02 අදියර) රු.156827.18 ක් කළුවඩුමුල්ල ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:17 අම්බලන්ගොඩ, කෙරමිණිය, දූවවත්ත පාර තාර දැමීම කර්මාන්තයේ 10% ක රැඳවුම් මුදල් රු.37,110.90 ක් නිදහස් කිරීම තල්ගස්ගොඩ ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:18 අම්බලන්ගොඩ නගර සභාවේ ගරු නාගරික මන්ත්‍රීවරුන්ගේ 2020 මැයි මස ගමන් වියදම් ලෙස රු.120000/- ක් සභා අනුමැතියට යටත්ව ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 09. ගිණුම් :-

**09.01 2020 අප්‍රේල් මාසයට අදාළ වියදම් වාර්තාව , පොදු ගිණුම් හා වියදම් වැය විශ්ලේෂණය සභාගත කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ එළවළු වෙළඳාමේ ප්‍රචාරණ ගාස්තු දමා කියා තිබෙනවා. ෆොටෝ ගහන්ද මේ.

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මන්ත්‍රිතුමා මේ අපේ ශබ්ද විකාශන යන්ත්‍ර කැඩිලා වැඩ කරන්න නැතුව ගිහින් . ඒ යන්ත්‍ර දෙකක් ගෙනවිත් වාහනයේ බැඳගෙන ගියානේ . අන්න එක. දවස් තුනට රු.1500/= ගණනේ රු.4500/=ක්.

**තීරණය**

2020 අප්‍රේල් මාසයට අදාළ පොදු වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය හා 2020 අප්‍රේල් මස ලැබීම් විග්‍රහය පිළිගත යුතු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

10 ඇස්තමේන්තු :-

**10.01 තල්ගස්ගොඩ පාරෙන් අතුරු පාර කොන්ක්‍රීට් කිරීම සඳහා රු.280,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මෙම ඇස්තමේන්තුව ඉවත් කිරීමට කටයුතු කරන නිසා එය ඉවත් කරනවා.

**තීරණය-**

තල්ගස්ගොඩ පාරෙන් අතුරු පාර කොන්ක්‍රීට් කිරීම සඳහා රු.280,000/- ක ඇස්තමේන්තුව ඉවත් කිරීමට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් තීරණය කරන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේ ඇස්තමේන්තුව දමන විට කාගේ හරි මාර්ගයේ නිවෙසියෙකුගේ නමක් දමන්න. නැතිනම් මේක දමනවා තල්ගස්ගොඩ පාරෙන් අතුරු පාර කියා. අතුරු පාරවල් කියක් තිබෙනවාද ?

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

තල්ගස්ගොඩ නෙමේ. පොල්වත්තේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා  කතා කරමින්</u>
හැබැයි මේක කොහොමත්ම දෙන්න බැහැ. මේක හඳුනා ගන්න වෙන්න ඕනේ. තල්ගස්ගොඩ කියා මෙහි දමා තිබෙන්නේ. තල්ගස්ගොඩ කිවුවාම අපි විශේෂයෙන් බලනවා. ඔබතුමාගේ කොට්ඨාශයේ නිසා. පාර අරම්භයේ නමකුයි පාර අවසානයේ නමකුයි යොදන්න. එය ලියා දමන්න ඕන.

<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

මමත් ඕක හෙව්වා. නන්දන රාජපක්ෂ මන්ත්‍රීතුමා තමයි කියා තිබෙන්නේ. මේ පොල්වත්ත කෘෂි කර්මය අසළ පාර .

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා  කතා කරමින්</u>
ඉතිං ඔයා සම්බන්ධ වෙන්නේ නැද්ද ඕකට. දැන් මෙහෙම දැම්මා ම තල්ගස්ගොඩ අතුරු මාර්ගය. අපි ඔහේ අනුමත කරනවා. මා විශේෂයෙන් තල්ගස්ගොඩ කිවුවාම වැඩය කරන්න ඕන නිසා බලනවා.

**10.02 නගර සභා ක්‍රීඩාංගනයේ පුහුණු පැති විකට්ටු ඉදිකිරීම සඳහා රු.900000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

නගර සභා ක්‍රීඩාංගනයේ පුහුණු පැති විකට්ටු ඉදිකිරීම සඳහා රු.900000/- ක ඇස්තමේන්තුව ඉදිරිපත් කර තිබෙනවා.

**තීරණය-**

නගර සභා ක්‍රීඩාංගනයේ පුහුණු පැති විකට්ටු ඉදිකිරීම සඳහා රු.900000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී  ඒ.ඩබ්.ජගත් කුමාර  මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.03 නගර සභා ක්‍රීඩාංගනයේ ක්‍රීඩාගාරය ඉදිරිපිට පොළොව ඉන්ටර්ලොක් ගල් ඇල්ලීම සඳහා රු.1050000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

නගර සභා ක්‍රීඩාංගනයේ ක්‍රීඩාගාරය ඉදිරිපිට පොළොව ඉන්ටර්ලොක් ගල් ඇල්ලීම සඳහා රු.1050000/- ක ඇස්තමේන්තුව

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

දැන් අපි හැම එකම අනුමත කරනවා. හැබැයි නිත්‍යානුකූල වෙන්න ඕන. නිත්‍යානුකූල නොවන විදියට එනවා නම් ඒක කරන්න බැහැ. එහෙමනම් මන්ත්‍රීවරු දැනුවත් වෙන්න ඕන. අනිත් ඒවාට දුරකථනයෙන් කතා කරනවා වගේ. ඕක වෙන්න ඕන. දැන් ඕක වෙලා ඉවරයිනේ.

**මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

නැහැ . මේ වැඩය සිදුවෙලා නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මේකට මුදල් යෙදෙව්වානේ. සභාව මෙයට ලබා දීලා තිබෙනවා. එහෙනම් ඔගොල්ලන් ගෙවා ගන්න. අපේ විරෝධතාවය ලියා ගන්න. දැන් ඉතිං මෙහෙමයි . අපි සහායෝගය දෙනවානේ. මෙය එක එක්කෙනාගේ පෞද්ගලික බුදල් වගේ මෙය පාවිච්චි කරන්න බැහැනේ. මා අහන්නේ පෞද්ගලික බුදල් වගේ මෙය පාවිච්චි වෙන්න බැහැ. ඉතිං කොහොමද කරන්නේ. මේවාට අනුමැතිය නොදී ඉන්නේ නැහැ. සහායෝගය දෙනවානේ. ඉතිං මොකක් හරි කරලා මොකක් හරි එකක් මෙතනට දමනවා මෙය ගෙවන්න කියා. දැන් මේක මෙහෙම කරන්න බැහැ. මේක යම් ක්‍රමවේදයකට යන්න ඕන. බලය තිබුණා කියා මේක තිබුණා කියා මේ අපි මහජන මුදල් වියදම් කරන්නේ. මහජන මුදල් වැය කරන කොට යම් ක්‍රමවේදයක් තිබෙන්න ඕන. කිසි ගැටළුවක් නැහැ. අපි ඒවාට අනුමැතිය දෙනවානේ. දැන් මේ වගේ ගෙවන්න බැහැ. එමනිසා මෙය එකපාරක් හරි

**මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

අපි යෝජනාවක් කරන්නම්  මේ යෝජනා මේ සභාවට දමන්නම්. අපි ලබන සභාවට මේ ඇස්තමේන්තු දමන්නම්. මමත් කැමති නැහැ මේ යෝජනාවයි

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

අන්න එකයි. අපි කියන්නේ සැලසුමක් තියෙන්න ඕන. මා දන්නේ නැහැ.

**මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

අපිට ඉස්සෙල්ලා ඔගොල්ලන් අසුවන්නේ මේකට.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

නැහැ. අපි අසුවන්නේ නැහැ. අපි විරුද්ධ වෙලා තිබෙන්නේ. අපි කිහිප දෙනා විරුද්ධවෙලා ඔගොල්ලන් කිහිප දෙනා අනුමත කර ගන්න. වෙන කරන්න දෙයක් නැහැ මේකට. මේක ගෙදර තිබෙන මුදල් වැය කරනවා වගේ වැඩක්නේ කරන්නේ. හිතෙන හිතෙන විදයට අරක කරනවා

මේක කරනවා. අපිත් එදත් අනුමැතිය දුන්නා. මොකක්ද නැරඹුම් මැදිරියක් ද මොකක්ද හදනවා කියා. එදත් අනුමැතිය දුන්නා. කරන්න ඕන. කරන්න ඇයි නැත්තේ සැලසුමක් නැත්තේ. අන්තිමට මේ මන්ත්‍රීතුමා ඇසුවා කියක් වියදම් වෙලා තිබෙනවාද කියා. එය සභාගත කරන්න කියා. දැන් කොනක් පටක් නැහැ. දැන් කොනක් පටක් නැහැ.

<u>**මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ගරු මන්ත්‍රීතුමා මා යෝජනාවක් කරන්නම්.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ඔබතුමා යෝජනා කරන්න ඉස්සරවෙලා අපේ ප්‍රශ්න වලට පිළිතුරු සපයා දෙන්න.මේක හරිද වැරිද කියන්නකෝ. මේ ගෙනියන ක්‍රමවේදය හරිද වැරදිද ? ඉතිං නිත්‍යානුකූල නොවන එකකට අපිට අනුමැතිය දෙන්න බැහැ. එහෙනම් මේ පාර විතරක් මෙය දෙනවාද නැතිනම් මෙය පරද්දවනවා ද? එහෙනම් විරුද්ධයි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, දැන් යෝජනාවකින් තොරව ඇස්තමේන්තුවක් සකස් වෙලා තිබෙනවා. ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබෙනවා. දැන් මා යෝජනා කරලා යෝජනා සම්මත වුණු එකක්. දැන් අවුරුද්දක් විතර වෙනවා. දුම්රියපොළ ස්ථානයේ දොර ගලනවා ව්‍යාපාරයක් මැදින් . එකේ ඇස්තමේන්තුව අද වෙනකම් නැහැ. ගරු සභාපතිතුමා පොරොන්දු වුණා මේක දෙන්නම් කියා. නමුත් කෝ අදත් තිබෙනවා නම් ඉදිරිපත් කරන්න. එහෙමනම් ඇයි ක්‍රියාත්මක කරන්නේ නැත්තේ. දැන් මේ යෝජනා නැහැ. ඇස්තමේන්තු ඉදිරිපත් කර තිබෙනවා. අපි යෝජනා කර සම්මත වෙලා ඇස්තමේන්තුව නැහැ. ඒ අපි ජනතා විමුක්ති පෙරමුණේ නිසාද? එහෙම කරන්න එපා.

<u>**මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

විෂය ලිපිකරු සිටිනවාද ? මේ ගැන සොයා බලන්න. කියක විතර ඇස්තමේන්තුවක්ද

<u>**ගරු නගර සභා මන්ත්‍රී අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, සභාවක් විදියට අපේ සභාවේ සියළු දේවල් වලට සහයෝගය දක්වනවා. ඒවා අනුමත කරනවා. යෝජනා වලින් තොරව ඇස්තමේන්තු හදනවා. සභාවක් විදියට ගරු සභාපතිතුමාටයි සියළු මන්ත්‍රීවරුන්ටයි සහයෝගය දක්වනවා මේ වැඩ කටයුතු සිදු කරගෙන යන්න. අපි මෝඩයෝ නෙමේ. අපි මේ ධර්මාශෝක විද්‍යාලයේ ගණකාධිකරණය කර ඉගෙනගත් මිනිසුන්. ඉතිං අපි විරුද්ධ වුණොත් එහෙම කියයි අපි ක්‍රිඩාංගණය හදනවාට විරුද්ධයි කියා. එමනිසා මේවා විනිවිදභාවයකින් තිබිය යුතුයි. මා කියා සිටිනවා ඒ විනිවිදභාවයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

එහි වගකීම ලේකම්තුමිය. ලේකම්තුමිය මෙතැනට දමන විට නිත්‍යානුකුල නොවන කිසිම දෙයක් මෙතැනට දමන්න එපා. මින් ඉදිරියට.

<u>**මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ඇස්තමේන්තු ටික සම්මත කරනවාද නැද්ද? මේ වැඩ කෙරෙන්න ඕන. මේ යෝජනා ටික සම්මත කරන්න. ඇස්තමේන්තු ටික ලබන සභාවට ඉදිරිපත් කළොනම් හොඳයි. මොකද අපි කවුරුත් අපේ මුදල්වලින් නෙමේ. ජනතාවගේ බදු මුදල් වලින් යන නිසා මේ ඇස්තමේන්තු ටික ලබන සභාවට ඉදිරිපත් කරනවා. මේ නගර සභා ක්‍රිඩාංගණයේ ඉන්ටලොක් ගල් ඇල්ලීමේ කර්මාන්තය මා මේ සභාවට යෝජනා කරනවා කරන්න ඕන කියා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්**</u>

මා එවා ස්ථිර කරනවා.

**තීරණය-**

නගර සභා ක්‍රීඩාංගනයේ ක්‍රීඩාගාරය ඉදිරිපිට පොළොව ඉන්ටර්ලොක් ගල් ඇල්ලීම සඳහා රු.1050000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.04 හල්වතුර සහ විලේගොඩ යාකරන පාරේ බෝක්කුව ඉදිකිරීම සඳහා රු.2000000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

<u>**මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

හල්වතුර සහ විලේගොඩ යාකරන පාරේ බෝක්කුව ඉදිකිරීම සඳහා යෝජනා කරනවා. පනියන්දුව හරස් පාර අලුත්වැඩියාව සඳහා යෝජනා කරනවා. නගර සභා ක්‍රීඩාංගනයේ ලකුණු පුවරුව ඉදිකිරීම සඳහා යෝජනා කරනවා. මේ සඳහා යෝජනා මේ සභාවට ඉදිරිපත් කරනවා. ඇස්තමේන්තු ලබන සභාවට ඉදිරිපත් කරන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**</u>

ඔබතුමා එහෙම ඇස්තමේන්තු සභාව අනුමත කළාට අපි ඔබතුමාලාට උදවු කර තිබෙනවා. මේ වතාවේ අපි උදවු කළාට නිත්‍යානුකුලව මීට පසු ඉදිරිපත් කිරීම් කරන්න. එතකොට අපිත් අපහසුතාවයට පත්වෙනවා. අපි නවක මන්ත්‍රීවරු. මොනවාහරි අධිහාර වෙන්න ගත්තොත් අපට ගෙවන්නත් වෙයි. මේ අවස්ථාවේදි අනුමත කරන්න. මොකද මේ ලකුණු පුවරුව අවශ්‍යයි.

**තීරණය**

හල්වතුර සහ විලේගොඩ යාකරන පාරේ බෝක්කුව ඉදිකිරීම සඳහා රු.2000000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා කාරුණිකව ඉල්ලා සිටිනවා මන්ත්‍රීවරුන්ගෙන් මේ ක්‍රිඩාංගණය සෑදුනේ නැහැ. එමනිසා මෙය මාසයකට එක පාරයි මේ සභාව තිබෙන්නේ. පුළුවන්නම් මේ ඇස්තමේන්තු ටික දමා මේ සභාවට කරන්න කියා. පසුවට දමන්න එපා කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මට තාක්ෂණසේවා නිලධාරි මහතාගෙන් ප්‍රශ්නයක් ඇසිමට තිබෙනවා. මේ ක්‍රිඩාගාරය ඉදිකර තිබෙන තැන ජලය රැදෙනවා. මට දැනුම නැහැ. මා ඔබතුමාට දැනුම තිබෙන නිසා අසන්නේ. එතැන ජල මට්ටම හා දිය සිරාව තිබෙන තැනක්. අපි කුඩා කාලයේ සිටම දන්නවා. එතකොට ඔතන ඉන්ටර්ලොක් ඇල්ලීමේදි ඒ අවශ්‍ය තාක්ෂණික දැනුම ද අවශ්‍ය කරන්නේ කියා මා අසනවා. අපි අපහසුතාවයට පත් වෙනවා. මොකද ක්‍රිකට් තරඟයක් කරන අවස්ථාවට ඔතන ඉන්ටර්ලොක් මඩේ පාවෙයි. එමනිසා නොදන්නා කමට අසන්නේ. එම ක්‍රමවේදය හරිද? දැන් මේ ක්‍රිඩාංගණයේදි තණකොළ ඇල්ලීමේදි වතුර මට්ට ලකුණු කරානේ. ඒ අනනතිය සමඟ මා එකඟයි. මේ අනනතියත් සමඟ පිට්ටනියේ වතුර මට්ටම බලන්නේ නැතුව ඒ මට්ටම තියන්නේ නැහැනේ. අපි මේ සියළු දෙනාම දන්නවා. එතන පොකුණ වගේ වතුර වල. ක්‍රිඩාගාරය ඉදිරිපිට. ඔක්කොම අනතියට වතුර බැස්ම එතනට තිබ්බොත් එහෙම වතුර පිරෙනවානේ. ඒ වතුරේ තමයි මේ ගල් අල්ලන්නේ. ගල් වලට මෙහායින් ඉදිකර තිබෙන කාණුව ප්‍රමාණවත්ද මේ වතුර බැසිමට. මා එකඟයි හැබැයි අවසානයේදි ඉන්ටර්ලොක් අල්ලා වතුර පිරුණොත් එහෙම අපට අන්තිමට පාරේ බැහැලා යන්න බැරි වෙනවා. ඊළඟට හල්වතුරේ ලොකු ඇස්තමේන්තුවක් නැහැ. වැලි කියුබ් 10ක් දමන්න තිබෙන්නේ. දැන් එය විවෘත කරන්න තිබෙන්නේ. අපි නෙමේ එම කර්මාන්තය කරනු ලැබුවේ. ප්‍රාදේශිය ලේකම් එකෙන්. එකෙන් දැන් අපට භාර දිලා ඉබ්බා දමා තිබෙනවා. පොඩි ළමුන්ට සෙල්ලම් කරන්න විදියක් නැහැ. ගල් කුඩු දමා තමයි ඒ අය හදා තිබෙන්නේ. ඉතිං මා තමයි යෝජනා කළේ පස් කියුබ් 10ක් දමා මෙය හදා දෙන්න කියා. මොකද එය විවෘත කර දෙන්න ඕන ළමුන්ට සෙල්ලම් කරන්න. මා කියන්නේ එය අනුමත කර දෙන්න කියා. මෙයට සම්බන්ධයක් නැහැ. නැහැ නැහැ එය මේවාට අදාළ නැහැ. එක අපි කරලා නැහැනේ. මේ ගොල්ලන් විරුද්ධ වෙන්නේ දැනට ඇස්තමේන්තු කරන්න කලින් කරපු කර්මාන්ත. කරන්න ඉල්ලන්නේ. මේක සාමාන්‍ය ක්‍රමය. ඒ යෝජනාව තමයි අනුමත කරන්න කිවුවේ.

❖ පස්වරු 2.45 ට පමණ ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා ගරු සභාවට පැමිණියහ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීවරු මොකද කියන්නේ. අකමැති මන්ත්‍රීවරුත් ඉන්නවාද? න්‍යාය පත්‍රයට ඇතුළත් නොවූ ඇස්තමේන්තු 5ක් තිබෙනවා. නගර සභා ක්‍රීඩාංගණයේ පුහුණු පැති ක්‍රීඩාංගණය ඉදිකිරිම, නගර සභා ක්‍රීඩාංගණයේ ක්‍රීඩාගාරය ඉදිකරන තැන පොළව ඉන්ටර්ලොක් ගල් ඇල්ලීම , හල්වතුර හා විලේගොඩ යා කරන පාරේ බෝක්කුව ඉදිකිරිම , නගර සභා ක්‍රීඩා පිටියේ ලකුණු පුවරුව ඉදිකිරිම. පනියන්දුව හරස් පාරේ අලුත්වැඩියාව.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මේ යෝජනා සඳහා අනුමැතිය දුන්නා. ඊට පස්සේ අනුමත කරලා කරන්න කිවුවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

යෝජනා වාරයේ ඇතුළත් කිරිම සම්බන්ධව විරෝධතාවයක් තිබෙනවාද? සම්මතයි. මේ දෙකම දෙපැත්තට ඇතුළත් කරන්න.

**10.05 පනියන්දුව හරස් පාර අලුත්වැඩියාව සඳහා රු.530000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

පනියන්දුව හරස් පාර අලුත්වැඩියාව සඳහා රු.530000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.06 නගර සභා ක්‍රීඩාංගනයේ ලකුණු පුවරුව ඉදිකිරීම සඳහා රු.1900000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

නගර සභා ක්‍රීඩාංගනයේ ලකුණු පුවරුව ඉදිකිරීම සඳහා රු.1900000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

11.

වෙනත් කරුණු

12. **න්‍යාය පත්‍රයට ඇතුළත් නොවූ වෙනත් කරුණු :**

**12.01 කොරෝනා වෛරසය ආසාධිත පුද්ගලයින් ජීවත් වන ප්‍රදේශවල සිට අම්බලන්ගොඩ නගර සභා සීමාවට ඇතුළු වන පුද්ගලයින්ගේ සංචරණය සම්බන්ධවයි යන මැයෙන් අම්බලන්ගොඩ මූලස්ථාන පොලීසිය විසින් එවා ඇති ලිපිය ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

කොරෝනා වෛරසය ආසාධිත පුද්ගලයින් ජීවත් වන ප්‍රදේශවල සිට අම්බලන්ගොඩ නගර සභා සීමාවට ඇතුළු වන පුද්ගලයින්ගේ සංචරණය සම්බන්ධවයි.2020.04.15 දින ලිපිය හා බැඳේ. අම්බලන්ගොඩ නගර සිමා කොට්ඨාශය තුළ කළුතර හා බේරුවල ප්‍රදේශවල වෙළඳහිමියන් විසින් බඳු පදනම මත ලබා ගත් වෙළඳසැල් සැලිකිය යුතු ප්‍රමාණයක් පවතින අතර ඇඳිරිනිතිය පවතින කාලය අතර එම දිස්ත්‍රික්ක අතර සංචරණය නවතා තිබූ අතර එම වෙළඳ ව්‍යාපාරිකයන් අම්බලන්ගොඩ නගර සිමාව ඇතුළට ඇතුල් වී මාගේ ස්ථානයේ රාජකාරි කටයුතු කරන උප පොලිස් පරික්ෂක නිලධාරියා ඇතුළු ස්ථානිය නිලධාරියා , බුද්ධි නිලධාරින් ඇතුළු මහජන සෞඛ්‍ය පරික්ෂක මහතා විසින් පරික්ෂා කරන ලදී. ඒ අනුව කළුතර දිස්ත්‍රික්කයේ හා බෙරුවල ප්‍රදේශයේ  වෙළඳ ව්‍යාපාරිකයන්  අම්බලන්ගොඩ ප්‍රදේශයේ ඇති වෙළඳ සැල්වලට ඇතුල් වී නොමැති බව ආවරණය විය. තවද ඌරවත්තේ ප්‍ර දේශයේ කළුතර වින්ස්ක්‍රින් ආයතනය සහ අම්බලන්ගොඩ පැෂන් ෆෙයාර් ආයතනයේ එම සේවකයන් කළුතර දිස්ත්‍රික්කයේ සිට ඇඳිරිනිති බලපත්‍ර ලබා ගෙන ආරක්ෂිත ලෙස වෙළඳාම් කටයුතු කර ඇත. තව දුරටත් පරික්ෂා කිරිමේදි වෙනත් කිසිදු ආයතනයක් අම්බලන්ගොඩ වෙළඳ සැල් වෙත ඇතුළු වී නොමැති බව දන්වා ඇත. මේ වාර්තාව දැන ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත. මුලස්ථාන පොලිස් ස්ථානාධිපතිතුමා විසින් ලිපියක් එවා තිබෙනවා. මෙය දැන ගැනිම සඳහා. මොකද කලින් මහජන උද්ඝොෂණයක් තිබුණා. මෙහෙම තිබෙනවා කියා. එහිදි මා අම්බලන්ගොඩ නගර සභාවේ සභාපතිවරයා වශයෙන් මා 2020.04.15 දින දිස්ත්‍රික් ලේකම් , දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අමතමින් ඒ වගේම  දකුණු පළාත් නියෝජ්‍ය පොලිස්පතිතුමා අමතමින් , ජේෂ්ඨ පොලිස්පති ඇල්පිටිය අමතමින් , ස්ථානභාර පොලිස් ස්ථානධිපති අම්බලන්ගොඩ , මුලස්ථාන පොලිස් ස්ථානාධිපති අමතමින් මේ සම්බන්ධව කරුණු දක්වා සිටියා. මේ ගැන සැලකිලිමත් වෙන්න. මෙවැනි පුද්ගලයන් සිටිනවා කියා. ප්‍රදේශවාසින් අතර මතයක් තිබෙනවා . පරික්ෂණය කර වාර්තා කරන්න.

**තීරණය-**

**කොරෝනා වෛරසය ආසාධිත පුද්ගලයින් ජීවත් වන ප්‍රදේශවල සිට අම්බලන්ගොඩ නගර සභා සීමාවට ඇතුළු වන පුද්ගලයින්ගේ සංචරණය සම්බන්ධවයි** යන මැයෙන් අම්බලන්ගොඩ

මූලස්ථාන පොලීසිය විසින් එවා ඇති ලිපිය ගරු සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

**12:02 කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා කමිටුවක් පත් කළ යුතු බවට 2020.01.07 දින ගත් සභා තීරණය අනුව කමිටුවක් පත්කරන ලෙස ඉල්ලා සෞඛ්‍ය විෂය නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය 2020.01.07 පැවති අංක 05.01.07 යටතේ සභාතීරණයක් ගෙන තිබෙනවා කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරිමට කමිටුවක් පත් කිරීමට අනුමැතිය ලැබී තිබෙනවා. ඒ සඳහා මේ යෝජනාව මා විසින් යෝජනා කරලා නිලානි මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කර තිබෙනවා. ඒ කමිටුව සඳහා මන්ත්‍රීවරු නම් කරන්න. ඒ සඳහා ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා, නගර සභා මන්ත්‍රීනී ඩබ්.එම්.නිලානි මෙනවිය, මා යෝජනා කරනවා. මේ කමිටුවේ මාත් සිටනවා සභාපතිවරයා නිසා. තවත් මන්ත්‍රීවරු ඉන්නවාද ? ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා, අපේ ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන් ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා, මේ ප්‍රශ්නය විසඳන්න අපේ ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා, එතුමාගේ කොට්ඨාශයේ නිසා. ගරු නගර සභා මන්ත්‍රීනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය සහ ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා ඇතුළත් කර එම කමිටුව සාදන්න.

**තීරණය-**

කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා කමිටුවක් පත් කළ යුතු බවට 2020.01.07 දින ගත් සභා තීරණය අනුව කමිටුවක් පත්කරන ලෙස ඉල්ලා සෞඛ්‍ය විෂය නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා, ගරු නගර සභා මන්ත්‍රීනී ඩබ්.එම්.නිලානි මෙනවිය,ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා, ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා, ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා, ගරු නගර සභා මන්ත්‍රීනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය සහ ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා යන මන්ත්‍රීවරුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත්කිරීම සුදුසු බවටත් කමිටුවේ සභාපති ලෙස ගරු සභාපතිතුමා කටයුතු කරන බවටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින්

යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12:03 අම්බලන්ගොඩ ප්‍රධාන බස් නැවතුම්පොල වැසිකිළි පද්ධතිය සඳහා අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමට අදාල ආයතන විසින් සපුරා තිබිය යුතු සුදුසුකම් හා එහි පිරිවිතර පිළිබඳ තාක්ෂණ සේවා නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ ප්‍රධාන බස් නැවතුම්පොල වැසිකිළි පද්ධතිය සඳහා අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමට අදාල ආයතන විසින් සපුරා තිබිය යුතු සුදුසුකම් හා එහි පිරිවිතර පිළිබඳ තාක්ෂණ සේවා නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති තාක්ෂණ සේවා වාර්තාව ඉදිරිපත් කරනවා. අම්බලන්ගොඩ බස්නැවතුම්පොළේ ප්‍රධාන වැසිකිළිය සඳහා අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රිකරණ පද්ධතියක් ස්ථාපනය කිරිම සඳහා ටෙන්ඩර් කැඳවීමට අදාල ආයතන විසින් සපුරා තිබිය යුතු සුදුසුකම් හා එහි පිරිවිතර පිළිබඳ විස්තරයක් පහත පරිදි වේ. මේ සඳහා සංශෝධනයන් ඉදිරිපත් කරන තාක්ෂණික කමිටු ඉංජිනේරු මහතා තීරණයක් මඟින් ලබා ගැනීම සුදුසු බව යෝජනා කරමි. ගරු සභාපතිතුමාගේ ඉල්ලිම හා දැනුවත් කිරිම පිළිබඳ මෙය ඉදිරිපත් කර ඇත.

01. මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතනය සමාගමක් ලෙස ලියාපදිංචි විය යුතු අතර සමාගම් නම්ටික ඉදිරිපත් කළ යුතුයි.

02. මධ්‍යම පරිසර අධිකාරිය යටතේ අදාළ සේවාව සැපයිම පිළිබඳ ක්ෂේත්‍රයේ ඇති අවම වසරකට වැඩි කාලයක් ගත වි තිබිය යුතුය.

03. තමන් සවි කිරිමට බලාපොරෝත්තු වන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රිකරණය කිරිම සඳහා මධ්‍යම පරිසර අධිකාරයෙන් නිර්දේශයක් ලබා තිබිය යුතුය.

04. අදාළ විස්තරය පිළිබඳ වසර 20කට වැඩි කාලයක් පළපුරුද්ද තිබිය යුතු අතර දේශිය සමාගමට හෝ භාණ්ඩ නිෂ්පාදනය කරන සමාගමකට හෝ විදේශිය සමාගමකට තිබිය යුතුය. එය තහවුරු කිරිම සඳහා ඉදිරිපත් කළ යුතුය.

05. ප්‍රතිචක්‍රිකරණය කර පරිසරයට මුදා හරින ලද ජලය සංයුතිය මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශය අනුව අනුකුල විය යුතුය.

06. මිට පෙර මෙම ඒකකය සපයා ඇති විස්තර ආයතනය වෙත ඉදිරිපත් කළ යුතුය. රජයේ ආයතන , පුද්ගලික ආයතන වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.

07. පෙර සැකසුම් කර ඇති ප්‍රතික්කාරකයක් විය යුතුය.

08. පෙර පිවිසුම් ෆයිබර් වැනි ද්‍රව්‍ය වලින් සැදිය යුතු එකට සම්බසන්ධ කළ හැකි පද්ධතියක් තුළ තිබිය යුතුය.

09. මෙම උපකරණය ලබා ගත් වෙනත් ආයතන සවිකර යලි භාවිතයට ගැනීමට හැකියාව තිබේද

10. අමතර පිටතින් සවිකරන ලද පෙරහන නැවත මාරු කිරිම සඳහා විදුලිය භාවිතා කළහැකි ක්ලෝරින් කළ හැකි නොතිබිය යුතුය.

11. ප්‍රතික්‍රියා කළ ඇතුළින් සවිකළ හැකි විදුලි උපකරණයක් තිබිය යුතුය.

12. අවම වශයෙන් වසර 3කට වගකිමක් තිබිය යුතුය. වසර 5ක් සේවා ගාස්තුවකට නඩත්තුවට යටත් විය යුතුය.

13. අදාළ ස්ථානයේ ඉඩකඩ සිමිත බැවින් ස්ථානය පරික්ෂා කර බලා සම්පූර්ණ පද්ධතිය ස්ථානය කර වැඩ අවසන් කිරිම සඳහා ගණන් හා යෝජනා ඉදිරිපත් කළ යුතුය.

14. සැපයුමට අදාළ උපකරණ හා කොටස් මිලදි ගැනිම සිදු කරයි නම් ඒ ඉදිකරණ ආයතනය දේශිය නියෝජිතයා ලෙස ආයතනය නම්කළ සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

15. යෝජනා කරන උපකරණය හෝ පිරිවිත මිළ ගණන් සමඟ ඉදිරිපත් කළ යුතුය.

16. පද්ධතිය සවිකිරිමේ ක්‍රියාත්මක කිරිමට ගතවන කාලය අවම වීම. විශේෂ සුදුසුකමක් වන අතර ඒ අතර කාලය සඳහන් කළ යුතුය. පොළව යට පද්ධතිය ස්ථාපනය කළ යුතුය. සවිකරණ ලද ජල ප්‍රතික්‍රියාවේ ධාරිතාව ගණනය කිරිම සඳහා දත්ත එකතු කිරිම නගර සභාව සමඟ එකාබද්ධව සිදු කර එහි ධරිතාව සඳහා එහි පද්ධතියේ ගණන් ඉදිරිපත් කළ යුතුය. අවම ටැංකි සංඛ්‍යාවක් පද්ධතියක සකස් විය යුතුය.

මේ යටතේ ටෙන්ඩර් කිරිමට බස්නැවතුම්පොළ සඳහා පිටුපස තිබෙන වැසිකිළි පද්ධතිය සවිකිරිමට. හරි ඒවා හරවන්න පුළුවන්.

<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි දැන් හදලා තිබෙනවා නේද කොටසක්.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

දැන් හදලා තිබෙනවා කොටසක්. දැන් මේකේ තිබෙන්නේ මෙහෙමයි. අපේ වැසිකිළි පද්ධතිය තිබෙන ස්ථානය මඩ සහිත ප්‍රදේශයකි. එමනිසා වතුර වැසිකිළි වළට එනවා. එක වළකන්න නිවැරදි ක්‍රමයක් සකස් කරන්න ඕන. අපි හොයාගත්ත දියුණු ක්‍රමයක්. ජපානයේ යොදා ගත් ක්‍රමයක්. අපිට මෙය සවිකරලා ඉතාමත්ම සෞඛ්‍ය ආරක්ෂිතව කටයුතු කරන්න. යම් මිලක් ගියත් කරන්න ඕන

**ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමා තව එකක් තිබෙනවා. දැන් අර ගඩොල් කැලි අරවා මේවා තිබෙනවා. එය ඉදිරිපිට දමා. තවම පටවා ගෙන ගිහින් නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපේ කාර්මික නිලධාරි මහත්වරු ඉන්නවාද ? ඒක සුද්ද කර දෙන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ඔය සම්බන්ධව දේශනයක් පැවැත්වුවා මීට වසර 15කට පෙර කරපු එකක් පිළිබඳව. මට ඒ මහතාගේ නම මතක නැහැ. බටපොළ ප්‍රදේශයේ සිටින්නේ. කණ්ඩල හෝටලයේ මේ ව්‍යාපෘතිය කරනු ලැබුවේ මෙතුමායි. එතුමා වැසිකිළියේ වතුර පෙන්නවා පිරිසිදු කරලා. මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙනවා. එම හෝටලයේ කඩදාසි ආදි සියළුම දේවල් වෙන්කර පෙන්වනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

පිරිවිතර යටතේ ඕන කෙනෙකුට ටෙන්ඩර් කරන්න පුළුවන් .

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ඒ ඉංජිනේරු මහතා බටපොළ. පොඩ්ඩක් හොයා බලන්න. අපිට කරදරයක් නැහැ. ඔය එක එක දෙකයි පනහේ ආයතන වලට දි කරනවාට වඩා. මොකද මේ වගේ ඒවා හැමෝම කරන්නේ නැහැනේ. ඒක නිසා. දන්න නිසා.

**තීරණය-**

අම්බලන්ගොඩ ප්‍රධාන බස් නැවතුම්පොල වැසිකිළි පද්ධතිය සඳහා අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමට අදාල ආයතන විසින් සපුරා තිබිය යුතු සුදුසුකම් හා එහි පිරිවිතර පිළිබඳ තාක්ෂණ සේවා නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව ගරු සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

**12:04 අම්බලන්ගොඩ, පින්නදූව, අංක 81 හි පදිංචි එන්.ඩබ්.ඩෙස්ලින් ඩොරින් මහත්මියගේ ස්වාමි පුරුෂයාගේ ආදාහන කටයුතු සිදුකිරීම සඳහා රු.6000/- ක මුදලක් නගර සභාවට ගෙවූ බවත්, එයින් සමෘද්ධි සහන මුදල වන රු.2000/-ක මුදල ලබාදෙන ලෙස ඉල්ලා එවා ඇති ලිපිය සභාගත කරන ලදි.**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

අම්බලන්ගොඩ, පින්නදූව, අංක 81 හි පදිංචි එන්.ඩබ්.ඩෙස්ලින් ඩොරින් මහත්මියගේ ස්වාමි පුරුෂයාගේ ආදාහන කටයුතු සිදුකිරීම සඳහා රු.6000/- ක මුදලක් නගර සභාවට ගෙවූ බවත්, එයින් සමෘද්ධි සහන මුදල වන රු.2000/-ක මුදලක් ආපසු ගෙවීමට අනුමැතිය ඉල්ලා සිටිනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ, පින්නදූව, අංක 81 හි පදිංචි එන්.ඩබ්.ඩෙස්ලින් ඩොරින් මහත්මියගේ ස්වාමි පුරුෂයාගේ ආදාහන කටයුතු සිදුකිරීම සඳහා රු.6000/- ක මුදලක් නගර සභාවට ගෙවූ බවත්, එයින් සමෘද්ධි සහන මුදල වන රු.2000/-ක මුදල ලබාදෙන ලෙස ඉල්ලා එවා ඇති ලිපිය අනුව එම පවුල සමෘද්ධි පවුලක් හේතුවෙන් රු.2000/- ක් නැවත ගෙවීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12:05 පාර්ලිමේන්තු මැතිවරණය - 2020 , වැලිගම නගර සභාවේ සභාපති පාර්ලිමේන්තු මැතිවරණයේ අපේක්ෂකයකු ලෙස ඉදිරිපත්ව සිටියදී වැලිගම නගර සභාවේ සභාපති ලෙස රාජකාරි ඉටුකිරීම යන මැයෙන් එවන ලද ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

පාර්ලිමේන්තු මැතිවරණය - 2020 , වැලිගම නගර සභාවේ සභාපති පාර්ලිමේන්තු මැතිවරණයේ අපේක්ෂකයකු ලෙස ඉදිරිපත්ව සිටියදී වැලිගම නගර සභාවේ සභාපති ලෙස රාජකාරි ඉටුකිරීම යන මැයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් එවා තිබෙනවා. නමුත් මේ නගර සභාවටත් අදාළයි. අපේ නගර සභාවේත් අපේක්ෂයන් දෙදෙනෙකු සිටින නිසා මා මේ සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරනවා. වැලිගම නගර සභාවේ සභාපති පාර්ලිමේන්තු අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වී තිබෙනවා. සභාපතිවරයෙකු ලෙස රාජකාරි කටයුතු ඉටු කිරිම. මේ කාරණය පිළිබඳව වැලිගම නගර සභාවේ ලේකම්ට පිටපත් සහිතව පළාත් පාලන ලේකම්වරයාට විසින් මාතර නගර සභාවේ ලේකම්වෙත , දැනුම් දි ඇත. නැවත දැනුම් දෙන්න යවා තිබෙනවා. මෙන්න මේ කරුණු තමයි අවධානය යොමු කරන්න කියන්නේ. අපේ මන්ත්‍රීවරයෙකු හෝ කවුරු හෝ මැතිවරණයකට ඉදිරිපත් වෙනවා නම් අදාළයි කියා දැන ගැනීම සඳහා ඉදිරිපත් කරනවා.

01. නගර සභා ආඥා පණතේ 255 අධිකාරිය මඟින් නගර සභා බලතල මෙන්ම නගර සභා කාර්යයන් පාලනය කළ යුතුය පවත්වාගෙන යා යුතු ආකාරය, සම්පත් භාවිතා කළ යුතු ආකාරය සභිකයන් හා සභා රැස්වීමේ සභික ධුරයන් අහිමි වීම යන්න සඳහන් වේ.

02. නගර සභාව ඇතුළු සියළු පළාත් පාලන ආයතන වල ඡන්ද විමසිම් කටයුතු පැවැත්වීම ඊට අනුසාර කරුණු පිළිබඳව පළාත් පාලන ආඥා පණතේ 262 අධිකාරියේ සංශෝධිත විශේෂයෙන් 2017 අංක 17 දරණ පණත මඟින් විධිවිධාන සලසා ඇත.

අම්බලන්ගොඩත් ප්‍රශ්නයක් තිබෙනවා. අම්බලන්ගොඩ හිටපු අපේක්ෂකයන් දෙදෙනාම මැතිවරණයෙන් පසු මෙහි වැඩ කර තිබෙනවා. දෙන්නාම පැමිණ සභාවේ වාඩිවෙලත් තිබෙනවා. සභාවේ දීමනාත් අරගෙන තිබෙනවා. එක නිසා තමයි දැන ගන්න කිවුවේ . මේ වරද දිගින් දිගටම සිදු වුණොත් එහෙම සියළු දෙනාටම දැන ගැනිම පිණිස ඉදිරිපත් කරන්නේ.

**තීරණය-**

**පාර්ලිමේන්තු මැතිවරණය - 2020 , වැලිගම නගර සභාවේ සභාපති පාර්ලිමේන්තු මැතිවරණයේ අපේක්ෂකයකු ලෙස ඉදිරිපත්ව සිටියදී වැලිගම නගර සභාවේ සභාපති ලෙස රාජකාරි ඉටුකිරීම** යන මැයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් එවා ඇති ලිපිය ගරු සභාවේ දැනගැනීම පිණිස ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

**12:06 දකුණු පළාත් ඩෙංගු රෝග මර්දනය පිළිබඳ විශේෂ වැඩසටහන යන මැයෙන් දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

දකුණු පළාත් ඩෙංගු රෝග මර්දනය පිළිබඳ විශේෂ වැඩසටහන යන මැයෙන් දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් එවා ඇති ලිපිය. මේ සම්බන්ධව අපි කලිනුත් දැනුවත් කළා. එමනිසා ඩෙංගු මර්ධන ව්‍යාපෘති තම තමන්ගේ කොට්ඨාශ වල ක්‍රියාත්මක කරන්න.

**තීරණය-**

**දකුණු පළාත් ඩෙංගු රෝග මර්දනය පිළිබඳ විශේෂ වැඩසටහන** යන මැයෙන් දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් එවා ඇති ලිපිය ගරු සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් ඉදිරිපත් කළ අතර තම තමන්ගේ කොට්ඨාසවල ඩෙංගු රෝග මර්දනය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලෙස ගරු මන්ත්‍රීවරුන් හට දැනුම් දෙන ලදී.

- වෙනත් කරුණු

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

වෙනත් කරුණු මොනවා හරි තිබෙනවාද? .

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ලයනල් මල්ලියාවඩු මහතා ගරු සභාවට ලිපියක් එවා තිබෙනවා. ලයනල් මල්යාවඩු , රණසූරිය මාවත , පනියන, අම්බලන්ගොඩ. ඒ මහතා කියා තිබෙනවා. අල්ලපු ගෙදර නිවසේ වහලෙන් බේරෙන ජලය කාන්දු වෙලා තමන්ගේ වැසිකිළි වළ පිරෙනවා කියා. මීට කලින් නගර සභාව මැදිහත්වෙලා තාක්ෂණසේවා නිලධාරින් ගිහින් බලා මෙයට කියා තිබෙනවා පිල්ලක් දමා ගන්න කියා. එය දමා තාක්ෂණසේවා නිලධාරි මහත්වරු පැමිණ ගිය පසු මෙය ගලවා දමා තිබෙනවා. ගලවා දැම්මාම නැවතත් වැසි වසින විට වල පිරෙනවා. එමනිසා මේකට මොකක් හරි ක්‍රියාමාර්ගයක් ගන්න කියා තාක්ෂණසේවා නිලධාරින්ගෙන් ඉල්ලා සිටිනවා. මේ පිළිබඳ පරික්ෂා කර බලන්න කියා. එහි පැහැදිලිව ඡායාරූපයකුත් එවා තිබෙනවා. මේක කරන්නේ දේශපාලන පක්ෂයකුත් කියා තිබෙනවා. කෙසේ නමුත් මෙහි පැහැදිලිවම පෙනෙවා. මා එවන්නම් මේ ඡායාරූපය බලන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මාගේ ගාවත් තිබෙනවා ඡායාරූපය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

එමනිසා මේකට සාධාරණ විසඳුමක් ලබා දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ මන්ත්‍රීතුමිය ඔකට පිළිතුර මා දෙන්නම්. මෙය අද ඊයේ තිබෙන එකක් නෙමේ. වසර 10ක් විතර තිබෙන එකක්. ඕය ප්‍රශ්නයේ අනිත් අය වන්නේ මෙහේ හිටපු ගරු උප සභාපතිවරයෙකු වන උපාලි සිරිසුමන මහතාගේ නිවස සහ ඊට පහළ නිවස . අපි සම්පූර්ණම මෙතැන සිටින නිලධාරින් එයට පියවර ගෙන තිබෙනවා. පියවරට උත්තරත් දී තිබෙනවා. හැබැයි මේ උත්තර දීපු මේවාට මෙයා කවදාවත් සැහිමකට පත්වෙන්නේ නැහැ.අර අයගේ වහලෙන් වැටෙන වතුර මෙයාගේ පැත්තට වැටෙන්නේ නැති වෙන්න එය සම්පූර්ණම කොන්ක්‍රිට් කර තිබෙනවා. එය කාණුවකින් ඉදිරිපසට යන්න හදා තිබෙනවා. ඒ සම්බන්ධව අපේ කාර්මික නිලධාරින් වාර්තා කරන්නේ . දැන් මෙයා සැහිමකට පත්වෙන්නේ නැති නිසා මා ලේකම්තුමියට කිවුවා. අපේ නිලධාරින් දෙන තීරණයට මෙයා සැහිමකට පත්වෙන්නේ නැහැ. එමනිසා මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමියට යවන්නම්. ඊට පසු එය මහජන සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලයේ මහජන සෞඛ්‍ය පරික්ෂකතුමා ලවා අපේ මහජන සෞඛ්‍ය නිලධාරිතුමා නැතිව එතුමිය හරි මෙය පරික්ෂා කර මේ සම්බන්ධව වාර්තාවක් ලබා දෙන්න. මොකද දේශපාලන වශයෙන් අපේ තරහාකාරයෙක්

වුණත් එතුමා ඇත්ත වශයෙන්ම මේ කණ්ඩිය තිබෙන්නේ . මේ කණ්ඩිය කවුද කැපුවේ. කණ්ඩිය කැපුවේ කවුරුවත්. කණ්ඩිය බැද්දේ අනිත් මිනිසුන් විසින්. ඒ අය බැද්දට පස්සේ මේ කණ්ඩියෙන් වතුර එනවා කියා මෙයාගෙන් පැමිණිල්ලක් තිබ්බා. ඒ අය එහි උඩ තටුටුව කොන්ක්‍රිට් කර තිබෙනවා. අනිත් පැත්තටත් දමා තිබෙනවා. කොච්චර වුණත් අපි මේ තනතුරු වල සිටියත් අපි සර්ව සාධාරණ විය යුතුයි. එමනිසා අපේ නිලධාරින් දෙන වාර්තාව එයා පිළිගන්නේ නැතිනම් අපි ඊට වඩා ස්වාධිනවූ ආයතනයකට යවා එක තින්දුවක් ගන්න එක හොඳයි. එමනිසා ඒ අනුව කටයුතු කරන්න කියා මා අද උපදෙස් දුන්නා. එමනිසා ඒ අනුව කටයුතු කරයි.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත මහතා  කතා කරමින්**

ගරු සභාපතිතුමා එක හොඳයි. එයා කියන්නේ ඩවුන් පයිපයක් දමා තිබෙනවා. කාණුවක් දමා තිබෙනවා නම් ගැටළුවක් නැහැලු.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

එයා සැරින් සැරේ ඒ විදියට ඔය ගෙදරත් එක්ක ප්‍රශ්න ඇති කර ගන්නවා. අද නෙමේ .මිට අවුරුදු 10කට විතර කලින් සිට.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මී හේමන්තා මෙනවිය  කතා කරමින්**

කාණුවක් තිබෙනවානම් ප්‍රශ්නයක් නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා  කතා කරමින්**

කාණුවක් නැතුව මේ අය කරන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

දැන් මේ මන්ත්‍රිවරු ගිහින් ඔතන බලන්න. අපේ ගරු නගර සභා මන්ත්‍රි ලක්ෂ්මි මෙනවිය , ගරු නගර සභා මන්ත්‍රි අතුල ප්‍රියන්ත මහතා  ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා යන්න. මා නම් යන්න එන්නේ නැහැ. මා දැන් වසර 10ක් තිස්සේ ඔය ලියුම් කියවනවා. ඡායාරූපත් බලනවා. ඔය කියන නිලධාරින් වාර්තා කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා  කතා කරමින්**

දැන් ඔබතුමා කියන්නේ මෙය නිත්‍යානුකූල වෙන්න නම් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමිය ගිහින් හරි බැලුවාම ප්‍රශ්නය ඉවරයි. දැන් මෙතන හායනක කම තිබෙන්නේ මේ වැසිකිළිය පිරි තාප්පය කඩාගෙන වැටුණොත් එහෙම ඊටත් වඩා කරදරයක්. කඳු කපන එක නවත්වන්නත් බැහැ. නමුත් ඕක කලින් තිබුණ ගෙයක්.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්**</u>

මේ කපරාදුවකුත් නැහැ.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

නැහැ මන්ත්‍රීතුමිය මෙහෙමයි. දැන් මෙහෙම තිබෙන කන්දක් . මෙතැන මෙයාගේ නිවස තිබෙනවා. මේ කන්ද කපන්න අල්ලපු ගෙදර මිනිහාට බැහැනේ. මෙයාම කපලා තියෙනනේ. කපලා අර මනුස්සයාට කිවුවා මගේ වැසිකිළියෙන් වතුර එන්න පුළුවන් . වැටිය බඳින්න කියා. ඒ පාර ඒ මිනිසුන් වැටිය බැද්දා. ඒපාර ඒ මිනිසුන් කිවුවා අරකෙන් එනවා කියා. ඊට පසු අර මිනිසුන් උඩ කොන්ක්‍රිට් කළා. කොන්ක්‍රිට් කර කාණුවකුත් දැම්මා. ඉතිං මා කියන්නේ නැහැ. ඔගොල්ලන් ගිහින් ඇත්තටම බලන්න. මට දිපු උපදේශය කාර්මික නිලධාරින් වැරදියි නම් මා වැරදියි. ඒක නිසා ගිහින් බලන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ඒ තාක්ෂණසේවය ගැන ඔබතුමාට දැනුම තිබෙනවා. මෙය ලේකම්තුමිය හරි ගිහින් බලා සාධාරණව කාණුවක් වියදම් කර දමන්න කියන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මාස තුන හතරකට සැරයක් මේ චෝදනාව කියාගෙන මෙහෙට එනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්**</u>

මෙහෙමයි දැන් කවුරුහරි කණ්ඩියක් කැපුවා කියා මායිමේ මිනිසුන් තාප්පය බැඳ ගත යුතුයි. අනිත් අයට කණ්ඩිය බඳින්න බැහැනේ. අනිත් පැත්තේ කෙනා ඕනේ එය බැද ගන්න. ඒ මනුස්සයා කියන්නේ කිසි ප්‍රශ්නයක් නැහැලු කාණුවක් දමා තිබෙනවා නම්. අපි යන්න උවමනාවක් නැහැනේ . අපි නිලධාරින් නෙමෙනේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නිලධාරින් ගිහින් වාර්තා කර තිබෙනවා. එයා සැහීමකට පත් වෙන්නේ නැහැ. එමනිසා මා මහජන සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලයට ගත්තා.

**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ඔය උපාලි මහතාගේ ඔය ප්‍රශ්නය ගැන මට මුලින් දැනුවත් කළා. විරුද්ධව ඉන්න කෙනා මෙය කරන්නේ කියා. මීට මාස පහකට කලින් මා ගොස් මුණ ගැසුණා. මට පුද්ගලිකව කරන්න පුළුවන්ද බලන්න. ඊට පස්සේ අද ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. කියන්නේ කාණුවක් දමා නැහැ. ඩවුන් පයිප්පයක් දමා තිබෙනවා. කාණුවෙන් නෙමේ ඩවුන් පයිප්පයෙන් තමයි බහින්නේ. උපාලි මහතාගේ නිවස ඉදිරිපිටින් කාණුවක් නැහැ. මෙතුමා කියන්නේ කාණුවක් දමන්න කියා. කාණුවක් දැම්මා කියන්න. උපාලි මහතාගේ ගේ ඉදිරිපිට කාණුවක් නැහැ. ඉස්සරහා ප්‍රධාන පාරට සම්බන්ධ කාණු පද්ධතියක් නැහැ. ප්‍රායෝගික ගැටළුවක් තිබෙනවා. මා දන්නේ නැහැ. අපට කරන්න තිබෙන එකම දේ ඔය විසඳුම විතරයි. නැතිනම් පුද්ගලයන් කොච්චර කතා කළත් ගිහින් වැඩක් නැහැ. ඔබතුමා කිවු විදියට මෙයට කටයුතු කරන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේක පිළිගන්නේ නැහැ. ලයනල් මහතාගේ ළඟම නෑයෙක්. අප්ප බාප්පාගේ ළමයි.

**ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ පටබැඳිමුල්ලේ ඔප්පු දෙන්නේ නැද්ද?

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔව් අපේ හිටපු එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක්. එතුමා නැහැ දැන් මියගිහින්. අපි එතුමාටත් ඔප්පු දෙනවා. දැන් මෙහෙමයි වෙලා තිබෙන්නේ. ඉස්සර වගේ ඔප්පු ලියන්න කියා අනුමැතියට ගරු ආණ්ඩුකාරතුමාට යවන්න ඕන. ඒ ඉඩම පැවරුණ ආකාරයේ පැවරුම් නියෝගයකුත් යවන්න ඕන. ඒ නියෝගයේ පිටපත තාම අපට හොයා ගන්න බැරිවෙලා තිබෙනවා. ඒ පිටපත හොයමින් තිබෙනවා. ඒ වගේ අපට ඉඩම් වලට ඔප්පු ලබා දිමට තිබෙනවා. අපි දෙන්න සූදානම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම  මහතා කතා කරමින්</u>**

එතන ගැටළුවක් තිබෙනවා. ඒ අයට පාසැලට දමා ගැනිමට.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ ගෙදර එම ඉඩමේ ඔච්චරයි. ඊට අමතරව ආදාහනාගාර පාරේ ඉඩම් තිබෙනවා දෙකක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

පොල්වත්තපුර තිබෙනවා නේද .

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

පොල්වත්තපුර තිබෙනවා. එක අපිට අයිති නැහැ.ඉඩම් කච්චෙරියේ තිබෙනවා. අපි දෙන්න තින්දු කර තිබෙනවා එම තුනටම. අවශ්‍ය නිත්‍යානුකුල පසුබිම සාදන්න. ටී.එච්.ඩබ්. නිවාස වලට අපේ නගර සභා ආඥා පණත අනුව ඔප්පු දෙන්න බැහැ. විකුණන්න ඕන නැතිනම් බදු දෙන්න ඕන. අපිට දන්වා තිබෙනවා නගර සභා ඉඩම් බැහැර කිරිමේ පණතක් තිබෙනවා. අපි ඒ යටතේ තමයි අපි දැනට එතැනට අවධානය යොමු කර තිබෙනවා. ඒ අනුව අවසරය ලැබුණ වහාම අපි එය දෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ නිලානි මන්ත්‍රිතුමිය කිවුවා ට්‍රැක්ටර් ටික නවත්වනවා කියා. කුණු ට්‍රැක්ටර් ටික නගර සභාවේද සොදන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි වතුර අරගෙන දුන්නා එතනට. එතැන කරාමයක් තිබෙනවා. එතැන හොදන්න ඕන නැහැ. මහජන සෞඛ්‍ය නිලධාරිතුමනි , අපි වතුර අරගෙන දුන්නේ එහෙම සෝදා ගෙන්න කියන්න. මෙහේ හොදන්න එපා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී . සරත් ශ්‍රී ලාල් මහතා  කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මාගේ මේ මස වැටුව බැංකුවට යන්නේ. එය කෝවිඩ් අරමුදලට යවන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ ගරු සරත් ශ්‍රී ලාල් මන්ත්‍රීතුමාගේ වැටුව කෝවිඩ් අරමුදලට යවන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපි දින හතේ වැඩ සටහන කොහොමද දන්නේ නැහැ. ක්‍රියාත්මක වෙනවාද නැද්ද කියා. මා ගරු උප සභාපතිතුමාගෙනුත් ඇසුවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැනට නම් ක්‍රියාත්මක වුයේ නැහැ. කොරෝනා ව්‍යාසනය යටතේ අපේ වැඩසටහන සම්පූර්ණ නැවතිලා තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

දැන් කොට්ඨාශ 13ට සාධාරණ බෙදී යන විදියට කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි බලන්නම් ඉදිරියට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

පෝරඹ නිල සෙවණ ඉදිකර දැන් නිලධාරීන් එහි රාජකාරි කරනවා. එම නිලධාරීන් හතර දෙනා මගෙන් ඉල්ලීමක් කළා. දැන් තණකොළ වැවි තිබෙනවා. මා දින තුනක් පමණ කිවුවා පැමිණ මේ සම්බන්ධව ..

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පෝරඹ නිල සෙවණ, අම කරුණාරත්න ගොඩනැඟිල්ල තිබෙන තැන තණකොළ කපා දමන්න. තාක්ෂණසේවා නිලධාරිතුමණි, අපේ නිලධාරින්ට උපදෙස් දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

අපේ නිලසෙවණ තිබෙන තැන පොඩ්ඩක් පහතයි. මා පොඩ්ඩක් උස්සා එය හැදුවේ. පොඩ්ඩක් වැස්සත් වතුර පිරෙනවා. එතැන නිලධාරින් කිවුවා වතුර පිරෙන නිසා යන්න බැහැ. ඇළට සම්බන්ධ කරලා යටින් යකඩ බටයක් හරි අයිනෙන් දමා ඇළට යන විදියට පොඩි ක්‍රමවේදයක් හදන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එතැන කාණුවක් තිබෙනවා. එකට සම්බන්ධ කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් මේ වාහන සම්බන්ධව කිවුවා. කාට කාට හරි දිලා මේවා කරන්නකෝ. ඔබතුමාටත් වැඩ වැඩිනේ. එමනිසා සොයා බලන්න විදියක් නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වාහන හොදන ඒවාට කාණු කපන ඒවාට සියළු නිලධාරින් සිටිනවා මෙහි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

නිලධාරින් හිටියට නිලධාරින්ටත් වැඩ තිබෙනවා. කාට කාටහරි දෙන්න වැඩ කරන්න.ඔබතුමාට හිතවත්

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එක කරන්න පුළුවන්. මන්ත්‍රීතුමාට ම දෙන්නම් මා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

අපේ කොට්ඨාශ 13 ඡන්දදායකයෝ ඒ අයගේ ඕනෑ එපාකම් අපිට ලිඛිතව ඉදිරිපත් කරනවා. සමහර වේලාවට අපේ නිවාස වලටත් පැමිණ කියනවා. එගොල්ලන්ගේ අපහසුතාවය කිවුවාම අපි ඇවිත් ඉදිරිපත් කරනවා. නමුත් ඒවා විසඳිමකින් තොරව නිහඩ වෙනවා. මා එකින් එක කියන්න යන්නේ නැහැ. මා ගරු ලේකම්තුමියත් මුණ ගැසි සිදුවීම් දෙකක් කතා කළා. ඉතිං මේ අය නිතර නිතර පැමිණිමෙන් එපා වෙනවා. පොල් වැටෙනවා. ඒ මනුස්සයා පැමිණ මට කිවුවා.

ඔබතුමාගේ ඡන්ද දායකයෙක්. මා ඇවිත් ඒ වෙනුවෙන් පෙනි සිටියා. නමුත් අද ඒ සිදුවීම වෙනවා. මේ වගේ උදාහරණ කියන්න පුළුවන් ඕන තරම්. ඇයි මෙහෙම වෙන්නේ. ඒ මිනිසුන් එපාවෙලාම තමයි නවතින්නේ. ඒ අය ඒ මිනිසුන්ගේ අවශ්‍යතාවය ඉටු වෙලා නෙමේ ඒ අය නවතින්නේ. ඇයි මෙහෙම වෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා  කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අර පාලමේ විදුලි ආලෝකය සම්බන්ධව. එතැන දැන් තාම කළුවර කරුවලයි. රත්ගම ආසනයේ විදුලි ලාම්පු සවිකරා පාරේ.  එතැන හැර. එම පාලමේ එහා පැත්තේ සවි කළා ලැඟුම් හලට. පාලමේ සවි කළේ නැහැ. අඩුම වශයෙන් 4ක්වත් සවිකරන්න කියන්න. මාර්ග සංවර්ධන අධිකාරයේ ඉංජිනේරු මහතාට . කණු තිබෙනවා. ඔක්කොම තිබෙනවා. එම පාලම අයිති මාර්ග සංවර්ධන අධිකාරියටනේ. රත්ගම ප්‍රාදේශීය සභාවෙන්ද අපෙන් ද කියන එක නෙමේ. අපිගාව උපකරණත් නැහැනේ. විදුලි සමාගමෙන් ඇසුවාම කියන්නේ ඒ අයටත් මේකේ සම්බන්ධයක් නැහැ කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඒ පාලම අයිති ප්‍රාදේශීය සභාවට කියන මතයේ තමයි ඉන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා  කතා කරමින්</u>**

හරි සභාපතිතුමා , ප්‍රාදේශීය සභාවට අයිතිය ගත්තා කියන්නකෝ. නමුත් පාලම හැදුවේ මාර්ග සංවර්ධන අධිකාරියෙන්නේ. මාර්ග සංවර්ධන අධිකාරියෙන්නේ පාලම හැදුවේ. ඒ අය එපැයි මෙයට විදුලි ලාම්පු දමා දිය යුත්තේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙය ලිඛිතව දන්වන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා  කතා කරමින්</u>**

ඔබතුමාගේ ප්‍රශ්නයට තමයි ඔබතුමා පත්කර ඡන්දය දී මිනිසුන් මෙතැනට එවා තිබෙන්නේ. එකපාරක් සභාවේ කතා කරනවාට වඩා වැදගත් මෙතැනට පැමිණ නිලධාරින් සමඟ බොහොම සුහදව ඒ කටයුතු ටික කර ගන්න.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ඔබතුමා කියා තිබුණහොත් නිලධාරින්ට . එම කටයුතු කරන්න

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එකට අදාල නිලධාරින් සිටිනවා. එතකොට ඒ නිලධාරින් එක්ක කටයුතු කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

මා පැමිණ කතා කළා. ඒ නිලධාරින් එක්ක මා ඇවිත් ප්‍රශ්න ඇති කර ගැනිමට යන්නේ නැහැ. නිලධාරින් සමඟ සහායෝගයෙන් තමයි කටයුතු කරන්නේ. සමහර දේවල් තාම කෙරුණේ නැහැ. මට ඇත්තටම සැකයක් ඇතිවෙනවා ඔබතුමා එපා කියා තිබෙනවාද කියා. ඇත්ත කතාව ඕකයි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

තාම කිවුවේ නැහැ. ඕන දෙයක් කියන්න. අපි ඔබතුමලාගේ දේවල් කර තිබෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

ඇත්තම කියනවා නම් මේ මිනිසුන් මාගේ ඡන්දායකයෝ නෙමේ. ඔබතුමා ළඟට පැමිණ මෙය කෙරෙන්නේ නැති තැන. මාගේ ළඟට ඇවිත් මා සමඟ කියනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේකේ මේ ඔබතුමා මේ පලවෙනි පාරට ආවේ. අපි අත්දැකිමෙන් දන්නවා. ඔය පැමිණිල්ල දමා ඔය පොල්ගස කපන්න මෙතැනට එන්නේ ඒ අය තරහාම වුණාම තමයි. නැතිනම් ඒ ගෙදර මිනිහට කිවුවාම අනේ මල්ලි පොල් ගෙඩිය කපා දමන්න. එතකොට ඒ අය එය කපා දමනවා. එක තමයි ඇත්ත තත්ත්වය. තරහා පිරිමහන්න තමයි මේක කරන්නේ. කොච්චර වුණත් මුට ගේම දෙන්න අපි කපන්නේ නැහැ. එවගේ ප්‍රශ්නයක්. මේ නගර සභාව හුඟ දෙනෙක් යොදා ගන්නේ බළලුන් ලවා කොස්ඇට බාන්න. මා තමයි මේ බළල් අතට අසු වන්නේ. මා හැම

තිස්සේම ඔයවගේ යෝජනා එනවිට මාගේ අත පිටුපසට ගෙන තියනවා. ඒක තේරුම් ගන්න. මාගේ පුටුවට ඇවිත් සිටියහොත් ඔබතුමාට තෙරෙයි. මා දන්න එක දෙයක් තමයි සියළු හොඳ මන්ත්‍රිවරුන් බෙදා ගන්නවා. සියළු නොහඳ සභාපතිට දෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

නැහැ. මීටවඩා සාධාරණ ගැටළු ඇවිත් තිබෙනවා. ඒවාට විසඳුම් නැහැ. එකයි කියන්නේ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

දැන් මෙහෙමයි . ඔතන ඉදගෙන කිවුවාට . දැන් උදාහරණයක් වශයෙන් උපාලි සිරිසුමන මහතාගේ ප්‍රශ්නය කතා කරන විට මා කිවුවා මෙන්න මෙතනයි ප්‍රශ්නය. අපි මෙහෙම කර තිබෙනවා. අපි කොච්චර දේශපාලනය කලත් ඒ මනුස්සයා කොච්චර සාධාරණ වුණත් අපි සාධාරණයි කියා කිව යුතුයි. ඔය පුටුවේ වාඩි වුණාම තමයි. ඔබතුමාගේ වැඩක් තිබෙනවා නම් පැමිණ කියන්න. අපි දෙන්නා අතර සාකච්ඡා කරන්න පුළුවන්. ඒ මිනිසුන් අතර මොකක්ද තිබෙන්නේ. මෙහි පරමාර්ථ මොනවාද? හුඟ දෙනෙක් තමන්ට ගහන්න බැරි වුණාම අන්න අරයා පෙන්වා අරයාට ගහලා දෙන්න බැරිද කියා අහනවා. එමනිසා මන්ත්‍රිතුමාත් පාවිච්චි වෙනවා. මාත් පාවිච්චි වෙනවා. එමනිසා තේරුම් ගෙන ජිවත් වෙන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මට පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. අනවසර ඉදිකිරිමක් සම්බන්ධව. මේ අනවසර ඉදිකිරිම් ඉවත් කරනවාට මා ගොඩක් කැමති කෙනෙක්. මට මේ ළඟදි ඇසිමට සිදුවුණා. මට කතා කර කිවුවා. මා නම් බලන්න ගියේ නැහැ. තල්ගස්ගොඩ . නිවාස තුනක් ඉවත් කළා කියා. ඒක අනවසර ඉදිකිරිමක් නිසා ඉවත් කළා කියා. හැබැයි මට ප්‍රශ්නය තිබෙන්නේ මේවා ඉවත් කළ යුතුමයි. මෙහෙම කළොත් ඉවත් කරන්න. තල්ගස්ගොඩ වගේ ප්‍රදේශයක ඒ කොටස් ඉවත් කරනවා සමානව සිදු කරන්න. සියළු දෙනා බිම් කොටස් අයිතිකර ගෙන සිටිනවා අම්බලන්ගොඩ නගර සිමාතුළ. කිසිම දෙයක් ඒ වනවිට අරගෙන තිබෙනවා. මේවා නගර සභාවට වටිනා ඉඩම්. හදන්න ගියාම ගෙයක් නැහැ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

පසුගිය රැස්විමේදි කරන ලද යෝජනාව පරිදි මේ මන්ත්‍රිවරුන්ගේ ඉල්ලිම පරිදි මෙය ඉවත් කළේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ඒක හරි සභාපතිතුමා,

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඔබතුමියට අයින් කරන්න එකක් තිබෙනවා නම් දැන් යෝජනා කරන්න. අපි එක කරන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

නැහැ. මා කියන්න ඕන නැහැ. ඔබතුමලා දන්නවා හොඳටම අනවසර ඉදිකිරිම්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි අර බළල් අත වෙන්නේ නැහැ. ඒ අත දාන්න ඔයා.  කමක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

මට වැඩ කර නැහැ. ඔබතුමාලාගේ ඡන්දදායකයන්ගේ තමයි ගෙවල් ටික ගිහින් තිබෙන්නේ. එහෙනම් මා එක්සත් ජාතික පක්ෂයේ අම්බලන්ගොඩ එකත් කිවුවේ. වටිනා දේපළ තිබෙනවා. ඒවා ඉවත් කරන්න. මොනවා හරි කටයුතු කරන්න. සභාවට හරි දමා. ඒ අය 2004 සුනාමි පැමිණ දැන් ළමයි ලොකුවෙලා මොකක් හරි දෙයක් කළත් ඒවා ඉවත් කර සමානව වටිනා දේපළ අයිතිකරගෙන . ඉවත් කිරිමේ කටයුතු කරන්න. ලිපි ඇරලා ඉවත් කිරිමේ කටයුතු කර ගන්න. අඩුම ගණනේ අය කිරිමක් වත් සභාවට කර ගන්න. අපරාදේ එහෙම නැති වුණොත් අර අහිංසක මිනිසුන්ගේ දේපළ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අය කර ගන්නවා. අපි ලිපිත් යවනවා. අපි අයකර ගන්නවා. දැන් අපි ළඟදිත් නඩුවක් පවරන්න තින්දු කළා. එහෙම අයකරගත්ත මුදල ලක්ෂ 38ක් තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ඒක තමයි සභාපතිතුමා. එහෙම වෙන්න ඕන.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීතුමිය හිතන්න එපා එහෙම අය නොකර තිබෙනවා කියා. අය කර තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

වටිනා දේපළ තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අර මහ අම්බලන්ගොඩ ළමා උද්‍යානය ඉදිකරන්න තිබුණ ඉඩම. මා ගිය සභාවලත් කිවුවා. ඒ ඉඩමේ අපට තිබෙන කොටස වැට ගසන්න. ඒ පාරට තියන්න. ළමා උද්‍යානයට ලක්ෂ 30ක් ලැබුණා. මට ඒය කර ගන්න ඉඩ දුන්නේ නැහැ. එයා එතැන පාවිච්චි කරනවා එයාගේ වාහන දමන්න. දම්වැල් ගසන්න අපේ නගර සභාවට අයිති කැල්ල.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි එකේ ළමා උද්‍යානයක්ම හදන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

අපේ ඉඩම. එයා වාහන ගහනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

දැන් වාහන ගහන්නේ නැහැනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

දැන් වාහන ගහනවා. අපි දැම්වැල් ගහන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

දැන් මෙහෙම දෙයක් තිබෙනවා . ප්‍රශ්නය විසඳන්න කියා ඔබතුමාට කිවුවා. ඔබතුමාට කතා කරන්න කිවුවා. ඔබතුමා මිනිසුන් සමඟ තරහා වෙන්න බැහැ කියා. මට තරහා වෙන්න කියනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

මා ගියානේ .

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඉතිං ලක්ෂ 30 නැතිවුණේ ඔබතුමාගේ වරදින් . අපේ වරදින් නෙමේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

මට පුද්ගලිකව මිනිසුන් සමඟ තරහා වෙන්න බැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපිටත් බැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

මා කියන්නේ ඔබතුමාට යන්න කියා නෙමේ. නිලධාරින් ලවා මේ වැඩය කරන්න කියා. ගරු උප සභාපතිතුමා අර ප්‍රශ්නය කතා කරන්න ගිහින් එතුමාට උදලු පහරක් ගැහුවා. මේ මන්ත්‍රීවරු එක්කෙනෙකුවත් ගිහින් කතා කරන්නේ නැහැ. මා තමයි එතනට ගිහින් කතා කරලා සභාවට ලිපියක් දමා පොලිසියට ගියේ. එවාට කවුරුවත් ගියේ නැහැ. ඔබතුමා කියන්නේ මට ගැස්සුවායින් පසු කවුරුවත් එන්නේ නැහැනේ. අඩුම ගානේ මා කාගෙන්වත් ගුටි කාලා නැහැ අම්බලන්ගොඩ. මට ගැහුවොත් එහෙම ඌට කරන්න ඕන දේ කරලා තමයි මේක ඇතුළට එන්නේ .

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි දන්නවා සෝභිත මන්ත්‍රීතුමා කවුද කියා. එකයි අපි කිවුවේ ඔක කරන්න කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා මේ පසුගිය දිනක ආදාහනාගාරයට ගිය වේලාවේ මා දුටුවා එතැන ජලය නොමැති විට . ඒ නිසා නිතරම අත් සෝදාගැනීම ගැන කියනවා. මම දැක්ක දෙයක් තමයි අර ජල නල ලබාදීමේ කටයුතු නවත්තපු වෙලාවට වතුර ටැංකියක් නැති හින්දා මම හිතනවා මම මේ වෙලාවෙ ඔබතුමාට කියනවා ආදාහනාගාරයට ටැංකියක් ලබාදෙන්න කටයුතු කරන්න කියල.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඒකෙ අර ගේට්ටුව එහෙම තවම නැද්ද හදල ඉවර.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හොඳට බලන්න ගිහිල්ල හයිකරල තියෙන්නෙ ලස්සනට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>**

වතුර ටැංකියක්.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හරි හරි. අපි ඒක දෙන්නම්. රැස්වීමේ වැඩ කටයුතු මෙයින් අවසන් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

සිකුරිටි එකේ තත්ත්වෙව මොකද ගරු සභාපතිතුමා දැන්.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒකෙ වාර්තාව මට ඉදිරිපත් කරනවා කිව්වා අද දිනයේ. මට කියවන්න බැරිවුණා. අපි ඒක අරගෙන දාන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවියතා කරමින්</u>**

ගරු සභාපතිතුමා ගරු සෝභිත මන්ත්‍රීතුමා කියපු ඒ පිට්ටනියෙ ප්‍රශ්න දැන් ඉන්ටර්නේට් එකේ දාල තියෙනවා ඒ පුද්ගලයා කෝටි 11 කට ගේ විකුණන්න. අරකත් එක්ක තමයි ගරු සභාපතිතුමා පාර පෙන්නන්නෙ. වහාම ඕකට මොකක්හරි දම්වැල් ගහල හරි මොකක්හරි කරන්න. දැන් අන්තර්ජාලයට දාල තියෙන්නෙ. ගරු සභාපතිතුමනි. දැන් ඕකට වෙන කෙනෙක් ආවොත් ඕක හරි ප්‍රශ්නයක් වෙන්නෙ ඔබතුමාලට අපිට ඒකට මැදිහත් වෙන්න වෙනවා. පාතාලයෙ වගේ කෙනෙක් ආවොත් හරි ප්‍රශ්නයක්. ඒක නිසා අඩි 10 වෙන්කරන්න.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැනුත් ඒ වගේ කෙනෙක් වෙන්න ඇති. ගරු සෝභිත මන්ත්‍රීතුමා බව වුණානෙ. ඇත්තටම බය වුණානෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

මං බයවෙන්නෙ නැහැ. මං ඔය මිනිස්සුත් එක්ක ගහගන්න යන්නෙත් නැහැ. මං කියන්නෙ නගර සභාවට තියෙන ඉඩම් ගන්න කියල. ඔබතුමාත් අම්බලන්ගොඩ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි මේව ඔක්කොම ගෙවීම් කරලනෙ

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔව් ගෙවීම් කරලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

මෙච්චර ගොඩක් ගෙවීම් කරල නැහැ ගරු සභාපතිතුමා විලේගොඩ කොට්ඨාසෙ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නෑ නෑ . ඔය කට්ටියට ගෙවනවා. මාස 03 ම ගෙවනවා. හරි ඒක එහෙනම් ඔබතුමා ඒ මිනිස්සුන්ට ගිහිල්ල කියන්න ඔයාගෙ සල්ලි තියෙනව ගිහිල්ල ගන්න කියලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි ඕකෙ පිටපත් 02 ක් ලැබෙන්න සලස්වන්න ගරු රාහුල මන්ත්‍රීතුමාටයි.මටයි.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි කොට්ඨාස මන්ත්‍රීවරුන්ට සියල්ලටම දෙන්න කිව්වා. අනෙක් ඒවා මෙහෙ තියෙනවා. මොකද කොට්ඨාස මන්ත්‍රීතුමා ඒකෙ සභාපති. ඒක නිසා ඒ සභාපතිවරයාට අපි යටල තියෙනවා. ඔයගොල්ලො ඉතින් ඔතන එවල ඇත්තෙ කළුවඩුමුල්ලෙ ගරු කොඩිකාර මන්ත්‍රීතුමා ඔයගොල්ලො එකතුවෙලා බලන්න. ඔයගොල්ලො එකතුවෙලානෙ හැදුවෙත්. සභාවෙන් ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ආදාහනාගාර දෙකම අසාධ්‍ය තත්ත්වයේ තියෙන්නෙ. ඒක මේ නිලධාරීන් කියන්නෙ වැඩ ගන්න බැරි තත්ත්වයකලු තියෙන්නෙ. නර්ඩ් එකට දන්වල රෙපෙයාර් කිරීමේ කාලය හරි කියල. දෙකෙන් එකක් හරි ඉක්මනට කරව ගන්න පුළුවන් තරම් ඉක්මනට. මොකද දෙකම නැති වුණොත් එහෙම සර්විස් එක දීගන්න බැරි වෙනවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි බලමු. මං නම් දැනගෙන හිටියෙ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී .සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

කිව්වා. එදා ලේකම්තුමියත් ගියා. ලේකම්තුමිය මහන්සිවෙලා තමයි ඔය වැට යකඩ ගේට්ටු දෙක ටක් ගාල හැදෙව්වෙ. නැත්නම් ඕක තවමත් හදන්නෙ නැහැ. ඒකයි අර ජනෙල් දාන්න ඇතිනෙ මිස්. පිටිපස්සෙ ජනේලෙයි ඒ ටික. ඒකෙ වැහි පීලි දෙක  බලන් ඉන්දැද්දි දිරනවා. අපරාදයක් වෙන්නෙ ගරු සභාපතිතුමා.  අපි ඒක නොතකා ඉදීම තුළ මුළු වහලම ගහන්න වෙනවා. ගරු සභාපතිතුමා වහින වෙලාවක බලන්න ගිහිල්ලා ඒ පීලි දෙක උතුරල වැටෙනවා. ඒක දර්ශනෙත් හොඳ නැහැ. සුළු දෙයක් හැබැයි. ඒක ඉක්මනට කරවන්න.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තාක්ෂණ සේවා නිලධාරී මහත්මයා  ආදාහනාගාරයේ ඒ පීල්ල අළුත්වැඩියා කරන්න අපට මේකක් දෙන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අදාහනාගාරයේ උඩ බම්බුවක් තිබිලා තියෙනවා. උඩට අළු විසිවෙනවා.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ආදාහනාගාරයේ උඩට බම්බුවකුත් තිබ්බද? චිමිනිය උඩ. පොඩ්ඩක් ඒක හොයල බලන්න. අසල්වාසීන් කියනව ඒක උඩට තිබ්බලු මේකක්.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා   මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි මට අහන්න තියෙනවා උදේ වුණු සිදුවීමක් සම්බන්ධව. ඒකෙ නීත්‍යානුකූලභාවය පිළිබඳ ප්‍රශ්නයක් තමයි මට තියෙන්නෙ. උදේ අර අපේ ගරු උප සභාපති කමල් මන්ත්‍රීතුමා කිව්වා .එතන සිදුවීමක් වුණා මම දැක්කා. මට ඒක දැකලා නොදැක්ක වගේ ඇහැ පියාගෙන යන්න මට බැහැ. එතන අපේ මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්මයට කියල තියෙනවා ගලි බවුසරයක් යවන්න කියලා. එතුමා කිව්වා මම ලැයිස්තුවකට අනුවයි යවන්නෙ කියලා. ඉතින් එතකොට එතනදි එතුමා නීත්‍යානුකූලව කටයුතු කරල තියෙනවද? එහෙම නැත්නම් ගරු උප සාපතිතුමාගෙ වචනය නොසලකා හැරීමක් කරල තියෙනවද? මොකක්ද මට මේක පොඩි අර්බුදයක් තියෙනවා දැනගැනීම සඳහා පැහැදිලි කරන්න මොකක්ද මේ වෙන්නෙ කියලා.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්මයාගෙන් අහන්න

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, සාමාන්‍යයෙන් අපේ ගරු සරත් මන්ත්‍රීතුමා මං දන්නැහැ අහගෙන හිටියද කියල මොකක්ද කියල වුණේ. ගරු සරත් මන්ත්‍රීතුමාලගෙ පක්ෂෙ හැටි ඉතින් ඔය. සාමාන්‍යයෙන් නිලධාරීන්ට ආරක්ෂාව දෙන එක. ඔබතුමාගෙ ප්‍රතිපත්තියක්. අපි ඇවිල්ල තියෙන්නෙ මහජන නියෝජිතයින් වශයෙන්  අපට මිනිහෙක් යමක් කිව්වම අපි කතා කරල කියන්න ඕන. මං දැන් දවස් 03 ක් විතර කිව්වා ගරු සභාපතිතුමා මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්මයාට මං කිව්වෙ නැහැ. මං වෙනදා කියන්නෙ සෞඛ්‍ය අංශයේ අපේ වැඩ කරන වැඩ පරීක්ෂකවරු දෙදෙනාට. කවදාවත් මං මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්මයට කියලත් නැහැ. හැබැයි ඒ ගොල්ලො කිව්වෙ නැති හින්දා දැන් දවස් 03 ක් විතර මං හිතන්නෙ මෙතන ගරු මන්ත්‍රීවරු ඔක්කොම වගේ හිටියා මං මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්මයට එන්න කියල මං කිව්වා . මහජන සෞඛ්‍ය පරික්ෂක මහතා මට කියනවා. මා ලැයිස්තුවකට යවන්නේ. මා තියෙන විදියට යවන්නම් කියා. මා හැබැයි මාරු කරනවා කියා කිවුවේ නැහැ. මා කිවුවා ඔයාට කරන්න බැරි නම් මෙහෙන් යන්න. ගරු සභාපතිතුමාත් හිටියා එතන. එමනිසා මට ආත්ම ගරුත්වයක් තිබෙනවා. මේ නගරයේ අවුරුදු

25ක් 20ක් විතර හිටපු . අපිට දැන් එහෙම කතාවක් කිවුවේ මෙතුමා විතරයි. මේ නිලධාරියා විතරයි. ඔහොම කතාවක් කිවුවේ. නැතිනම් අපි මහජන සෞඛ්‍ය පරික්ෂක මහත්වරු ඕන තරම් කට්ටිය එක්ක වැඩ කරලා තිබෙනවා. අපි කවදාවත් වැරදි දෙයක් කියන්නේ නැහැ. දැන් ඕන මන්ත්‍රිවරයෙකුට කවුරු හරි අපේ මෙය කර දෙන්න කියා එය අපේ නිලධාරියෙකුට කියන්න අපට අයිතියක් නැද්ද? එහෙනම් අපි මේ මන්ත්‍රි ධුරයෙන් අපි පත්කර තිබෙන්නේ මොකටද? එහෙමනම් මේ නිලධාරින් විතරක් පාලනය කරලා මේ සභාව ගෙනියන්න ඕන. දැන් සරත් චන්ද්‍ර මන්ත්‍රිතුමාගේ පක්ෂයෙන් කිවුවත් ඔය ටික තමයි කරන්නේ. දැන් සරත් චන්ද්‍ර මන්ත්‍රිතුමාට කිවුවාම කතා කළේ නැද්ද? පොල්ගෙඩිය වැටෙන කිවුවාම මෙතැන ඇවිත් කිව්වේ නැද්ද? කන්න වුණාම කබරත් තලගොයා වෙනවා. අවස්ථාව අවාම. ඇත්තටම මා දන්නේ නැහැ මොකක්ද කියා මේ දේශපාලනය. මට අයිතියක් තිබෙනවා කතා කරන්න. නැතිනම් මේ සභාවේ මා ඉඳලා වැඩක් නැහැ. මනුෂයෙකුට මහජන නියෝජිතයෙකු ලෙස වැඩක් කළාම මාගේ විතරක් නෙමේ මන්ත්‍රිවරු හැම දෙනාගේම අයිතියක් එක. නිලධාරියෙකුට නියෝගයක් කරන. එහෙම කරන්න බැරිනම් මේ සභාවේ ඉඳලා වැඩක් නැහැනේ. පත්කර එවන්න වැඩක් නැහැනේ මන්ත්‍රිවරු. ඔබතුමාට වැරදි වෙන්න පුළුවන්

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

හරි ඔය සම්බන්ධව සාකච්ඡා කරලා මමත් ලේකම්තුමියත් , මහජන සෞඛ්‍ය නිලධාරිතුමාත් සාකච්ඡා කරලා ඔය සම්බන්ධව තීරණයක් ගන්නම්. ඕක ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ දැනට අපි රාජකාරි කටයුතු කරන්නේ සවස 2.00න් පසුවයි. නමුත් ගලිබවුසරය 2.00න් පසු වැඩරාජකාරි කර අමාරුයි. උදේ 8.00 සිට කළ යුතුයි. එයට අපි පිළියමක් යෙදිය යුතුයි. එහෙම වුණොත් එදා ඉල්ලිමට අපිට පිළිතුරු දිය හැකියි. එමනිසා මා සියළු දෙනාගෙන් ඉල්ලා සිටිනවා සභාව අවසන් කරන්නම්. මැතිවරණය පිළිබඳ හොඳ තින්දුවක් අධිකරණය දි තිබෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා  මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, නිලධාරින්ගේ අභිමානය කෙලසන්න එපා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මේ නිලධාරියාගේ පැත්තෙන් සම්පූර්ණ රාජකාරිය කර තිබෙනවා. එයට අපි ස්තුති වන්ත වෙනවා. මෙවැනි නිලධාරින් අද හිඟයි. එක සතුටට කාරණාවක්.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා  මහතා කතා කරමින්**</u>

මේ වගේ කොන්ද පණ තියෙන නිලධාරියෙකු ගැන අපි ආඩම්බර විය යුතුයි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ඒ වගේම මා එම නිලධාරි මහතාට කියන්න කැමතියි . මේ මන්ත්‍රිවරු සම්බන්ධව කතා කරන විට ඔබතුමා සියයට සියයක් නිවැරදි වගේම මන්ත්‍රිවරුන්ට ගරුත්වයක් තිබෙනවා සමාජය තුළ. අපේ ආයතනයේ නෙමේ. අපේ ජලසම්පාදන මණ්ඩලයට ගියත් , පොලිසියට ගියත් ඕනෑම

ආයතනයකට ගියත් මන්ත්‍රීවරයෙකු කියන එකේ යම් ගරුත්වයක් තිබෙනවා. පිළිගැනීමක් තිබෙනවා. එතකොට මා කියන්නේ නැහැ ඔබතුමාට මා කිවුවත්පස්වෙනි ඕඩරයට යන විට පස්වෙනියා කරලා ඒ වේලාවෙම එක යවන්න කියා. එක මගේ සිරිත නෙමේ. හැබැයි ඔබතුමාට අභිමතාර්ථ බලයක් තිබෙනවා මේ මන්ත්‍රීවරුත් බේරාගෙන මේ රක්ෂාව කරන්න. එකයි මා මේ ඉල්ලීම කරන්නේ. මා කියන්නේ නැහැ ඔයාට නිති කඩන්න කියා. එක එල්ලෙම බැලුවොත් සියයට සියයක්ම ඔබතුමා රාජකාරිය කළා . එක හරි. එකඟයි. හැබැයි මේ සියළුම මන්ත්‍රීවරුන්ට පිළිගැනීමක් තිබෙනවා. ඒ පිළිගැනීම තුළ මන්ත්‍රීවරුන්ට යම්කිසි විශ්වාසයක් තිබෙනවා. ඒ ගොල්ලන් දන්නේ නැහැ . මේ ක්‍රමවේදය මොනවාද කියා. උප සභාපතිතුමාට කතා කරනවා . මන්ත්‍රීවරුන්ට කතා කරනවා. ඔය තිබෙන තත්ත්වය හැමෝටම වැදගත්නේ. වැසිකිළි වළක් කියන එක මේ පස්දෙනාටත් ඉතා වැදගත්. මෙතුමාටත් වැදගත් . ඒ අයට පාවිච්චි කරන්න එපැයි. එක ඔබතුමාගේ අභිමසානුසාරි බලය. එක ඔබතුමාට අයිතිය තිබෙනවා. හැබැයි මන්ත්‍රීවරුත් පොඩ්ඩක් හරි කියන දෙය ඇහුම් කන් දිය යුතුය. මේ ගට්ටනයකකින් මෙය යන්න අවශ්‍ය නැහැ. ඔබතුමාගේ සේවය නගර සභාවට අවශ්‍යයි. ඒ වගේම මන්ත්‍රීවරුන්ගේ සේවය ජනතාවට අවශ්‍යයි. වාදයකට නෙමේ. මේක තේරුම් ගන්න. එක දැන ගෙන රාජකාරි කරන්න. මගේ දැනුම ඒක.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, නිලධාරියෙකු විදියට ඔබතුමා කොන්ද කෙලින් තියාගෙන රාජකාරිය කරන එක ගැන සතුටුයි. මේ වගේ හැමෝම සිටිනවා නම් අපිට මේ අම්බලන්ගොඩ නගරය හදන්න පුළුවනි. ඒ ගැන සතුටු වෙනවා. ඇත්තම කියනවානම් ගරු උප සභාපතිතුමා විදියට ගරුත්වයකුත් තිබිය යුතුයි. සියළු මන්ත්‍රීවරුන්ට ගරුත්වයක් තිබිය යුතුයි. දෙපැත්තක් තිබෙනවා. ඒ විදියට සාමාන කරගෙන ඔබතුමාගේ රාජකාරිය හරියට කරන්න.ඔබතුමා හරිතැන ඔබතුමා කොන්ද කෙලින් තියාගෙන ඔබතුමා වැඩ කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

රැස්වීමේ වැඩ කටයුතු මෙයින් අවසන් කරනවා.

පස්වරු 03.30 ට ගරු සභාවේ වැඩ කටයුතු අවසන් විය.

ඩබ්.ඩී.ආර්.ජේ.රුද්‍රිගු මිය
ලේකම්
අම්බලන්ගොඩ - නගර සභාව

අරුණ ප්‍රදිප් මණිමෙල්වඩු
සභාපති
අම්බලන්ගොඩ - නගර සභාව

2020.06.26

වන දින

අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදි.